

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report

2023

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

இலங்கை போக்குவரத்து சபை

Sri Lanka Transport Board

නො.200, කිරුළ පාර, කොළඹ 05

இல. 200 ,கிருல வீதி ,கொழும்பு 05

No .200 , Kirula Road , Colombo 05

වාර්ෂික වාර්තාව

2023

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

පටුන

		පිටු අංකය
1.	දැක්ම, මෙහෙවර, අරමුණ හා පරමාර්ථ	3
2.	හැඳින්වීම	4
3.	සභාපතිතුමාගේ පණිවිඩය	5-6
4.	කාර්ය සාධනය සහ ප්‍රගති සමාලෝචනය	7 - 40
5.	මූල්‍ය ප්‍රකාශය	41-79
6.	විගණකාධිපති වාර්තාව	80 - 114

දැක්ම

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

මෙහෙවර

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායී, සුවපහසු මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතේ සේවයට කැපවූ ඵලදායී කාර්ය මණ්ඩලයක්, ආයතනයේ සියළුම සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

අරමුණු හා පරමාර්ථ

1. ප්‍රාදේශීය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දීමත් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක,ප්‍රමාණාත්මක සහ කාර්යක්ෂමව හා ඵලදායී බස් සේවාවක් සැපයීම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයීම.

3. මූල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොටගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම් නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. පිටකොටුව මධ්‍යම බස් නැවතුම් පොළේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයීම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත සම්බන්ධීකරණය කිරීම.

6. උත්සව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු/ පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන් වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් ප්‍රාදේශිකයන්, මහා භාණ්ඩාගාරය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයීම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පීන් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශීය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයීම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ගබඩාව පවත්වාගන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්ෂක විමර්ශන, හදිසි වැටලීම්, සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

හැඳින්වීම

සියලුම ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යාවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටෙම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනය කරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවකට පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාරිත්වයකින් ක්‍රියාත්මක වූයේය. 1978 අංක 19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවස්ථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 10ක් පිහිටුවා 1978 දී ලංගම විමධ්‍යගත කරන ලදී.

ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදීවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමටත් කුඩා ඒකකවලට හැකිවන බව අපේක්ෂා කල බැවින්, විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරණ ලද පාඩු දිගින් දිගටම වැඩිවීම නිසාත් නිදහස් ආර්ථිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකි වීම නිසාත් මගින් ප්‍රවාහය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදී.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලීකරණය මගින් රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදී. ජනතාකරණය සිදු කල අවස්ථාවේදී පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලනය කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරාගන්නා ලදී. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදා දෙන ලද අතර ඉතිරි කොටස් මහා භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදී ආරම්භකර 1994 වර්ෂයේදී අවසන් කරන ලදී. ජනතාකරණය අවිධිමත් ලෙස ක්‍රියාත්මක කල බැවින් අපේක්ෂා කල ප්‍රතිඵල අත් නොවීය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදී. සේවක අතිරික්තය, විනය බරපතල සේ බිඳවැටීම, අසාධාරණ තරහකාරිත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය වගකීම, වෘත්තීමය දැනුමක් ඇති අයගේ හිඟය, අකාර්යක්ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තීය සමිති අනිසි බලපෑම් හා පැහිරී ගිය දූෂණයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් “2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත” මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිතුමාගේ පණිවිඩය...



2023 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්ය සාධනය පිළිබඳ වාර්ෂික වාර්තාව උත්තරීතර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මා බෙහෙවින් සතුටු වන අතර ඒ වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව ද මා බෙහෙවින් සතුටු වෙමි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තුළ තම නමින් ලියාපදිංචි කළ බස් රථ 7485 තිබුණ ද ධාවනයට යොදවා ගත හැකි බස් රථ පවතිනුයේ බස් රථ 6200 කට ආසන්න ප්‍රමාණයක් පමණි. එම බස් ප්‍රමාණයෙන් බස් රථ 852 කට ආසන්න ප්‍රමාණයක් විශාල පරිමාණයේ හා මධ්‍ය පරිමාණයේ අලුත්වැඩියා සඳහා ඉවත්ව තිබූ අතර 2023 වර්ෂයේ දී දෛනිකව සක්‍රීය ලෙස ධාවනයට ලබා දිය හැකිව තිබූ බස් රථ ප්‍රමාණය 5300 ක් පමණ විය. එහෙත්, දෛනිකව සිදුවන සුළු ආපදා හා තඩාග/ වාර සේවාවන් සඳහා ඉවත්වන ප්‍රමාණය සැළකිල්ලට ගත් විට දෛනිකව ධාවනය කළ බස් රථ ප්‍රමාණය 4700 සිට 4900 දක්වා පරාසයක පැතිර තිබූ අතර දෛනිකව ධාවනය කළ බස් රථ සංඛ්‍යාවේ සාමාන්‍ය අගය 4750 ක් පමණ විය.

ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ ග්‍රාමීය මගී ප්‍රවාහන සේවා ශක්තිමත් කරගැනීම සඳහා ආසන 32 කුඩා බස් රථ 500 ක් ශ්‍රීලංගම බස් රථ ඇණියට එකතු කර ගැනීමට හැකි වුවද, එම වර්ෂය තුළ බස් රථ 450 ක් පමණ ආයු කාලය ඉක්මවා යෑම හේතුවෙන් ධාවනයෙන් ඉවත් වීම සිදු වූ නිසා රථ ඇණියේ වර්ධනය ඉතා සීමිත විය. තව ද, අළුත්වැඩියාව සඳහා ධාවනයෙන් ඉවත්කර තිබූ බස් රථ 852 න් බස් රථ 400 ක් පුනරුත්ථාපනය කරගැනීමේ ව්‍යාපෘතියක් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ අතර 2023.12.31 දින වන විට ඉන් බස් රථ 396 ක පුනරුත්ථාන කටයුතු අවසන් කර ධාවනයට ලබා දීමට හැකි වීම ද යම් තරමකින් කාල සටහන් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා හේතු විය. එමෙන්ම, දැනට ශ්‍රීලංගම බස් රථ ඇණියේ ධාවනය වන බස් රථ ප්‍රමාණයෙන් 52% පමණ බස් රථ වසර 12 කට වඩා පැරණි බස් රථ වීම හේතුවෙන් නිතර නිතර ආපදාවන්ට ලක් වීම සැළකිල්ලට ගෙන නව බස් රථ 1000 ක් මිල දී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විට ලබාගෙන ඇති අතර ඉන් බස් රථ 400 ක් වාරික වශයෙන් ගෙවීමේ පදනම මත ප්‍රසම්පාදනය කර ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

දිවයින පුරා පිහිටි ඩිපෝ 107 මඟින් මගී ප්‍රවාහන සේවා පවත්වාගෙන යෑම සඳහා 1980 වර්ෂයේ අග භාගය වන විට පැවති කාල සටහන් අවශ්‍යතාවය අනුව බස් රථ අවශ්‍යතාවය 7339 ක් ලෙස ගණනය කර තිබුණ ද ඉන් පසු කාලවල දී පෞද්ගලික අංශයේ බස් රථ සඳහා අවස්ථාව ලබා දීමෙන් අනතුරුව වර්තමානයේ ශ්‍රීලංගම බස් රථ අවශ්‍යතාවය බස් රථ 6000 ක් පමණ වී ඇත. එබැවින්, කඩිනමින් එම බස් රථ සංඛ්‍යාව අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා දැනට ධාවනයෙන් ඉවත්ව ඇති බස් රථ පුරුත්ථාපනය කරගැනීමේ කටයුතු මෙන්ම නව බස් රථ මිල දී ගැනීමේ කටයුතු ද ආරම්භ කර ඇත.

2023 වර්ෂයේ දී වර්ෂය තුළ ධාවනය කළ යුතු බස් රථ සංඛ්‍යාව මිලියන 1.8 කට ආසන්න සංඛ්‍යාවක පැවතිය ද සත්‍ය ලෙස ධාවනයට යෙදවූ බස් රථ සංඛ්‍යාව මිලියන 1.6 ක් විය. ඉලක්කගත බස් රථ සංඛ්‍යාවේ අඩුවීම ඇණියේ බස් රථ ප්‍රමාණය අඩු වීම නිසා සිදුව ඇති තත්ත්වයකි. එමෙන්ම, එම හේතුව නිසා දිනකට එක් බස් රථයක් ධාවනයේ යෙදවිය යුතු දුර ප්‍රමාණයේ සාමාන්ය අගය කිලෝමීටර් 234 ක් ලෙස ඉලක්ක කර තිබුණ ද සත්‍ය ලෙස දිනක දී ධාවනය කළ කිලෝමීටර් ගණන 253 ක පමණ අගයක් ගෙන ඇත. ඒ හේතුවෙන් බස් රථයේ නිරන්තර නඩත්තු සඳහා දැරිය යුතු වියදම ද ඉහළ ගොස් ඇත. තව ද, 2023 වර්ෂයේ දී අපේක්ෂිත මාර්ගලේඛන ආදායම රුපියල් මිලියන 75,410.0 ක් ලෙස ගණනය කර තිබූ අතර සත්‍ය වශයෙන් ඉපැයූ මාර්ගලේඛන ආදායම රුපියල් මිලියන 56,315.00 කි. එක් කිලෝමීටරයකට අපේක්ෂිත මාර්ග ලේඛන ආදායමේ සාමාන්‍ය අගය රුපියල් 197.70 ක් ලෙස ඉලක්ක කර තිබුණ ද සත්‍ය වශයෙන් කිලෝමීටරයකට ඉපැයූ මාර්ගලේඛන ආදායම රුපියල් 156.41 කි. මෙම තත්ත්වය තුළ උපයාගත යුතු ආදායම පහළ ගොස් ඇත. ඉන්ධන මිල ඉහළ යෑම හේතුවෙනුත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ලබා දෙන වාර ප්‍රවේශ පත්‍ර ප්‍රමාණය හා වැඩිහිටි වාර ප්‍රවේශ පත්‍ර ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙනුත් උපයාගත හැකි මාර්ග ලේඛන ආදායමට බලපෑම් එල්ල වී ඇත. 2023 වර්ෂයේ දී වාර ප්‍රවේශ පත්‍ර අලෙවියේ ඉලක්ක ගත ආදායම රු. මි. 2625.0 ක් වුව ද, සත්‍ය ලෙස අලෙවි වූ වාර ප්‍රවේශපත්‍රවල වටිනාකම රුපියල් මිලියන 3,911.0 වී ඇත.

2023 වර්ෂය ආරම්භයේ දී කාර්මික අංශය මඟින් අලුත්වැඩියා කළ යුතු බස් රථ ප්‍රමාණය 852 ක් පමණ වූ අතර ඊට අමතරව බස් බොඩි නිෂ්පාදනය, එන්ජින් හා ගියර් පෙට්ටි නිෂ්පාදනය මෙන්ම ඉන්ධන පොම්ප නිෂ්පාදනය ඉහළ නැංවීම ඉලක්ක කළ වැඩසටහන් අතර ප්‍රමුඛ වැඩසටහන් ලෙස හඳුනාගෙන තිබුණ ද අපේක්ෂිත මට්ටමේ කාර්ය

සාධනයක් ලභා කර ගත නොහැකි විය. එහෙත් බස් රථ 400 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව නිමකළ අතර කාර්මික අංශයේ විවිධ කාණ්ඩවල වෘත්තිකයන්ගේ පුරප්පාඩු 724 ක් පමණ පැවතීමත්, යම් යම් අංශවල වෘත්තිකයන්ගේ කාර්යක්ෂමතාවයන් හීන වීමත් නිසා අපේක්ෂිත ප්‍රගතියේ අඩුවීමක් සිදු විය. මහා භාණ්ඩාගාරය මඟින් බස් රථ ඇණිය ප්‍රතිස්ථාපනය කරගැනීම සඳහා රුපියල් මිලියන 2000.0 ක ප්‍රතිදානයක් ලබා දී තිබුණ ද ඉන් දැරු වියදම රුපියල් මිලියන 916.0 කට ආසන්න විය. ඊට අමතරව ශ්‍රී ලංගම අයවැය මඟින් කාර්මික අංශයේ කටයුතු සඳහා දැරු වියදම රුපියල් මිලියන 4,879.0 ක් විය.

2023 ආරම්භ වන විට බස් රථ ඇණියේ ධාවන කටයුතු සඳහා පැවති රියදුරු හා කොන්දොස්තර පුරප්පාඩු පිළිවෙළින් 678 හා 159 පැවති අතර 2023.12.31 දින වන විට එම පුරප්පාඩු පිරවීම සඳහා රියදුරන් හා කොන්දොස්තරවරුන් බඳවාගෙන ඇත. එමෙන්ම, කාර්මික අංශයේ නිසි වෘත්තිය සුදුසුකම් නොලත් කාර්මිකයන් 242 ක් සඳහා NVQ 3 නිපුණතා සහතික ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය හරහා ලබා දීමට කටයුතු කර ඇත. තව ද, මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ගිණුම් අංශය, විගණන අංශය, ධාවන අංශය ඇතුළු විශේෂ කාර්යාංශ තුළ සේවක සේවිකාවන් සඳහා අවශ්‍ය පුහුණු කිරීම් වැඩසටහන් 27 ක් ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා ශ්‍රීලංගම මඟින් රු.7,053,149.50 ක් දරා ඇත.

ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉස්මතුව ඇති ගෝලීය හා දේශීය අර්බුද විසඳීම සඳහා ජාත්‍යන්තරය තුළ විවිධ විසඳුම් සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුවෙමින් පවතින අතර විශේෂයෙන් දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කරගැනීම, මාර්ග තදබදය අවම කරගැනීම, රිය අනතුරු නිවාරණය සේවා සම්පාදනයේ දුර්වලතා මහහරවා ගැනීම වැනි ප්‍රමුඛ කටයුතුවල දී ශ්‍රීලංගම සමස්ත ක්‍රියාවලිය ද ඊට අනුගත වීමේ වැඩසටහන්වලට යොමු වීමේ අවශ්‍යතාවය තදින් පැන නැඟී ඇත. ඒ අනුව, මෙරට පොදු මඟී ප්‍රවාහනය සඳහා විදුලි බස් රථ හඳුන්වා දීම, නවීන මාදිලියේ බස් රථ යෙදවීම, බස් රථ කළමනාකරණය හා සේවා සම්පාදනය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම වැනි කටයුතු ප්‍රමුඛ තැනක් ගන්නා අතර ඊට අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කොට 2024 වර්ෂයේ සිට අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත. තව ද, දූෂණ හා අක්‍රමිකතා මුලින් උපුටා දැමීම, විනිවිද භාවයකින් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මඟින් සැපයුම්දාමය ශක්තිමත් කිරීම මෙන්ම සිසුසැරිය හා ග්‍රාමීය මගී ප්‍රවාහන සේවා ශක්තිමත් කිරීම ද ඉදිරි අපේක්ෂාවන් වී ඇත. ආදායම් ප්‍රවර්ධනය සඳහා සංචාරක කර්මාන්තය හා සම්බන්ධ වීමත් භාණ්ඩ ප්‍රවාහනය සඳහා දායක වීමත් කාලීන අවශ්‍යතාවයක් වී ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය වැඩසටහන් ද සැළසුම් කර ඇත.

2023 වර්ෂයේ අපේක්ෂිත ලාභය රුපියල් මිලියන 3974.0 ක් වුව ද, විවිධ බාධක මධ්‍යයේ ශ්‍රීලංගම සේවා සම්පාදන කටයුතු ඉටුකරමින් උපයාගත හැකි වූ ලාභය රුපියල් මිලියන 1098.9 කට සීමා වුව ද, 2022 වර්ෂය හා සසඳා බලන විට සැළකිය යුතු මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවීම ද 2022 වර්ෂයේ ලාභයෙන් රුපියල් මිලියන 145.0 මහ භාණ්ඩාගාරය වෙත ලබා දීමට හැකිවීම ද සතුටු විය හැකි කරුණක් බව දන්වා සිටිමි.

අවසාන වශයෙන් ශ්‍රීලංගම, ප්‍රවාහන අමාත්‍යාංශය හා මහාභාණ්ඩාගාරය ඒකාබද්ධව අත්සන් කරන ලද සාමූහික අවබෝධතා ගිවිසුමේ කොන්දේසි අනුව යමින් ශ්‍රීලංගම මූල්‍යමය වශයෙන් ශක්තිමත් ආයතනයක් බවට පත්කර ගැනීම සඳහා ක්‍රියාත්මක වන මෙම අවදිය තුළ ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා මහපෙන්වීම් කළ ප්‍රවාහන විෂය භාර ගරු අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා ඇතුලු ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු එම කාර්යය මණ්ඩලයටත්, ශ්‍රීලංගම අධ්‍යක්ෂ මණ්ඩලයටත්, ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයටත් ස්තූතිවන්ත වන අතර 2024 වසරේ දී අපේක්ෂිත ඉලක්ක කරා ලභා වීමට ඔවුන්ගේ නොමද සහය තවදුරටත් අපේක්ෂා කරමි.

ඉංජී. එස්.එම්.ඩී.එල්.කේ. ද අල්විස්
සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

ධාවන කොට්ඨාශය

1. 2023 වර්ෂය තුල ධාවනයට දිනකට ලබා දුන් සාමාන්‍ය බස්රථ ප්‍රමාණය 5,129 ක් වූ අතර දිනකට ධාවනය කරන ලද සාමාන්‍ය බස්රථ ප්‍රමාණය 4,485ක් පමණ වේ. දිනකට ධාවනය කළ සාමාන්‍ය කිලෝමීටර් ප්‍රමාණය මිලියන 0.99 ක් පමණ වේ. උපයනු ලැබූ සාමාන්‍ය දෛනික මාර්ග ලේඛන ආදායම රු. මිලියන 150 ක් වූ අතර එය කිලෝමීටරයකට රු.156.41 කි.

2. ශ්‍රී ලංගම මඟින් සපයනු ලබන ප්‍රථම සහ රාත්‍රී ගමන්වාර තරකිරීමත් මගී අවශ්‍යතාවය අනුව එම සේවා වර්ධනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන ඇත.

3. ශ්‍රී ලංගම බස්රථ සේවා සහ දුම්රිය ඒකාබද්ධ සේවය වර්ධනය කිරීම අරමුණු කරගෙන මගී අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දුම්රිය ස්ථානවල සිට ආරම්භ කරන බස්රථ සේවා වර්ධනය කිරීමටත් නව සේවා ආරම්භ කිරීමටත් පියවර ගෙන ඇත.

4. සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ සිසුසැරිය බස්රථ සේවාවන් 800 ක් දක්වා වර්ධනය කිරීමට හැකියාව ලැබී ඇති අතර ඉදිරියටත් සිසුන්ගේ සහ පාසල්වල අවශ්‍යතාවය සහ ඉල්ලීම් සලකා බලා මෙම සේවාව තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය විධිවිධාන සකස් කර ඇත.

5. සියළුම බස්රථ සඳහා විදුයුත් ටිකට් මැෂින් යොදාගැනීම තුලින් බස්රථ මඟින් මඟීන්ට සැපයෙන සේවා කාර්යක්ෂමතාවය ඉහල නංවා ගැනීමටත් ඵලදායීතාවය වර්ධනය කර ගැනීමටත් හැකියාව ලැබී ඇත.

6. මගී පහසුව උදෙසා අන්තර්ජාලය හරහා ආසන වෙන් කර ගැනීමේ පහසුකම් සහිත බස්රථ 800ක් දක්වා වර්ධනය කර ඇති අතර ආසන වෙන් කිරීමේ කවුළු 40ක් ආරම්භ කර ඇත. 2024 වර්ෂයේදී තව දුරටත් මෙම සේවා වර්ධනය කිරීමට අපේක්ෂිතයි.

<u>සමාජ ප්‍රතිලාභ සඳහා ශ්‍රී ලංගම දායකත්වය</u>

අළුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන්වාර ධාවනය

අළුයම ප්‍රථම හා රාත්‍රී අවසන් ගමන්වාර සැපයීම තුලින් රටේ ආර්ථිකයේ ශ්‍රම බලකාය සංචලනයට දායකත්වය සෘජුවම දායකවන නමුත් මෙම සේවාව තුලින් ශ්‍රී ලංගමයට අතීතයේ සිට හිමිව ඇත්තේ කීර්තිනාමය පමණි. නමුත් ශ්‍රී ලංගම කරනු ලබන තවත් සාමාජීය වගකීමක් ලෙස සලකා මෙම සේවාව මගී ජනතාවගේ සුවපහසුව පිණිස අඛණ්ඩවම ක්‍රියාත්මක කෙරේ.

ග්‍රාමීය ප්‍රදේශයන්හි බස් රථ ධාවනය

ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගම සහ නගර යා කිරීමේ ප්‍රබලතම ප්‍රවාහන මාධ්‍ය ලෙස සෘජුව දායකත්වයක් ලබා දෙනු ලබන්නේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයයි. මගීන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම සේවා අඛණ්ඩව සැපයීම සඳහා සෑම විටම කටයුතු කරන අතර ඉදිරියේදී ද නව බස් රථ මිලදී ගෙන මෙම සේවාව වර්ධනය කිරීමට සැලසුම් සකස් කර ඇත්තේ ග්‍රාමීය ආර්ථිකය ඉහල නැංවීමට ග්‍රාමීය ප්‍රවාහනය විධිමත් කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවිනි.

පාසල් සේවා බස්රථ ධාවනය

ශ්‍රී ලංගම විසින් දැයේ හෙට දිනය වෙනුවෙන් පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා විශාල සේවාවක් ඉටු කරනු ලබයි. මගී අවශ්‍යතාවය වැඩි කාලය තුල ඉහල ලාභයක් ඉපයීමට හැකියාව ඇති අවස්ථා අහිමි කර ගනිමින් දැයේ අනාගත පරපුර නියමිත වේලාවට පාසලට රැගෙන යාම සහ ආපසු නිවෙස් බලා ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංගම සතු බස් රථ මගින් ප්‍රශස්ථ සේවාවක් සපයනු ලැබේ.

ලේකම් කොට්ඨාශය

2023 වර්ෂයේ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2023 වර්ෂයෙහි පැවැත් වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන

01 වන රැස්වීම	-	2023/01/08
02 වන රැස්වීම	-	2023/02/06
03 වන රැස්වීම	-	2023/02/28
04 වන රැස්වීම	-	2023/03/22
05 වන රැස්වීම	-	2023/04/06
06 වන රැස්වීම	-	2023/05/31
07 වන රැස්වීම	-	2023/06/27
08 වන රැස්වීම	-	2023/08/03
09 වන රැස්වීම	-	2023/08/18
10 වන රැස්වීම	-	2023/09/26
11 වන රැස්වීම	-	2023/11/09
12 වන රැස්වීම	-	2023/11/30
13 වන රැස්වීම	-	2023/12/19

2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13 ක් පවත්වා ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉහත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අදාළ කටයුතු

1. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වෙන දිනය සඳහන් කර සියලුම අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා ශ්‍රී ලංගම කොට්ඨාශ/අංශ ප්‍රධානීන් වෙත නිවේදන නිකුත් කිරීම.

2. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා භාරගෙන පත්‍රිකා අංක යොදා ලේඛනගත කිරීමෙන් අනතුරුව ගොනු සකසා, අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත භාරදීම.

3. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකා පිළිබඳව හා චක්‍ර ලිපි පිළිබඳව සඳහන් කර අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීමේ න්‍යාය පත්‍රය සැකසීම.

4. න්‍යාය පත්‍රයට අනුව හා සභාපතිතුමාගේ උපදෙස් මත අධ්‍යක්ෂ මණ්ඩලීය පත්‍රිකා හා චක්‍ර ලිපි සභාගත කිරීම.

5. ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට හා චක්‍රලිපියට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන තීරණය හා ආනුෂංගික උපදෙස් නිවැරදිව වාර්තා කර අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ අයිතම අංක අනුව සටහන් කිරීම.

6. එසේ සටහන් කළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් වලට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද පසු එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් වල උධෘතයන් එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් ක්‍රියාත්මක කළයුතු ශ්‍රී ලංගම කොට්ඨාශ ප්‍රධානීන්/ අංශ ප්‍රධානීන් වෙත භාරදීම.

7. මෙම සියලුම කටයුතු නිවැරදිව, රහස්‍යභාවයෙන් යුතුව හා විධිමත්ව ඉටු කිරීම.

8. ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන් වෙත හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ආරාධනා ලද කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් වෙත සංග්‍රහ ලබාදීම.

9. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවන (ශ්‍රී ලංගම නිලධාරීන් නොවන) අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන්ට සහභාගිත්ව දීමනා ගෙවීමේ කටයුතු සිදුකිරීම.

10. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වන (ශ්‍රී ලංගම නිලධාරීන් නොවන) අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයන්ට ප්‍රවාහන දීමනා ගෙවීමේ කටයුතු සිදුකිරීම.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉඩකඩම් වලට අදාළ කටයුතු ඉටුකිරීම.

1. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය පිහිටි අංක 200 කිරුළ පාර පරිශ්‍රය සඳහා 2022 වර්ෂය සඳහා කොළඹ මහ නගර සභාව වෙත ගෙවිය යුතු වරිපනම් වන්දි මුදල ලෙස රු. 1,524,600.00 ක මුදල චෙක්පත් අංක - 212653 හා 2022.12.12 දිනැති මහජන බැංකු චෙක්පත මගින් ගෙවීම් සිදුකර ඇත.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි රජයේ ඉඩම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත 2023 වර්ෂය සඳහා ගෙවිය යුතු වාර්ෂික බදු මුදල වන රු. 15,000/- ක මුදල මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ චෙක්පත් අංක - 197173 හා 2022.08.17 දිනැති චෙක්පත මගින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා ඇත. ඒ සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක R829677 හා 2022.09.23 දිනැති මුදල් භාර ගැනීමේ කුවිතාන්සිපත ලබා දී ඇත. (වවුවරය පියවා ඇත)

3. දැරණියගල ඩිපෝව පිහිටි ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් විකුණුම්කරයක් මගින් ලබාගැනීමට අදාළව සියලුම ගෙවීම් සිදුකර ඇති අතර, එම ඉඩමට අදාළ ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඔප්පු ලබාගැනීමේ කටයුතු අවසන් අදියරේ පවතී.

4. ශ්‍රී ලංගම භුක්ති විඳිමින් සිටින ඉඩම් වල නිරවුල් අයිතිය ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරනු ලබයි. මේ අනුව, අම්බලන්ගොඩ ශ්‍රී ලංගම ඩිපෝ ඉඩමට අදාළව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පැවරුම් සහතිකය ලබාගැනීම පිණිස අත්පත් අරමුණු සංශෝධනය කර ඇති අතර, ඒ අනුව අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශ හා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය යන අමාත්‍යාංශ මට්ටමින් කටයුතු සිදු වෙමින් පවතී.

5. ශ්‍රී ලංගම මොණරාගල ඩිපෝව පිහිටි ඉඩම ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කුමාරවත්ත නමැති ඉඩමේ අක්.05 රූඩ්.01 පර්.17 ක ප්‍රමාණය සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු මුදල වන පරිහරණ ගාස්තු, තක්සේරු හා සේවා ගාස්තු SSCL 2.5% සහ එකතුකළ අගය මත 15% බද්ද යන ගාස්තූන් සඳහා මහජන බැංකු යුනියන් පෙදෙස ශාඛාවේ 2022.11.11 දිනැතිව චෙක්පත් අංක 212488 සහ චෙක්පත් අංක 212487 යන චෙක්පත් දෙක පිළිවෙලින් රු.385,000/- ක් හා රු.285,799.72 ක වටිනාකමින් යුතු චෙක්පත් දෙක මගින් ගෙවීම් කටයුතු සිදුකර ඇති අතර, මෙම ඉඩමේ ඔප්පු ලබාගැනීමේ කටයුතු අවසන් අදියරේ පවතී.

6. 2022.10.10. වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය භුක්ති විඳින ඉඩම්වල හිමිකම් තහවුරු කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ඉල්ලා අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමුකරන ලදී. එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇති අතර, එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව ඉඩම්වල හිමිකම් නිරවුල් කරගැනීම සඳහා අවශ්‍ය ඔප්පු දීමනාපත්‍ර ඇතුලු ඉඩම් නිරවුල් කරගැනීමට අවශ්‍ය ලේඛන ලබාගැනීමට කටයුතු කිරීම.

ඒ අනුව, පහත ඉඩම් කොටස් වෙනුවෙන් භුක්තිය ලබාගැනීම පිණිස සිදුකළ කාර්යයන් පහතින් දක්වා ඇත

- නිට්ටඹුව ඩිපෝව හා බස් නැවතුම්පළ භූමියෙහි නිදහස් දීමනා පත්‍රය ලබාගැනීම සඳහා ලේඛන සම්පූර්ණ කිරීම සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මැදිහත්වීම මගින් සිදුකර ඇති අතර, නිදහස් දීමනා පත්‍රය ලබාගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී.

- කිරිබත්ගොඩ බස් නැවතුම්පොළ භුක්ති විඳිනු ලබන ඉඩම් කොටසෙහි හිමිකම් තහවුරු කර ගැනීම පිණිස ඉඩම් මැනුම් කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට මුදල් ගෙවා ඇත.

- මීගමුව ඩිපෝ භූමියෙහි හිමිකම් තහවුරු කරගැනීම පිණිස මැනුම් කටයුතු සිදුකර අවසන් වී ඇති අතර, හිමිකම් ලබාගැනීම පිණිස ඉදිරි කටයුතු සිදුකරගෙන යමින් පවතී.

- උඩුගම ඩිපෝවේ අයිතිය ලබාගැනීමේ කටයුතු ඉල්ලුම්පත්‍රයක් මගින් යොමුකර ඇති අතර, එහි පිළිතුරු ලැබුණු පසු දීමනා පත්‍රය ලබාගැනීමේ කටයුතු ඉදිරියේදී කිරීමට නියමිතය.

- මාවරල බස් නැවතුම්පොළ මැනුම් කටයුතු සඳහා ගෙවිය යුතු මැනුම් ගාස්තු ගෙවා අවසන්කර ඇති අතර, ඉඩම් මැනීමේ කටයුතු අවසන් වූ පසු දීමනා පත්‍රය ලබාගැනීමේ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතය.

- හොරොව්පතාන ඩිපෝ භූමිය මැනුම් කිරීම සඳහා කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් විසින් අනුරාධපුර මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

- මොරගහකන්ද ජලාශය ඉදිකිරීමේදී එම ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංගමට අයත්ව තිබූ ඉඩම් ජලයෙන් යටවීම නිසා ඒ වෙනුවෙන් ලග්ගල නගරයෙන් ශ්‍රී ලංගමයට ඉඩම් කොටසක් ලබාදී ඇති බැවින් එම ඉඩම ශ්‍රී ලංගම සභාපතිතුමාගේ අනුමැතිය පරිදි මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ලිපි මගින් මැනුම් කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර, එයට අදාළ මුදල් ද මේ වන විට ගෙවා අවසන්ය.

- මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මේ වන විට භූමිය මැනුම් අවසන්කර එහි සැලැස්ම මහවැලි අධිකාරිය වෙත භාර දී ඇති අතර, මහවැලි අධිකාරිය මගින් ලිපිගොනුව සකසා තක්සේරු වාර්තාවක් ලබාගැනීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බව ශ්‍රී ලංගමයට දන්වා ඇත.

- මාවතගම බස් නැවතුම්පොළ මැනුම් කටයුතු සිදුකිරීමට අදාළව රු.41,400/- ක මුදලක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (කුරුණෑගල) කාර්යාලයට ගෙවා ඇත.

- නාරම්මල බස් නැවතුම්පොළ මැනුම් කටයුතු සිදුකිරීමට අදාළව රු.41,400/- ක මුදලක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (කුරුණෑගල) කාර්යාලටය ගෙවා ඇත.

- අවිස්සාවේල්ල ඩිපෝව පිහිටි ආතර් ෆල්ඩ්වත්ත ඉඩමට අදාළව 2023/21 දරණ මැනුම් ඉල්ලීම් නාරාහේන්පිට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිය වෙත 2023.07.21 දින යොමුකර ඇත.

- දඹුල්ල ඩිපෝව පිහිටි හීන්මොරගොල්ලවත්ත ඉඩම 2518/2022 මැනුම් ඉල්ලීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී මාතලේ වෙත ප්‍රාදේශීය ලේකම් විසින් යොමුකර ඇත.

- කැබිතිගොල්ලෑව ඩිපෝ භූමිය මැනුම් කිරීම සඳහා මිනින්දෝරු කාර්යාලයට මැනුම් ඉල්ලීම් යොමුකර ඇත. රු.48,924/- ක මුදලක් මැනුම් ගාස්තු වශයෙන් ගෙවා ඇත. එහෙත් මිනින්දෝරුව විසින් ඉඩම් මැනුම්කර පිඹුරුපත් ලබා දී නැත.

- මාවනැල්ල ඩිපෝව පිහිටි ඉඩම සම්බන්ධයෙන් කෑගල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත 501 දරණ මැනුම් ඉල්ලීම ප්‍රාදේශීය ලේකම් විසින් යොමුකර ඇත. ඒ අනුව මැනුම් ගාස්තු වශයෙන් රු.41,400/- ක මුදලක් ගෙවන ලෙස දන්වා එවා ඇත. රු.41,400/- ක මැනුම් ගාස්තු කෑගල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී නමින් ගෙවීම් කර ඇත. මේ දක්වා මැනුම් කටයුතු සිදු වී නැත. මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම සිහිකැඳවීම් කරන ලදී.

- උඩුදුම්බර ඩිපෝව පිහිටි ඉඩම සම්බන්ධයෙන් මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිය වෙත 2023.05.17 ලිපිය මගින් මැනුම් කටයුතු සිදුකිරීම සඳහා යොමුකොට ඇත.

- නුවරඑළිය ඩිපෝව පිහිටි ඉඩම 2023.05.12 දිනැති ලිපිය මගින් අදාළ මැනුම් ඉල්ලීම් අංක 13/2023 ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත යොමුකර ඇත.

- හෙම්මාතගම බස්නැවතුම්පළ පිහිටි බෝගහමුලවත්ත ඉඩම සම්බන්ධයෙන් කෑගල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත 501 දරණ මැනුම් ඉල්ලීම ප්‍රාදේශීය ලේකම් විසින් යොමුකර ඇත. ඒ අනුව මැනුම් ගාස්තු වශයෙන් රු.41,400/- ක මුදලක් ගෙවන ලෙස දන්වා එවා ඇත. රු.41,400/- ක මැනුම් ගාස්තු කෑගල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී නමින් ගෙවීම් කර ඇත. මේ දක්වා මැනුම් කටයුතු සිදු වී නැත. මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම සිහිකැඳවීම් කරන ලදී.

- දෙනියාය බස් නැවතුම්පොළ පිහිටි පොතුමුල්ලේඅද්දරහේන නමැති ඉඩම සම්බන්ධයෙන් රු.20,700/- ක් මිනින්දෝරු ගාස්තු මාතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ගෙවන මෙන් දන්වා එවා ඇත. රු.20,700/- ක මිනින්දෝරු ගාස්තු ගෙවන මෙන් රුහුණ ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාර වෙත දන්වා යවා ඇත. ශ්‍රී ලංගම පුත්තලම ඩිපෝව සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ A/puth/65 අංක දරණ 44 වගන්ති පැවරුම් සහතිකය 2023.06.15 දින ශ්‍රී ලංගම විසින් ලබාගෙන ඇත.

- දැරණියගල බස් නැවතුම්පොළ පිහිටි හම්බන්වෙලවත්ත ඉඩම මැනීම සඳහා නිකුත් කරන ලද මැනුම් නියෝගයට අනුව මැනුම් ගාස්තු වශයෙන් රු.41,400/- ක මුදල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී කෑගල්ල වෙත ගෙවීමට කටයුතු කරන මෙන් දන්වා ඇත. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී කෑගල්ල නමට රිසිට් අංක 75285 මගින් මුදල් ගෙවා ඇති අතර, මැනුම් කටයුතු මෙතෙක් සිදු වී නොමැත. අවස්ථා කිහිපයකදීම සිහිකැඳවීම් කර ඇත.

- රඹුක්කන බස් නැවතුම්පළ පිහිටි වාඩියවත්ත නමැති ඉඩම 2022.11.23 ලිපියට අනුව කෑගල්ල මැනුම් අධිකාරී වෙත රඹු/827 දරණ මැනුම් ඉල්ලීම යොමුකර ඇත. මැනුම් ගාස්තු වශයෙන් රු.34,500/- ක මුදලක් දන්වා එවා ඇත. මැනුම් ගාස්තු වශයෙන් රු. 34,500/- ක මුදලක් කෑගල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ගෙවීම්කර ඇත.

7. ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තක්සේරු අංක 073/1, මිනුවන්ගොඩ පාරේ පිහිටි අංක - 2005110073/01 දරණ ගොඩනැගිල්ල සඳහා 2023 වර්ෂය වෙනුවෙන් ජා-ඇල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු වරිපනම් වන්දි මුදල ලෙස රු.8,154.20 ක මුදලක් ගෙවීමට නියමිතව තිබූ අතර, එය 2024 ජනවාරි 31 ට පෙර ගෙවීම් කිරීම නිසා ඒ වෙනුවෙන් ශ්‍රී ලංගමයට 10% ක වට්ටමක් හිමි වූ අතර, ගෙවීම් කිරීමට සිදු වූ මුදල රු.7,338.78 ක් බව හා එම මුදල ගෙවීම සඳහා චෙක්පත් අංක - 225503 හා 2023.01.18 දිනැති මහජන බැංකු චෙක්පත මගින් ගෙවීම් සිදුකර ඇත.

තවද, එම ගබඩා පරිශ්‍රයට අදාළව හිඟ වරිපනම් මුදලක් ඇති බවට දඹුගම ප්‍රාදේශීය සභා උප කාර්යාලය මගින් ශ්‍රී ලංගම වෙත දැනුම් දී තිබූ බැවින්, එම හිඟ වරිපනම් මුදල ලෙස සැලකෙන රු.6,115.65 ක මුදල ගෙවීම සඳහා චෙක්පත් අංක - 225473 හා 2023.01.27 දිනැති මහජන බැංකු චෙක්පත මගින් ගෙවීම් සිදුකර ඇත.

8. ශ්‍රී ලංගම කිරිඳිවැල බස් නැවතුම්පළ පිහිටි ගොපරගහවත්ත නොහොත් වලව්වත්ත ඉඩමෙහි මු.පි.ගම් 63 හි කැබලි අංක 06 සිට 11 දක්වා කැබලි සඳහා වන්දි හා පොළී මුදල් ගෙවීම් කිරීමේදී කැබලි අංක 06, 07. 08, 09, 10, 11 සඳහා වන්දි මුදල් ගෙවීම් 2017.01.06 දින සිදුකර ඇති අතර, එම කැබලි සඳහා පොළී මුදල් ගෙවීමේදී කැබලි අංක 07, 08, 09, 11 සඳහා ද පොළී මුදල් මින් පෙර ගෙවීම් සිදුකර ඇත.

තවද, ඉතිරි කැබලි 02 වන කැබලි අංක 06 සහ 10 සඳහා ගෙවිය යුතු පොළී මුදල් වන පිළිවෙලින් රු.655,657.73 හා රු.61,251.51 ක මුදල චෙක්පත් අංක - 283175 හා 283176 දරණ 2023.11.28 දිනැති මහජන බැංකු යුනියන් පෙදෙස ශාඛා චෙක්පත් මගින් ගෙවීම් කරන ලදී.

තවද, කැබලි අංක 10 ට අදාළ දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත රජයට අත්කර ගනු ලබන ඉඩම් හෝ නිශ්චල දේපළ වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන වන්දි මුදල් වෙනුවෙන් පොළී ගෙවීම් මත රඳවාගැනීමේ බද්ද 5% ක් වන බදු මුදල රු.2,956.22 ක මුදල ද චෙක්පත් අංක - 283177 හා 2023.11.28 දිනැති මහජන බැංකු යුනියන් පෙදෙස ශාඛා චෙක්පත මගින් ගෙවීම් කරන ලදී.

තවද, ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවනු ලැබූ කැබලි අංක 06 සහ 10 ට අදාළ පොළී මුදල් වෙනුවෙන් පිළිවෙලින් 0564841 හි 0564840 දරණ 2023.11.29 දිනැති මුදල් හාරගැනීමේ කුවිතාන්සිපත් ද ශ්‍රී ලංගමයට ලැබී ඇත.

ඒ අනුව, කිරිඳිවැල බස් නැවතුම්පොළ භූමියෙහි ශ්‍රී ලංගමය විසින් ගෙවිය යුතුව තිබූ සියලු වන්දි හා පොළී මුදල් ගෙවා නිමකර ඇති අතර, කිරිඳිවැල බස් නැවතුම්පළ භූමියෙහි හුක්තිය ලබාගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරගෙන යමින් පවතී.

9. 2004.12.26 දින සුනාමි රළ පහරින් විනාශයට පත් වූ එවකට පැවති ශ්‍රී ලංගම පෙට්ටිගලවත්ත වැඩපොළ පිහිටි ඉඩම 2007 වසරේදී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ව්‍යෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යවරයාගේ ඉල්ලීමකට අනුව ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) ගාල්ල ශාඛාව පිහිටුවීම සඳහා ලබාගෙන තිබිණි. එම ඉඩමට අදාළව ශ්‍රී ලංගම හිමිකම තහවුරු කරගැනීම සඳහා කරුණු ඉදිරිපත් කිරීමේදී එම ඉඩම රජයට අයත් ඉඩමක් ද නොඑසේ නම් ශ්‍රී ලංගමයට අයත් ඉඩමක් ද යන්න තහවුරු කරගත යුතුව තිබුණි.

ඒ අනුව, 2007 වසරේ සිට අඛණ්ඩව කරුණු ඉදිරිපත් කරමින් මෙම ඉඩම 1957 අංක 48 දරණ මෝටර් ගමනාගමන පනත යටතේ ශ්‍රී ලංගමයට හිමි වී ඇති බව අප විසින් පෙන්වා දීමෙන් අනතුරුව 2022.03.14 දින ඉඩම් අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාවේ අවසාන වශයෙන් මෙම ඉඩම ශ්‍රී ලංගමයට අයත් බව පෙන්වා දීමෙන් පසුව ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) වෙත ඉඩම පවරා දී ඉඩමේ තක්සේරු වටිනාකම වන රු. මිලියන 35 (රු.35,000,000.00) ක මුදල ලබාගැනීම සඳහා අවසාන වරට 2022.07.22 දින පැවති ශ්‍රී ලංගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලබාගෙන ඉදිරි කටයුතු සඳහා ශ්‍රී ලංගම නීති කොට්ඨාශය මගින් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය වෙත සියලු ලේඛන ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, පැවරුම් ඔප්පුවක් සකස්කර ශ්‍රී ලංගමයට හිමි විය යුතු ඉහත සඳහන් රු.35,000,000.00 ක මුදල ලබාගැනීම සඳහා චෙක්පත් අංක -351131 හා 2023.08.31 දිනැති ලංකා බැංකුව නිදහස් චතුරස්‍ර ශාඛාව මගින් රු.35,000,000.00 ක චෙක්පත ශ්‍රී ලංගමයට ලබාදෙන ලදී.

10. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තලංගම ඩිපෝව සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගෙන තිබූ ඉඩම් කොටස් දෙක සඳහා ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ නිකුත් කරන පැවරුම් සහතිකය කඩුවෙල

ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කර ඇති අතර, එම පැවරුම් සහතිකය කඩුවෙල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරවා ඇත.

ආරක්ෂක අංශය

1. සිසිටීවී කැමරා පද්ධතියක් සවිකිරීම තුළින් ආරක්ෂක කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම.

2. දිවයින පුරා පිහිටි ශ්‍රී ලංගම ආයතනයන් වෙත ගිනි නිවන උපකරණ ලබාදීම/ නඩත්තු කිරීම හා ඒ සම්බන්ධව අධීක්ෂණ කටයුතු සිදු කිරීම.

3. සෑම ප්‍රාදේශිකයක් තුළම ආපදා අවස්ථාවකදී විශේෂ ගලවා ගැනීමේ කණ්ඩායමක් ස්ථාපිත කිරීම. ඒ සඳහා තෝරාගත් නිලධාරීන් සඳහා විධිමත් පුහුණුවක් ලබාදීම.

4. ශ්‍රී ලංගම ආයතනයන් තුළ ඇති ආරක්ෂක මුර කුටි හා විවේකාගාර අලුත්වැඩියා කිරීම.

5. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන දොරටුව හා ඇමති දොරටුව යන දොරටු දෙක නවීකරණයකර ආරක්කු හැඩැති වහළ සවිකිරීම.

6. ගමන් කථන යන්ත්‍ර 10 ක් මිලදී ගැනීම.

7. කොළඹ, ගම්පහ, කළුතර, රුහුණ යන ප්‍රාදේශිකයන් සඳහා පුද්ගලික ආරක්ෂක කටයුතු සැපයීම් සිදු කරනු ලබන එම සමාගම් මගින් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය හා අධීක්ෂණය කිරීම.

ක්‍රියාකාරකම්

1. ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් ශ්‍රී ලංගම ආයතන සේවකයින් සඳහා නිදහස් ගමන් බලපත්‍ර හා සේවක හැඳුනුම්පත් සකස් කිරීමෙන් පසු නිකුත් කිරීම.

2. ශ්‍රී ලංගම සියලුම ඩිපෝවන් හා බස් රථ පෙර දැනුම් දීමකින් තොරව හදිසි පරීක්ෂාවන්ට ලක්කර දූෂණ හා අක්‍රමිකතා අවම කිරීම.

3. දිවයින පුරා පිහිටා ඇති ශ්‍රී ලංගම ආයතනයන්හි සිදුවන දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් ලැබෙන විවිධ පැමිණිලි හා මගී ජනතාව විසින් සිදු කරනු ලබන පැමිණිලි සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීම.

වර්ෂය	නිමකර ඇති විමර්ශන ප්‍රමාණය	හදිසි පරීක්ෂණ කටයුතු ප්‍රමාණය
2023	41	30

2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන කොට්ඨාශය මඟින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තර

අනු අංකය	අංශය	ආයතනයේ කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව	එක් එක් කාර්යයන් තුළින් අපේක්ෂිත විගණන අරමුණ	කරන ලද කාර්යයන් වල ප්‍රතිශතය
1	ධාවන	බස් සේවක කණ්ඩායම් යෙදවීම පරීක්ෂාව	• කාර්ය චක්‍රයට අනුකූලව වියදම් අවම වන පරිදි බස් සේවක කණ්ඩායම් යොදවා ඇත්දැයි සෑහීමකට පත්වීම.	50%
		රියදුරු කොන්දොස්තර පැමිණීමේ දිරි දීමනා ක්‍රමවේදයක් හඳුන්වා දීම	• රියදුරු/ කොන්දොස්තර දිරි දීමනා ක්‍රමවේදය මගින් ශ්‍රී ලං.ග.ම. විසින් බලාපොරොත්තු වන ආදායම් ඉලක්ක කරා ළඟාවී ඇත්ද යන්න පරීක්ෂාව. • කාර්යයන් අඩාල නොවන පරිදි බස්රථ ධාවනය කර තිබීම. • සියළුම කාලසටහන් අවශ්‍යතා පරිදි බස්රථ ධාවනය කරවා ඇත්දැයි පරීක්ෂාව. • අඛණ්ඩව සේවයට පැමිණෙන රියදුරු/ කොන්දොස්තර මහතුන්ගේ ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් කිරීම පරීක්ෂාව.	50%
		වාර ප්‍රවේශ පත්‍ර පරීක්ෂා කිරීම	• නියමිත දිනට වාර ප්‍රවේශ පත්‍ර අලෙවිය ආරම්භ කිරීම හා අවසාන කිරීම පරීක්ෂාව. • වාර ප්‍රවේශ පත්‍ර ප්‍රතිදාන ලබා ගැනීමට කටයුතු කර තිබේද යන්න පරීක්ෂාව. • වාර ප්‍රවේශ පත්‍ර තොග ලේඛනය පරීක්ෂාව. • දැනට ගෙවනු ලබන වාර ප්‍රවේශ පත්‍ර විකුණුම් මත ප්‍රසාද දීමනා චක්‍ර ලේඛනය ප්‍රකාරව ගණනය කර ඇත්දැයි පරීක්ෂාව. • ආදායම් මුදල් නියමිත පරිදි බැංකුගත කර තිබේද යන්න පරීක්ෂාව.	75%
		ජංගම පරීක්ෂණ සේවා විධිමත් කිරීම හා සිදුකරනු ලබන පරීක්ෂණ ප්‍රමාණය වැඩි කිරීම	• ජංගම පරීක්ෂණ නිලධාරීන්ගෙන් ආයතනයට වන ඵලදායීතාවය හා ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂාව. • අවශ්‍ය ස්ථානයන්ට නිසි වේලාවට ජංගම නිලධාරීන් යොදවා ඇත්ද යන්න පිළිබඳ පුරෝකථනය කිරීම. • ජංගම නිලධාරීන් යෙදවීම තුළින් ආයතනයේ ආදායම වර්ධනයවී ඇත්ද යන්න තහවුරු කර ගැනීම. • මගී දඩ මුදල් හා කොන්දොස්තර විෂමාචාර හසු කර ගැනීමේ ප්‍රගතිය. • ජංගම නිලධාරීන්ගේ වියදම හා ඔවුන් යෙදවීම තුලින් ආදායම වර්ධනය වීම අතර පවතින ප්‍රතිඵල පිළිබඳ පුරෝකථනය කිරීම.	20%
2	කාර්මික	භාණ්ඩාගාර හා ශ්‍රී ලං.ග.ම. ප්‍රතිපාදන යොදා ගනිමින් සියළුම ප්‍රාදේශිය වැඩපලවල් හා ඩිපෝ මඟින් පැරණි එන්ජින් කට්ටල් අළුත්වැඩියා කර බස්රථ සඳහා සවි කිරීම	• සේවකයින්ගෙන් ආයතනයට ඵලදායී සේවයක් හිමි වන්නේද යන්න හා නිම කරනු ලබන කාර්යයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම. • අළුත්වැඩියා කරනු ලබන එන්ජින් වල පැවැත්ම හා නඩත්තුව පිළිබඳ පසු විපරම් කිරීම. • එන්ජින් කට්ටල් අළුත්වැඩියාව ආයතනයට කොතරම් ඵලදායී වන්නේද යන්න සොයා බැලීම. • එන්ජින් අළුත්වැඩියාව සඳහා වන වියදම පිළිබඳව විගණනය. • අපේක්ෂිත ඉලක්කකරා ප්‍රාදේශීය වැඩපලවල් හා ඩිපෝවන් ගමන්කර ඇත්ද යන්න තහවුරු කර	75%

			ගැනීම.	
	කාර්මික	අවශ්‍යතාවය හඳුනා ගනිමින් ශ්‍රී ලං.ග.ම නිෂ්පාදනාගාර තුල අවශ්‍ය පෙරසවි ටයර් ප්‍රමාණය නිෂ්පාදනය කිරීම	• ආයතනයේ අවශ්‍යතාවයන්ට අනුරූපීව ගුණාත්මකභාවයේ නිෂ්පාදන නිමවුමට පවත්වන්නේද යන්න හා එහි ඵලදායීතාවය පරීක්ෂාව. • නිෂ්පාදන කටයුතු සඳහා වැය වන වියදම් පිළිබඳ විගණනය. • නිෂ්පාදන කටයුතු සඳහා වැය වන වියදම් පිළිබඳ නිමැවුමේ වියදම හා ආදායම අනුව අයතනයට හිමිව ඇති ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම. • ඒ සඳහා සේවකයින් ඵලදායී වන අයුරින් යොදවා ඇත්ද යන්න සොයා බැලීම. • නිෂ්පාදනය වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය විගණන යෝජනා කළමණාකාරීත්වය වෙත ඉදිරිපත් කිරීම.	75%
		ඉන්ධන හා අමතර කොටස් පරිභෝජනය පරීක්ෂාව	• බස් රථවලට ඉන්ධන නිකුත් කිරීම නිසි ක්‍රමවේදයන්වලට අනුකූලව සිදුවන්නේ දැයි විශ්ලේෂණය කිරීම. • අමතර කොටස් පරිභෝජන වැය වාර්තාව හා ඊට අදාළ තොරතුරු නිසියාකාරව ගිණුම්ගත වන්නේදැයි පරීක්ෂා කිරීම.	50%
		බස්රථ අළුත්වැඩියා කටයුතු	• ප්‍රාදේශීය වැඩපලවල් වෙත යොමු කළ බස්රථ නිසියාකාරව ලේඛනගත කර අළුත්වැඩියා කර නැවත භාරදෙන ලද බව පරීක්ෂාව. • අළුත්වැඩියා කටයුතු සිදුකර ධාවනය ලබාදෙන බස්රථ වලින් ආයතනයට ඵලදායී සේවයක් සිදුවනවාද යන්න පසු විපරම් සිදු කිරීම. • බැටරි, ටයර්, ගියර් පෙට්ටි, එන්ජින් ආදී දෑ මිලදී ගැනීම පිලිවෙත් ප්‍රකාරව සිදුවී ඇත්ද යන්න පරීක්ෂාව.	75%
3	පාලන	සමස්ථ සේවකයින්ගේ ජීවදත්ත තොරතුරු ඇතුලත් පද්ධතිය (HRIS) යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම	• ඇතුළත් කරනු ලබන දත්තවල නිරවද්‍යතාවය හා ආරක්ෂාව පවත්වාගනු ලබන්නේද යන්න පරීක්ෂාව. • සියළුම සේවකයින්ගේ දත්ත ඇතුළත්ව ඇද්ද යන්න තහවුරු කර ගැනීම. • දත්ත යාවත්කාලීන වන්නේද යන්න පසු විපරම් කිරීම. • පද්ධතිය තුල පවතින අඩුපාඩු පිළිබඳ සොයාබලා කළමණාකාරීත්වය වෙත වාර්ථා කිරීම.	25%
		විනය හා නිවාඩු ලේඛන විගණනය	• එක් එක් සේවා ස්ථානයන්හී/ කොට්ඨාශ/ අංශ වල භාවිතා කරන පැමිණීමේ ලේඛන, බැහැර යාමේ ලේඛන අනුසාරයෙන් නිවාඩු ලේඛන පිළිවෙත් ප්‍රකාරව නඩත්තුවන්නේ දැයි පරීක්ෂා කිරීම. • ආයතනයට අවාසි සහගත නොවන අයුරින් විනය ක්‍රියාමාර්ග ගන්නේද, සේවක විනය පිළිබඳ කළමනාකාරීවයේ අවධානය යොමුවීම පිළිබඳ විගණන මතය ඉදිරිපත් කිරීම.	95%
4	මුදල්	2022 වාර්ෂික තොග සමීක්ෂණය සිදුකිරීම	• වර්ෂය අවසානයේ ආයතනය තුළ පවතින සත්‍ය භෞතික තොගයේ වටිනාකම ගණනය කිරීම. • ගබඩා තොග අඩුවීම් හා වැඩිවීම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම. • අනවශ්‍ය ලෙස භාණ්ඩ තොග ගත කර ඇත්ද යන්න	100%

			තහවුරු කර ගැනීම. • භෞතික තොග ගණනයේදී ඇති වන අතිරික්තතා හා ඌනතා තොග සම්බන්ධව ගත්නා ක්‍රියාමාර්ග පිළිබඳ පරීක්ෂාව හා තොග වල සත්‍ය වටිනාකම අවසාන ගිණුම් වාර්ථාවල සටහන් කර ඇත්දැයි පරීක්ෂාව.	
		පාරිතෝෂික විගණනය	• පාරිතෝෂික අධිභාර ගෙවීමකින් තොරව සේවකයන්ට නිසි වේලාවට පාරිතෝෂික ලබාදීමට අවශ්‍ය විගණන සහය ලබාදීම.	100%
4	මුදල්	මාසික මුදල් සමීක්ෂණය	• සියළුම ඩිපෝවන් ප්‍රාදේශීය කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන මුදල් හා සුළු මුදල් අග්‍රිම පරීක්ෂාව. • මුද්දර අග්‍රිමය පරීක්ෂාව.	50%
		වේතන, අතිකාල, චර්යා පත් නඩත්තුව හා සේවක බැංකු ණය අය කිරීම	• වේතන හා අතිකාල ගෙවීම් නිවැරදිව හා ඵලදායී ලෙස සංඛ්‍යා ලේඛන උපයෝගී කරගනිමින් ගෙවා ඇත්ද යන්න සෑහීමකට පත්වීම. • ආයතනයෙන් ඇප තබා ගෙවන ලද බැංකු වාරික නිසියාකාරව ගෙවා ඇත්ද යන්න තහවුරු කර ගැනීම හා එසේ අයකර නොමැති නම් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේද යන්න පරීක්ෂා කිරීම.	75%
		තෙවන පාර්ශවීය ගෙවීම්	• බස්රථ රක්ෂණ, බස්ගාල් ගාස්තු, සුභ සාධක සංගම් වලට අයවිය යුතු මුදල් නිවැරදිව ගෙවා ඇත්ද යන්න සංනිරීක්ෂනය කිරීම.	10%
		වත්කම් කළමණාකරණය සඳහා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම	• ක්ෂය ප්‍රතිපාදනය කර ඇත්ද යන්න පරීක්ෂාව • ස්ථාවර වත්කම් නිසි පරිදි සමීක්ෂණය කර ගිණුම්ගතකර ඇත්ද යන්න පරීක්ෂාව.	20%
		ප්‍රධාන මුදල් පොත්, දෛනික මුදල් පොත, ගෙවීම් වවුචර්, මුදල් ලැබීම් හා ආදායම් එකතු කිරීම	• ගිණුම්කරණ පිළිවෙත්, මූලධර්ම වලට අනුකූලව මෙන්ම මුදල් රෙගුලාසි අනුව කාර්යයන් සිදුවී ඇත්ද යන්න හා එහි නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය. • ආයතනයේ ආදායම නිසි අයුරින් සඳහන්ව ඇත්ද යන්න තහවුරුකර ගැනීම. • දරණ ලද වියදම් නියමිත පිළිවෙත් අනුව සිදුවී ඇත්ද යන්න තහවුරු කර ගැනීම.	60%
5	පුහුණු	සියළුම අංශයන් සඳහා නිළධාරීන් අදාළ විෂයන් පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම	• ආයතනයේ අරමුණු ඉටුවන අයුරින් ඒ සඳහා වඩාත් සුදුසු සේවකයින් හඳුනාගෙන පුහුණුවක් ලබාදෙන්නේද, එම පුහුණුව ප්‍රායෝගිකව භාවිත වන්නේද යන්න පරීක්ෂා කිරීම තුළින් පුහුණුවේ සාර්ථකතවය මැන බැලීම. • පුහුණුව සඳහා දරන ලද වියදම පිළිබඳ තහවුරු කර ගැනීම. • පුහුණුවෙන් පසු අදාල සේවකයින් එය භාවිතයට ගෙන ඇත්ද යන්න තහුවරු කර ගැනීම	10%
		රියදුරු පුහුණු පැසැල් විගණනය	• ආයතනයේ අරමුණු හා ඉලක්ක වෙත ළඟාවීම සඳහා රියදුරු පුහුණු පාසල් දක්වා ඇති දායකත්වය පිළිබඳ පරීක්ෂාකර අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් කිරීම.	10%
6	සිවිල්	සංචාරක නිකේතන අළුත්වැඩියා කිරීම	• සංචාරක නිකේතන අළුත්වැඩියාව මඟින් ආයතනය බලාපොරොත්තු වන ප්‍රතිලාභ ලැබී ඇත්ද යන්න පුරෝකථනය කිරීම. • අළුත්වැඩියාවේ ගුණාත්මකභාවය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම. • අමුද්‍රව්‍ය හා අනෙකුත් වියදම් පිළිවෙත් ප්‍රකාරව කර ඇත්ද යන්න සෑහීමකට පත්වීම.	5%

7	ලේකම්	අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමත කරන ලද අදාල ඉඩම් පිළිබඳව විස්තර අතුලත් ඇමුණුම් සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ශ්‍රී ලං.ග.ම ඉඩම්වල අයිතිය හා භිමිකම් නිරවුල් කර ගැනීම	• ශ්‍රී ලං.ග.ම භාවිතා කරනු ලබන ඉඩම් වල අයිතීන් ලං.ග.ම ය වෙත ලබාගත්තේද යන්න හා එම ඉඩම් ආයතනයේ අරමුණු වෙනුවෙන් ඵලදායීව යොදාගන්නේද යන්න පරීක්ෂාකිරීම තුළින් කළමනාකාරීත්වයට සුදුසු යොජනා ඉදිරිපත් කිරීම. • අනෙකුත් ඉඩම් සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් කිරීම. • ඉඩම් පවරා ගැනීමට අදාළ විගණන යෝජනා ඉදිරිපත් කිරීම.	5%
8	ප්‍රසම්පාදන	වාර්ෂික ප්‍රසම්පාදන කටයුතු සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම	• ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සැළසුම් හා අවබෝධය. • ප්‍රසම්පාදන අවශ්‍යතා තක්සේරුකරණය. • ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කිරීම. • වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය. • ප්‍රසම්පාදනය සම්බන්ධ ගැටළු හා විසදුම් ක්‍රියාවලිය.	25%
9	සම්පාදක	ප්‍රාදේශික වලට බෙදා හැරීම සඳහා අමතර කොටස්, ටයර්, බැටරි, ටිකට් රෝල් ආදී දෑ මිලදී ගැනීම හා බෙදා හැරීම	• ප්‍රසම්පාදන පිළිවෙත්වලට අනුකූලව භාණ්ඩ මිලදී ගැනීම පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම. • අවශ්‍යතාවයට අදාළ අමතර කොටස් මිලදී ගන්නේදැයි පරීක්ෂාකිරීම. • අවශ්‍යතාවය මත ගබඩා පිළිවෙත් අනුගමනය කරමින් අදාළ භාණ්ඩය අදාළ ඩිපෝවට ලැබී ඇත්දැයි පසුවිපරම් කිරීම.	25%
10	වෙනත්	සභාපතිතුමා විසින් පවරන විශේෂ රාජකාරී කටයුතු	• සභාපතිතුමාගේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අවශ්‍ය නිර්දේශයන් නිසි වේලාවට ලබාදීම.	100%
		විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.	• කාර්තුවලට අදාළ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි සංවිධානය කර පැවැත්වීම.	100%
		විගණන සාකච්ඡා පැවැත්වීම	• විගණනයෙන් අනාවරණය කර ගන්නා ගැටළු සම්බන්ධව ප්‍රාදේශික වශයෙන් සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වාගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ තීරණයක් ලබාදීම.	75%

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) කොට්ඨාශය

අනු අංකය	කරන ලද කාර්යය	ලිපි ගණන
1	ජනාධිපති කාර්යාලයෙන් යොමුකරන ලද ලිපි සඳහා පිළිතුරු යැවීම	7
2	අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් යොමුකරන ලද ලිපි සඳහා පිළිතුරු යැවීම	11
3	ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලයෙන් යොමුකරන ලද ලිපි සඳහා පිළිතුරු යැවීම	69

අනු අංකය	කරන ලද කාර්යය	ලිපි ගණන
1	පාලන අත්පොතෙහි සංශෝධිත කෙටුම්පත සකස් කිරීම	1

අනු අංකය	කරන ලද කාර්යය	ලිපි ගණන
1	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවේ සඳහන් ආකෘතියට අනුව ශ්‍රී ලංගම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ කෙටුම්පත් සකස්කර අනුමැතිය සඳහා 2023.02.09 දින යොමු කිරීම.	1
2	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවේ සඳහන් ආකෘතියට අනුව ශ්‍රී ලංගම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සංශෝධිත කෙටුම්පත් සකස්කර අනුමැතිය සඳහා 2023.07.07 දින යොමු කිරීම.	1
3	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවේ සඳහන් ආකෘතියට අනුව ශ්‍රී ලංගම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ නැවත සංශෝධනය කරන ලද සංශෝධිත කෙටුම්පත් සකස්කර අනුමැතිය සඳහා 2023.11.21 දින යොමු කිරීම.	1

අනු අංකය	කරන ලද කාර්යය	ලිපි ගණන
1	පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා යොමු කරන ලද ලිපි	15
2	ශ්‍රී ලංගම සේවකයින් විසින් මහජන පෙත්සම් කාරක සභාවට යොමුකරන ලද ඉල්ලීම් සඳහා යොමු කරන ලද පිළිතුරු ලිපි	06
3	තොරතුරු පනත මගින් ශ්‍රී ලංගම සේවකයින් විසින් ඉල්ලුම් කරනු ලබන තොරතුරු සඳහා පිළිතුරු ලිපි	23

මානව සම්පත් කළමණාකරණ කොට්ඨාශය

මාසිකව රුපියල් 30,000/- දීමනාවක් යටතේ හුදෙක් කොන්ත්‍රාත් පදනම මත මාස 06 කාලය සඳහා රියදුරු / කොන්දොස්තර නව පත්වීම් ලබා දීම.

පත්වීමේ ස්වභාවය	**සංඛ්‍යාව**
	2023
කොන්ත්‍රාත් රියදුරු	755
කොන්ත්‍රාත් කොන්දොස්තර	365
එකතුව	**1,120**

<u>විධායක ශ්‍රේණියේ පත්වීම් පිළිබඳව විස්තරය</u>

පත්වීමේ ස්වභාවය	**සංඛ්‍යාව**
	2023
ස්ථිර පත්වීම්	-
ආවරණ පත්වීම් / කාර්යය පැවරුම්	56
උසස්වීම්	-
ආවරණ පත්වීම් ස්ථිර කිරීම	-

ස්ථාන මාරුවීම්	25
කොන්ත්‍රාත් පත්වීම්	-
නව බඳවා ගැනීම්	-
එකතුව	**81**

නැවත පත්වීම් ලබා දීම

පත්වීමේ ස්වභාවය	**සංඛ්‍යාව**
	2023
නැවත පත්වීම්	04
එකතුව	**04**

ප්‍රායෝගික පුහුණුව ලබාදීම

පත්වීමේ ස්වභාවය	**සංඛ්‍යාව**
	2023
පරිගණක අංශයේ පුහුණු	15
ගිණුම් අංශයේ පුහුණු	02
කාර්මික අංශයේ පුහුණු	105
එකතුව	**122**

විධායක නොවන ස්ථාන මාරුවීම්

ස්වභාවය	**සංඛ්‍යාව**
	2023
ස්ථාන මාරුවීම්	811
එකතුව	**811**

විනය අංශය

විනය ලිපිගොනු විස්තරය

පත්වීමේ ස්වභාවය	**සංඛ්‍යාව**
	2023
අවසන් කරන ලද විනය ලිපිගොනු	2537
අවසන් කරන ලද අභියාචනා ලිපිගොනු	181
එකතුව	**2718**

ජංගම පරීක්ෂණ අංශය

2023 ජනවාරි සිට ජූලි දක්වා මධ්‍යම ජංගම පරීක්ෂණ අංශයේ වාර්ථාව

මාසය	පරීක්ෂණ වාර ගණන	පරීක්ෂා කළ බස් රථ ගණන	බරපතල විෂමාචාර (IV)	සුළු විෂමාචාර (V)	මගී දඩ ගණන	දඩ මුදල (රු)
ජනවාරි	490	7,037	77	70	109	78,884.00
පෙබරවාරි	597	7,614	86	103	149	87,269.00
මාර්තු	591	7,576	84	95	134	78,220.00
අප්‍රේල්	473	7,218	47	57	146	82,091.00
මැයි	616	7,486	73	68	144	84,922.00
ජුනි	620	7,606	100	62	155	99,782.00
ජූලි	544	6,821	50	101	160	93,823.00
	3,931	**51,358**	**517**	**556**	**997**	**604,991.00**

2023 සැප්තැම්බර් 11 සිට දෙසැම්බර් 31 දක්වා ජංගම පරීක්ෂණ වාර්ථාව

	පරීක්ෂණ වාර ගණන	පරීක්ෂා කළ බස් රථ ගණන	බරපතල විෂමාචාර (IV)	සුළු විෂමාචාර (V)	මගී දඩ ගණන	දඩ මුදල (රු)
සැප්තැම්බර් 11 සිට සැප්තැම්බර් 17 දක්වා	85	961	12	13	11	4,250.00
සැප්තැම්බර් 18 සිට සැප්තැම්බර් 24 දක්වා	88	1084	12	14	24	11,434.00
සැප්තැම්බර් 25 සිට ඔක්තෝම්බර් 01 දක්වා	95	1274	21	31	32	19,782.00
ඔක්තෝම්බර් 02 සිට ඔක්තෝම්බර් 08 දක්වා	92	1139	12	18	32	20,970.00
ඔක්තෝම්බර් 09 සිට ඔක්තෝම්බර් 15 දක්වා	114	1243	12	23	24	19,296.00
ඔක්තෝම්බර් 16 සිට ඔක්තෝම්බර් 22 දක්වා	105	1322	14	22	30	24,498.00
ඔක්තෝම්බර් 23 සිට ඔක්තෝම්බර් 29 දක්වා	127	1528	11	30	38	19,752.00
ඔක්තෝම්බර් 30 සිට නොවැම්බර් 05 දක්වා	170	2065	20	25	34	26,107.00
නොවැම්බර් 06 සිට නොවැම්බර් 12 දක්වා	181	2127	16	57	62	32,291.00
නොවැම්බර් 13 සිට නොවැම්බර් 19 දක්වා	119	1472	22	26	39	23,150.00
නොවැම්බර් 20 සිට නොවැම්බර් 26 දක්වා	133	1368	13	30	30	18,856.00
නොවැම්බර් 27 සිට දෙසැම්බර් 03 දක්වා	107	1217	14	24	28	15,435.00
දෙසැම්බර් 04 සිට දෙසැම්බර් 10 දක්වා	229	2056	23	26	56	35,535.00
දෙසැම්බර් 11 සිට දෙසැම්බර් 17 දක්වා	127	1412	15	28	34	19,152.00
දෙසැම්බර් 18 සිට දෙසැම්බර් 24 දක්වා	133	1699	20	20	31	18,672.00
දෙසැම්බර් 25 සිට දෙසැම්බර් 31 දක්වා	124	1351	16	10	18	8,626.00
එකතුව	**2029**	**23,318**	**253**	**397**	**523**	**317,806.00**

සංවර්ධන හා සැලසුම් අංශය

- 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.
- 2023 – 2025 සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂක මණ්ඩල වාර්තා, කළමනාකරණ කමිටු වාර්තා ඇතුලු අනිකුත් ඉදිරිපත් කිරීම් අවශ්‍යතාවය පරිදි වර්ෂය පුරාවට සකස්කර ලබාදීම.
- ප්‍රාදේශීය ප්‍රගති සමාලෝචන රැස්වීම් කාර්තු වශයෙන් පවත්වා ප්‍රගති සමාලෝචනයන් සිදු කිරීම.
- ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා අයවැය සම්බන්ධව වැඩමුළු සංවිධානය කර ක්‍රියාවට නැංවීම.
- තොරතුරු නිලධාරී වශයෙන් තොරතුරු ඉල්ලුම්කරුවන් වෙත අදාළ තොරතුරු ලබාදීමට කටයුතු කිරීම හා ශ්‍රී ලංගම වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරියේ තොරතුරු නිලධාරී වශයෙන් පෙනී සිටීම.
- ජනාධිපති කාර්යාලය සමඟ සම්බන්ධ වී ඉල්ලුම්කර ඇති වාර්තා ඉදිරිපත් කිරීම.
- අග්‍රාමාත්‍ය කාර්යාලය සමඟ සම්බන්ධ වී ඉල්ලුම්කර ඇති වාර්තා ඉදිරිපත් කිරීම.
- ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී ඉල්ලුම්කර ඇති වාර්තා ඉදිරිපත් කිරීම.
- මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධ වී ඉල්ලුම්කර ඇති වාර්තා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධ වී ඉල්ලුම්කර ඇති වාර්තා ඉදිරිපත් කිරීම.
- ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී ඉල්ලුම්කර ඇති වාර්තා ඉදිරිපත් කිරීම.
- වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී ඉල්ලුම්කර ඇති වාර්තා ඉදිරිපත් කිරීම.

ටෙන්ඩර් අංශය

<u>ටෙන්ඩර් මණ්ඩල අංශය විසින් මීළඟ කැඳවන ලද කාර්යය විස්තර පහත සඳහන් පරිදි වේ.</u>

අනු අංකය	ලංසු ලේඛන නිකුත් කළ දිනය	කරන ලද කාර්යයන්	ටෙන්ඩරය විවෘත කළ දිනය
01	2022-12-30	අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා අවශ්‍ය ඉදිරි දින 10 අමුද්‍රව්‍ය අවශ්‍යතාවය මිලදි ගැනීම.	2023-01-03
02	2022-12-30	ප්‍රධාන කාර්යාලීය ආපන ශාලාව පවත්වාගෙන යාම.	2023-01-05
03	2023-01-04	අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා නව යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම.	2023-02-03
04	2022.12.29	2023 වර්ෂය සඳහා වාර ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කිරීම.	2023.01.09
05	2023-01-12	2023/2024 වර්ෂ සඳහා ශ්‍රී ලංගම වාහන රක්ෂණය කිරීම.	2023-01-24
06	2023-01-13	ශ්‍රී ලංගම රථ වාහන සඳහා එන්ජින් ඔයිල් මිලදි ගැනීම.	2023-01-19
07	2023-01-13	ශ්‍රී ලංගම සඳහා ති්න්ත මිලදි ගැනීම.	2023-01-20
08	2023-01-23	ශ්‍රී ලංගම අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා කියුරින් ටියුබ් සහ කියුරින් එන්විලොප් ලබාගැනීම.	2023-02-09
09	2023-01-25	ශ්‍රී ලංගම අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා දින 10 ක අමුද්‍රව්‍ය අවශ්‍යතාවය මිලදි ගැනීම.	2023-02-17
10	2023-01-30	2023 වර්ෂය සඳහා ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය 150 Amph බැටරි මිලදි ගැනීම.	2023-02-21
11	2023-01-30	2023 වර්ෂය සඳහා ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය ටියුබ් සහ කරපටි මිළදි ගැනීම.	2023-02-22
12	2023-02-24	ශ්‍රී ලංගම අම්පාර ටයර් කර්මාන්ත ශාලාව සඳහා ත්‍රෛමාසික අමුද්‍රව්‍ය අවශ්‍යතාවය මිලදි ගැනීම.	2023-03-16
13	2023-03-01	2023 වර්ෂය සඳහා ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය ටිකට් රෝල් මිලදි ගැනීම.	2023-03-21
14	2023-03-03	2023 වර්ෂය සඳහා ශ්‍රී ලංගම ආයතනයන්ට පුද්ගලික ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යාමේ ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම.	2023-03-23

15	2023-03-03	ශ්‍රී ලංගම සඳහා අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි අමතර කොටස් මිලදි ගැනිම.	2023-03-21
16	2023-03-03	ශ්‍රී ලංගම සඳහා විදුලි අමතර කොටස් මිලදි ගැනිම**.** **(**W-20)	2023-03-22
17	2023-03-03	ශ්‍රී ලංගම සඳහා බ්‍රේක් ලයිනර්ස් මිලදි ගැනිම. **(**W-2**1)**	2023-03-22
18	2023-03-03	ශ්‍රී ලංගම සඳහා බෙයාරින් මිලදි ගැනිම.	2023-03-22
19	2023-03-03	ශ්‍රී ලංගම සඳහා ටාටා එන්ජින් සහ ගියර් පෙට්ටි අමතර කොටස් මිලදි ගැනිම. **(**W-**6)**	2023-03-24
20	2023-03-03	ශ්‍රී ලංගම සඳහා ඉන්ධන පොම්ප අමතර කොටස් සහ ෆිල්ටර්ස් මිලදි ගැනිම.	2023-03-24
21	2023-03-07	ශ්‍රී ලංගම සඳහා අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් මිලදි ගැනිම.	2023-03-28
22	2023-03-07	ශ්‍රී ලංගම සඳහා ග්‍රීස් සහ ලිතිසි තෙල් මිලදි ගැනිම.	2023-03-28
23	2023-03-07	2023 වර්ෂය සඳහා නව ටයර් මිලදි ගැනිම.	2023-03-28
24	2023-03-08	මාස 04 ක කාලයක් සඳහා 2023 වසර සඳහා ටයර් නැවත පිරවිම සහ පෙරසවි කිරිම.	2023-03-29
25	2023-03-08	ශ්‍රී ලංගම බස්රථ සඳහා බ්‍රේක්, ස්ප්‍රිං, බැටරි අමතර කොටස් සහ ඔයිල් සීල් මිලදි ගැනිම.	2023-04-04
26	2023-03-15	ශ්‍රීලංගම ප්‍රධාන කාර්යාලය සඳහා දින මුද්‍රා සහ නිල මුද්‍රා සකස් කර මිලදි ගැනිම.	2023-03-29
27	2023-03-21	ශ්‍රී ලංගම කතරගම විශ්‍රාම ශාලාවේ අලුත්වැඩියා කාර්යයන් (වැසිකිළි පද්ධති 04 ක් අලුත්වැඩියාව)	2023-04-04
28	2023-03-21	ශ්‍රී ලංගම කතරගම විශ්‍රාම ශාලාවේ කාමර සහ විවෘත ප්‍රදේශයන් හි නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සම්බන්ධවයි.	2023-04-04
29	2023-03-14	**යු-ටෝන් බස්රථ සඳහා අවශ්‍ය 150** Amph **බැටරි 250 ක් මිලදි ගැනිම.**	2023-03-31
30	2023-03-14	**යු-ටෝන් බස්රථ සඳහා අවශ්‍ය** 10R 22.5 **ටයර් මිලදි ගැනිම.**	2023-03-31
31	2023-03-25	**ශ්‍රී ලංගම බස්රථ සඳහා අවශ්‍ය 295/80**R 22.5 **ටයර් 85 ක් මිලදි ගැනිම.**	2023-04-28
32	2023-06-02	**2023 වර්ෂය සඳහා 295/80**R 22.5 **ටයර් 1555 ක් මිලදි ගැනිම.**	2023-06-22
33	2023-07-13	ප්‍රධාන කාර්යාලීය ආපනශාලාව පත්වාගෙන යාම	2023-07-26
34	2023-07-11	2023 වර්ෂය සඳහා රෙක්සින් මිලදි ගැනිම	2023-08-02
35	2023-08-08	ශ්‍රී ලංගම සඳහා එන්ජින් කට්ටල් 75 ක් මිලදි ගැනිම	2023-08-24
36	2023-08-11	අම්පාර ටයර් කම්හලේ බඟින් කුඩු විකිණිම.	2023-08-28
37	2023-08-14	විදුලි කෝෂ මගින් ක්‍රියාත්මක බස්රථ 200 ක් ධාවනයට යෙදවිම වෙනුවෙන් රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම.	2023-09-12
38	2023-08-14	ශ්‍රී ලංගම බස්රථ සඳහා ටාටා වැසි අමතර කොටස් මිලදි ගැනිම **(W-6)**	2023-08-24
39	2023-08-16	සංචාරක ව්‍යාපෘතියට අදාල දෙමහල් බස්රථ වලට විදුලි උපාංග සවිකිරිම.	2023-08-21
ඇස්තමේන්තු පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ප්‍රතිශෝධනය බලපාන්නේ ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදයට පමණක් නම් එම කාල පරිච්ඡේදයේදීද ප්‍රතිශෝධනය පවත්නා සහ අනාගත යන කාල පරිච්ඡේද දෙකටම බලපාන්නේ නම්, ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදය සහ අනාගත කාල පරිච්ඡේදයේදීද ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිබඳ ප්‍රතිශෝධන පිළිගනු ලැබේ.

2.5 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වනුයේ මුදල්, බැංකු ශේෂ සහ මණ්ඩලයේ ව්‍යාපාරික කටයුතුවල සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය හෝ වාර්තාකරණ දිනයේ සිට එක් වර්ෂයක් යන දෙකෙන් කෙටි කාලය තුළ මුදල් වශයෙන් උපලබ්ධි කරගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන අයිතමයන්ය. ජංගම වත්කම් හැර සෙසු වත්කම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට එක් වර්ෂයක කාල පරිච්ඡේදයෙන් ඔබ්බට තබා ගැනීමට මණ්ඩලය අපේක්ෂා කරන වත්කම්වේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකාරක අලාභ තිබේ නම් ඒවා කපා හැරීමෙන් පසු පිරිවැය වශයෙනි.

(අ) අයිති වත්කම්

දේපල, පිරියත හා උපකරණ අයිතමයක පිරිවැය සමන්විත වන්නේ, එය මිලට ගත් මිලෙන් සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා එම වත්කම ක්‍රියාකාරක තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි යම් පිරිවැයක් තිබේ නම් එයින් ද වේ. තනිව ගොඩනැඟුණු වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල සහ සෘජු ශ්‍රමයේ පිරිවැයද අපේක්ෂිත භාවිතය සඳහා එම වත්කම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි යම් පිරිවැයක් තිබේ නම් එම පිරිවැය ද ඇතුළත්වේ. අයිතම ගලවා ඉවත් කිරීමේ සහ ඒවා පිහිටුවන ස්ථානයේ නැවත ගබඩා කිරීමේ පිරිවැය සහ සුදුසුකම් ලබන වත්කම් පිළිබඳ ණය ගැණුම් පිරිවැයද මෙයට ඇතුළත්වේ.

වත්කමක වැදගත් අංශ වෙන් වෙන්ව හඳුනාගනු ලබන අතර, එය වෙන් වෙන්ව ක්ෂය කරනු ලැබේ.

(ආ) තදනත්තර පිරිවැය

දේපල, පිරියත හා උපකරණ අයිතමයක යම් කොටසක් සම්බන්ධයෙන් වන විට එම කොටසේ අන්තර්ගත වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි වන්නේ නම්, එම කොටස ප්‍රසම්පාදනය කිරීමේ පිරිවැය එම අයිතමයේ ධාරක අගය පිළිගනු ලැබේ. ප්‍රසම්පාදනය කරන ලද කොටසේ ධාරක අගය පිළිගැනීමෙන් බැහැර කෙරේ.

දේපල, පිරියත සහ උපකරණ එදිනෙදා අළුත්වැඩියා කිරීමේ පිරිවැය එය දරණ අවස්ථාවේදී ලාභාලාභ ගිණුමෙහි පිළිගනු ලැබේ.

(ඇ) ක්ෂය කිරීම

ක්ෂය ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය සඳහා ආදේශනය කළ වෙනත් මුදල් ගණනයෙන් එහි ශේෂ වටිනාකම අඩු කළ විට ලැබෙන ක්ෂය කළ හැකි මුදල මත වේ. දේපල,පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටස ප්‍රයෝජනයට ගත හැකි ඇස්තමේන්තු කළ ජීවිත කාල පදනම අනුව සරල රේඛා පදනම මත ලාභ අලාභ ගිණුමේ ක්ෂය කිරීම් පිළිගනු ලබන අතර, ඊට හේතුව වත්කමේ අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව එහි ඉතා සමීපව පිළිබිඹුවීමය. කල්බදු කාල පරිච්ඡේදය අවසාන වන විට සමාගම හිමිකාරීත්වය ලබාගැනීම සාධාරණව නිසැක වන්නේ නම් මිස කල්බදු කාල පරිච්ඡේදය සහ කල්බදු දෙන ලද වත්කම් ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාල පරිච්ඡේදය යන දෙකෙන් කෙටි කාල පරිච්ඡේදය සඳහා කල්බදු දෙන ලද වත්කම් ක්ෂය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීව කාල පහත දැක්වේ.

වත්කම් ගණය	ප්‍රයෝජනවත් ජීවිත කාලය (අවුරුදු)	ක්ෂය කරනු ලබන ප්‍රමාණය (%)
ගොඩනැඟිලි	40	2.5%
බස්රථ සහ වෙනත් වාහන	8	12.5%
පිරියත සහ උපකරණ	10	10%
ගෘහ භාණ්ඩ සහ සවිකුරු	10	10%
පරිගණක	4	25%
බස් එන්ජින්	5	20%

වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය ප්‍රයෝජනයට ගත හැකිව තිබෙන අවස්ථාවේදී වන අතර, වත්කම් ක්ෂය කිරීම අවසාන වන්නේ වත්කම්, වත්කම විකිණීමට තිබෙන ලෙස වර්ගීකරණය කරනු ලබන දිනය සහ වත්කම පිළිගැනීමෙන් ඉවත් කරනු ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේ දීය.

ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනයට ගත හැකි ජීවිත කාල වටිනාකම් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලබන අතර, අවශ්‍ය නම් නැවත ගලපනු ලැබේ.

(ඈ) පිළිගැනීම ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් අපහරණය කරනු ලැබූ විට හෝ එය ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ අපහරණය කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කරනු නොලබන විට එම අයිකමයේ ධාරක මුදල පිළිගැනීම ඉවත් කරනු ලැබේ. එම පිළිගැනීම ඉවත් කිරීමෙන් හටගන්නා වාසි හෝ පාඩු ලාභාලාභ ගිණුමේ වෙනත් ආදායම් තුළ පිළිගනු ලැබේ.

3.2 කල්බදුපදනම මත මිලදී ගත් වත්කම්

හිමිකාරීත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් මණ්ඩලය භාරගන්නා කල්බදු, මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ආරම්භක පිළිගැනීම සිදු කරනු ලැබූ විට, කල්බදු දෙන ලද වත්කමේ සාධාරණ වටිනාකම සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට සමාන මුදලකට වත්කම් මැන ප්‍රාග්ධනගත කරනු ලැබේ. ආරම්භක පිළිගැනීමට අනතුරුව, එම වත්කමට අදාල වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව වත්කම් ගිණුම්ගත කරනු ලැබේ.

සෙසු කල්බදු වනුයේ ක්‍රියාත්මක වන කල්බදු වන අතර, ආයෝජන දේපල සම්බන්ධයෙන් හැරුනු විට කල්බදු දෙනු ලබන වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ මණ්ඩලයේ ප්‍රකාශයේ පිළිගනු නොලැබේ.

3.3 ආයෝජන දේපල

ආයෝජන දේපල යනු බදු ආදායමක් උපයා ගැනීමට හෝ ප්‍රාග්ධනය වර්ධනය කර ගැනීමට හෝ ඒ දෙකම සඳහා බලපානු ලබන, එනමුත් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය භාවිතා කරමින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීම හෝ පරිපාලන කාර්යයන් සඳහා තබා ගනු නොලබන දේපල වන්නේය. ආයෝජන දේපල මනිනු ලබන්නේ පිරිවැයට අනුවය.

දේපල භාවිතය ආයෝජන දේපලවල සිට හිමිකරු පදිංචි දේපලවලට මාරු වූ විට, එම දේපල, පිරියත සහ උපකරණ වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

3.4 කරගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍රයේ දිනයේදී ප්‍රාග්ධනගත කරනු නොලැබූ, වර්ෂය තුළදී දරණ ලද ප්‍රාග්ධන වියදම්, කරගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුළ ප්‍රාග්ධනගත කරනු ලැබ ඇති සහ භාවිතයට යොදා ගෙන ඇති වත්කම් දේපල, පිරියත සහ උපකරණ විෂයට මාරු කරනු ලැබ ඇත.

3.5 අස්පෘශ්‍යනීය වත්කම්

වත්කම්වලට ආරෝපණය කළ හැකි ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම් සහ වත්කම්වල පිරිවැය අස්පෘශ්‍ය වත්කම් - 38 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු කොට ඉදිරියට ගෙන යනු ලබන්නේ නම් යම් වත්කමක් අස්පෘශ්‍යනීය වත්කමක් ලෙස පිළිගනු ලැබේ.

නියත ජීවිත කාල ඇති අස්පෘශ්‍යනීය වත්කම් ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලබන අතර, අස්පෘශ්‍යනීය වත්කම් හානියට පත්විය හැකි බවට ඇඟවීමක් තිබෙන ඕනෑම අවස්ථාවකදී හානියට පත්වීම පිළිබඳ තක්සේරුවක් කරනු ලැබේ. නියත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් තිබෙන අස්පෘශ්‍යනීය වත්කමකට අදාල ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂ ක්‍රමය යටත් පිරිසෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ.

නිශ්චිත නොවන ප්‍රයෝජනවත් ජීවිත කාල ඇති අස්පෘශ්‍යනීය වත්කම් තනි තනිව හෝ මුදල් ජනනය වන ඒකක මට්ටමේදී හානියට පත්වීම සම්බන්ධයෙන් වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ.

3.6 මූල්‍ය නොවන වත්කම් හානියට පත්වීම

හානියට පත්වන බවට යම් හැඟීමක් තිබේද යන බව නිශ්චය කිරීම සඳහා වත්කම්වල ධාරක ප්‍රමාණය, වාර්තා කරන එක් එක් දිනයේදී සමාලෝචනය කරනු ලැබේ. එබඳු යම් හැඟවීමක් තිබේ නම් එවිට වත්කම වෙනුවෙන් අය කරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරක මුදල හෝ මුදල් ජනනය වන ඒකකය එහි අයකර ගත හැකි මුදලට වැඩි වන්නේ නම් හානියට පත්වීමේ අලාභයක් පිළිගනු ලැබේ. අයකර ගත හැකි මුදල නිශ්චය කිරීම සඳහා භාවිතා කරනු ලබන ඇස්තමේන්තුවල වෙනසක් තිබුණේ වී නම් හානියට පත්වීමේ අලාභය ප්‍රතිශෝධනය කරනු ලැබේ.

3.7 වට්ටෝරු බඩු

වට්ටෝරු බඩු මනිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම යන දෙකෙන් අඩු මුදලට අනුවය.

වට්ටෝරු බඩුවල පිරිවැය සමන්විත වන්නේ මිලට ගැනීම්වල සියලුම පිරිවැය පරිවර්තනය කිරීමට සහ බඩු වට්ටෝරු අයිතමයන් දැනට බඩු පවත්නා ස්ථානවලට සහ තත්ත්වයට ගෙන ඒමට දැරීමට සිදුවන වෙනත් පිරිවැය වලිනි.

උපලබ්ධි කරගත හැකි ශුද්ධ වටිනාකම වනුයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යන අතරතුරේදී තක්සේරු කරන ලද විකුණුම් මිලෙන් ඇස්තමේන්තු කළ සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකිණීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුවල පිරිවැය අඩු කිරීමෙන් ලැබෙන වටිනාකමයි.

වට්ටෝරු බඩුවල පිරිවැය නියම කරනු ලබන්නේ ඒවා එකිනෙකෙහි පිරිවැය නිශ්චිතව හඳුනාගැනීම සහ පළමුව ඇතුළු කළ දෙය පළමුව බැහැර කිරීමේ සූත්‍ර භාවිතා කිරීම මඟිනි.

3.8 මූල්‍ය වත්කම්

3.8.1 ආරම්භක පිළිගැනීම සහ ගණනය කිරීම

39 වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල විෂය පථය තුළ මූල්‍ය වත්කම් අදාල පරිදි ලාභ හෝ අලාභ මඟින් දැක්වෙන සාධාරණ මූල්‍ය වටිනාකමෙන් යුත් මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ කල් පිරීම තෙක් තබාගනු ලබන ආයෝජන විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් යනුවෙන් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම් ආරම්භයේදී පිළිගනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමට සාධාරණ වටිනාකම නොවන වත්කම් සම්බන්ධයෙන් වන විට ලාභාලාභ ගිණුම මඟින් සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු කිරීමේ පිරිවැයද එකතු කිරීම මඟිනි.

ශ්‍රී ලංගමයේ මූල්‍ය වත්කම්වලට, මුදල් සහ කෙටි කාලීන ආයෝජනද, වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දේවල්ද, කාර්යය මණ්ඩල ණය සහ වෙනත් ලැබිය යුතු දේවල්ද ඇතුළත්වේ.

3.8.2 තදනන්තර මැනීම

මූල්‍ය වත්කම් තදනන්තරව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතියි.

(අ) ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්

ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම්වලට වෙෙළඳාම සඳහා තබාගනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභාලාභ හිණුම් මඟින් සාධාරණ වටිනාකම මත ආරම්භක පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ලබාගෙන ඇත්තේ විකිණීම සඳහා හෝ නුදුරු කාලයේදී නැවත මිලට ගැනීම සඳහා නම්, එම වත්කම් වෙළෙඳාම සඳහා ලබා ගනු ලබන වත්කම් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

(ආ) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ වූ කලී සක්‍රීය වෙළෙඳපලක මිල ඉදිරිපත් නොකළ ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන්නේය. ආරම්භක ගණනයෙන් අනතුරුව එබඳු මූල්‍ය වත්කම් හානියට පත්වීම අඩු කළ ඵලදායී පොළී ප්‍රමාණ ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මත තදනන්තරව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණන් බලනු ලබන්නේ අත්පත් කර ගැනීමේ යම් වට්ටමක් හෝ පරිතෝෂිතයක් සහ ඵලදායී පොළී ප්‍රමාණයේ අත්‍යාවශ්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය ගැනද සැලකිල්ලට ගනිමින්ය. ඵලදායී පොළී ප්‍රමාණයේ ක්‍රමක්ෂය, ආදායම් ප්‍රතිශතයෙහි මූල්‍ය ආදායමෙහි ඇතුළත් කර තිබේ.

හානියට පත්වීමෙන් පැන නඟින අලාභ, ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයෙහි පිළිගනු ලැබේ.

(ඇ) කල්පිරීම දක්වා තබාගනු ලබන ආයෝජන

නියමිත හෝ නිශ්චය කරනු ලැබීමට හැකි ගෙවීම් සහ නියමිත කල් පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඒවා කල්පිරීම දක්වා තබා ගැනීමේ ධනාත්මක චේතනාවක් සහ හැකියාවක් ශ්‍රී ලංගමයට තිබෙන විට කල්පිරීම දක්වා ලබා ගනු ලබන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ආරම්භක ගණනයෙන් අනතුරුව කල්පිරීම දක්වා ලබා ගනු ලබන ආයෝජන ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් හානිය අඩු කොට ක්‍රමක්ෂ පිරිවැයට අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂ පිරිවැය ගණන් බලනු ලබන්නේ අත්කර ගැනීමට අදාල යම් වට්ටමක් හෝ පාරිතෝෂිතයක් සහ ඵලදායී පොළී ප්‍රමාණයේ අවශ්‍ය කොටසක් සහ ගාස්තු සහ පිරිවැය සැලකිල්ලට ගනිමින්ය. ඵලදායී පොළී ප්‍රමාණයේ ක්‍රමක්ෂයන්ට ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායමද ඇතුළත්වේ. හානියට පත්වීමෙන් පැන නඟින අලාභ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයක් ලෙස පිළිගනු ලැබේ.

(ඈ) විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජන

විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජනවලට සාධාරණත්ව කොටස් සහ ණය සුරකුම් ඇතුළත්වේ. විකිණීමට ඇති ආකාරය අනුව වර්ගීකරණය කරන ලද සාධාරණත්ව කොටස් ආයෝජන වනුයේ වෙළෙඳාම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කරනු ලැබුණේවත්, ලාභ අලාභ හිණුම මඟින් සාධාරණ වටිනාකමක් ලෙස නම් කරනු ලැබුණේවත් නොමැති ආයෝජනයන්ය. මෙම ගණයට අයත් ණය සුරකුම් වනුයේ අනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා තබාගැනීමට අපේක්ෂා කරනු ලබන්නාවූද, ද්‍රවශීලතා අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළෙඳපොල තත්ත්වයන්ගේ වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් හෝ විකුණනු ලැබිය හැකි සුරකුම්ය.

ආරම්භක ගණනය කිරීමෙන් අනතුරුව විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජනයන් ආයෝජනය පිළිගැනීම ඉවත් කර ගනු ලබන තෙක් විකිණීමට තිබෙන සංචිතයේ සෙසු පූර්ණ ආදායම් ලෙස පිළිගන්නා ලද උපලබ්ධි නොවූ ලැබීම් හෝ අලාභ සමඟ සාධාරණ වටිනාකමකට පසුව ගණනය කරනු ලැබේ.

3.8.3 පිළිගැනීම ඉවත් කිරීම

i. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිවාසිකම් කල් ඉකුත් වී ඇති විට,

ii. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට තමන්ට තිබෙන අයිතිවාසිකම් ශ්‍රී ලංගම විසින් පවරා දී ඇති විට හෝ ලැබුණු මුදල් ප්‍රවාහ සම්පූර්ණයෙන්ම සැලකිය යුතු තරමේ ප්‍රමාණයකින් තොරව එතෙරවීමේ වැඩ පිළිවෙලක් යටතේ තුන්වන පාර්ශවයකට ගෙවීමේ බැඳීමකට එළඹී ඇතිවිට සහ

(අ) වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් ශ්‍රී ලංගම විසින් පවරාදී ඇත්තාවූ හෝ

(ආ) වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු තරමින් ශ්‍රී ලංගම පවරාදී හෝ රඳවාගෙන නොමැති, එහෙත් වත්කමෙහි පාලනය පවරා දී ඇති අවස්ථාවකදී

මූල්‍ය වත්කමක් හෝ (අදාල අවස්තාවකදී මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ එක සමාන මූල්‍ය වත්කම් සමූහයකින් කොටසක්) පිළිගැනීමෙන් ඉවත් කරනු ලැබේ.

3.8.4 මූල්‍ය වත්කම් හානියට පත්වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානියට පත් වී ඇති බවට යම් විෂය මූල සාක්ෂියක් තිබේද යන බව වාර්තා කරන එක් එක් දිනයකදී ශ්‍රී ලංගම විසින් තක්සේරු කරනු ලැබේ. වත්කමේ ආරම්භක පිළිගැනීමට පසුව සිදු වූ සිද්ධි එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ බවට විෂය මූලික සාක්ෂි තිබේ නම් පමණක් සහ අලාභ සිද්ධිය මඟින් විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහ කෙරෙහි බලපෑමක් ඇති කෙරේ නම් යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානියට පත් වූ ලෙස සලකනු ලැබේ. ණයකරු හෝ ණයකරුවන් කණ්ඩායම සැලකිය යුතු තරමේ මූල්‍ය දුෂ්කරතාවයන් පැහැරහැරීම් හෝ අපචාරවලට යටත්වීමේ සහ ඔවුන් වස්තු භංගත්වයට පත්වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට යටත්වීමේ සම්භාවිතාවය අත්දැකීම් සහ පැහැරගැනීම්වලට සම්බන්ධ ආර්ථික තත්ත්වයක් පිළිබඳ වෙනස්වීම් වැනි ඇස්තමේන්තු කළ හැකි අනාගත මුදල් ප්‍රවාහයන්හි ගණනය කළ හැකි තරම් පහත වැටීමක් තිබෙන බව නිරීක්ෂණය කළ හැකි දත්තවලින් දැක්වෙන බවට ඇඟවීම්ද, හානියට පත්වීම් පිලිබඳ සාක්ෂිවලට ඇතුළත්ව විය හැකිය.

3.9 මුදල් සහ මුදල් සමානයන්

මුදල් සහ මුදල් සමානයන් සමන්විත වන්නේ මුදල් ශේෂ, ඉල්ලුම් තැන්පතු, මුදල්වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කරනු ලැබිය හැකි සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා ඉල්ලූවිට ආපසු ගෙවිය යුතු බැංකු අයිරා අඩු කළ විට වටිනාකම වෙනස්වීමේ නොවැදගත් අවදානමට යටත් අධික ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජන වලිනි.

3.10 මූල්‍ය බැරකම්

අංක 39 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ විෂය පථය තුළ මූල්‍ය බැරකම්වල ආරම්භක පිළිගැනීම සහ ගණනය කිරීම ලාභාලාභ ගිණුම මඟින් ක්‍රමක්ෂ පිරිවැය මත සාධාරණ වටිනාකමෙන් යුත් මූල්‍ය බැරකම් ලෙස හෝ අදාල පරිදි ඵලදායක රැකවරණයකදී රැකවරණ සාධාරණ පත්‍ර ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ස්වකීය මූල්‍ය බැරකම් ආරම්භයේදී පිළිගැනීම පිළිබඳ වර්ගීකරණය ශ්‍රී ලංගම විසින් නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය බැරකම් ආරම්භයේදී සාධාරණ වටිනාකම මත පිළිගනු ලබන අතර, ණය සහ ඉල්ලා ගත් මුදල් ක්‍රමක්ෂ පිරිවැය මත ඉදිරියට ගෙන යනු ලැබේ. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ශ්‍රී ලංගමයේ මූල්‍ය බැරකම්වලට ඇතුළත් වේ.

3.10.1 තදනන්තර ගණනය කිරීම

මූල්‍ය බැරකම් පිළිබඳ තදනන්තර ගණනය කිරීම් කරනු ලබන්නේ ක්‍රමක්ෂ පිරිවැය මතය.

3.10.2 පිළිගැනීම ඉවත් කිරීම

බැරකම් යටතට වැටෙන බැඳීමක් බේරුම් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ අවසන් වන අවස්ථාවේදී මූල්‍ය බැරකම් පිළිගැනීම ඉවත් කෙරෙන්නේය.

3.11 මූල්‍ය සාධන හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන්නේ සහ ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන්නේ පිළිගන්නා ලද මුදල් ගණන් හිලව් කිරීමට වර්තමානයේ ක්‍රියාත්මක කළ හැකි නෛතික අයිතිවාසිකමක් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ සමගාමීව වත්කම් උපලබ්ධි කරගැනීමට සහ බැරකම් නිරවුල් කිරීමට චේතනාවක් තිබෙන්නේ නම් පමණකි.

3.12 පශ්චාත් රැකියා ප්‍රතිලාභ

3.12.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සමාගම

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ නියමිත පරිදි සුදුසුකම් ඇති සියලුම සේවකයන් සඳහාවූ ප්‍රතිලාභ සැලැස්ම මණ්ඩලය විසින් යොදා ගනු ලැබ ඇත. ප්‍රතිලාභ සැලැස්ම සඳහා බැහැරින් අරමුදල් සපයනු නොලැබේ. සේවය කළ සෑම වර්ෂයක් සඳහාම එක් මසක වැටුපක් විශ්‍රාම ගැන්වීමේදී සේවකයන්ට ලබා දෙනු ලැබේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පිළිගනු ලැබ ඇති බැරකම වනුයේ, වාර්තා කරන දිනයේදී ප්‍රක්ෂේපිත සමීකරණ ක්‍රමය භාවිතා කරමින් අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකමයි. මේ අයිතමය සඳහන් කර ඇත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම නොවන බැරකම් යටතේය. ආයු ගණන වාසි හෝ අලාභ එය පැන නඟින මූල්‍ය වර්ෂය තුළ ආදායමක් හෝ වියදමක් ලෙස සෙසු පූර්ණ ආදායමෙහි පිළිගනු ලැබේ.

3.12.2 අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල්වලට සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල්වලට සුදුසුකම් ඇති සියලුම සේවකයින් අදාල ව්‍යවස්ථාවලට අනුකූලව අදාල දායකත්ව අරමුදල්වලින් ආවරණය කෙරේ. අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම්වලට ගෙවන සේවා යෝජකයාගේ දායක මුදල් ලාභාලාභ ගිණුමේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

3.13 වෙළෙඳ සහ කළ යුතු වෙනත් ගෙවීම්

වෙළෙඳ සහ කළ යුතු වෙනත් ගෙවීම් පිරිවැය අනුව දක්වනු ලැබේ.

3.14 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස විශ්වාස කටයුතුව ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ අනුමිත බැඳීමක් මණ්ඩලයට තිබේ නම් සහ බැඳීම ඉටු කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ බැහැරට ගලා යෑමක අවශ්‍යතාවය සම්භාවී වන්නේ නම් යම් ප්‍රතිදානයක් පිළිගනු ලැබේ.

3.15 සෙමෙන් අලෙවි වන තොග සඳහා ප්‍රතිපාදන

බඩු වට්ටෝරු පිළිබඳව මණ්ඩලය විසින් නිතිපතා කරනු ලබන තක්සේරුවලදී වට්ටෝරු භාණ්ඩ හානියට පත්වීම මණ්ඩලය හඳුනාගනු ලැබූ විට සෙමෙන් අලෙවි වන තොග සඳහා ප්‍රතිපාදන සලස්වනු ලැබේ.

3.16 ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිත බැරකම්

අවිනිශ්චිත බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ පැවරීමට සම්භාවී නොවන හෝ විශ්වාස කටයුතු ලෙස ගණනය කරනු ලැබිය නොහැකි අවස්ථාවලදී ඇතැම් අනාගත සිද්ධි හෝ වර්තමාන බැඳීම් මඟින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන විභව බැඳීම් වන්නේය.

පූර්ණ ආදායම් ප්‍රකාශය

3.17 ආදායම

මණ්ඩලයේ ආදායම සමන්විත වන්නේ මගී ප්‍රවාහනය මඟින් ලැබෙන ආදායමෙනි.

3.17.1 ආදායම පිළිගැනීම

ආදායම පිළිගනු ලබන්නේ ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා එනු ඇතැයි සම්භාවීවන්නාවූ, ආදායම සහ දරන ලද හෝ දැරීමට තිබෙන ආශ්‍රිත පිරිවැය විශ්වාස කටයුතු ලෙස ගණනය කළ හැකි වන්නාවූ ප්‍රමාණයටය. ආදායම ගණනය කරනු ලබන්නේ ලැබුණු හෝ ලැබීමට ඇති ප්‍රතිශ්‍යාවේ සාධාරණ වටිනාකමෙන් වෙළෙඳ වට්ටම් සහ විකුණුම් බදු අඩු කොට මණ්ඩලය තුළ විකුණුම් බැහැර කිරීමෙන් අනතුරුවය.

(අ) භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ භාණ්ඩවල හිමිකාරීත්වයේ සැලකිය යුතු තරම් වූ අවදානම් සහ ප්‍රදානයන් සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදෙන අවස්ථාවේදී ගැණුම්කරු වෙත මාරු වූ විටය.

(ආ) සේවාවන් ඉටු කිරීම

සේවාවන් සැපයීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ සේවාවන් සපයනු ලබන හෝ ඉටු කරනු ලබන කාල පරිච්ඡේදය තුළදීය.

(ඇ) වෙනත් ආදායම්

ලාභාංශවලින් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ ගෙවීම් ලැබීමට මණ්ඩලයට තිබෙන අයිතිවාසිකම තහවුරු කරනු ලැබූ විටදීය.

දේපල, පිරියත සහ උපකරණ අපහරණය කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අපහණයෙන් ලැබෙන මුදලින් වත්කම්වල ධාරක වටිනාකමෙන් සහ ඒ සම්බන්ධ වියදම්වලින් අඩු කරනු ලැබ පිළිගනු ලැබේ.

විදේශ මුදල් ඉපැයුම් සහ අලාභ ශුද්ධ පදනමක් මත වාර්තා කරනු ලැබේ.

අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලබන්නේ භාණ්ඩවල හිමිකාරීත්වයේ සැලකිය තරම්වූ අවදානම් සහ ප්‍රදානයන් සාමාන්‍යයෙන් භාණ්ඩ භාර දෙන අවස්ථාවේදී ගැණුම්කරු වෙත මාරු වූ විටදීය.

ආයෝජන දේපල මත ක්‍රියාත්මක වන කල්බදුවලට ලැබෙන කුලී ආදායම කල්බදු කාලය පුරා සරල රේඛා පදනමක් මත ගිණුම්ගත කරනු ලැබේ.

3.18 ආණ්ඩුවේ ආධාර මුදල්

ආධාර මුදල් භාර ගන්නා බවට සහ ඊට අදාල කොන්දේසි සියල්ලක්ම ඉටු කරනු ලබන බවට සාධාරණ සහතිකයක් තිබෙන අවස්ථාවලදී ආණ්ඩුවේ ආධාර මුදල් පිළිගනු ලැබේ. ආධාර මුදල වියදම් අයිතමයක් හා සම්බන්ධ වන අවස්ථාවකදී එය හානිපූර්ණය කිරීමට අපේක්ෂා කරන පිරිවැය වියදම් කරනු ලබන කාල පරිච්ඡේද පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

ආධාර මුදල වත්කමක් හා සම්බන්ධ වන විට, එය අදාල වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සමාන කොටස්වලින් ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

ශ්‍රී ලංගමට මූල්‍ය නොවන ආධාර ලැබෙන විට වත්කම හා ආධාර මුදල නාමික මුදල් ගණන් අනුව වාර්තාගත කරනු ලබන අතර අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට පාදක වූ වත්කමෙහි ප්‍රතිලාභයෙහි පරිභෝජන රටාවට අනුව සමාන වාර්ෂික කොටස්වලින් ලාභයට හෝ අලාභයට මුදා හරිනු ලැබේ. පවත්නා අදාල වෙළෙඳපොල පොළී ප්‍රමාණයට අඩු පොළී ප්‍රමාණයන් මත ආණ්ඩුව හෝ සම්බන්ධ ආයතන විසින් ණය හෝ ඊට සමාන ආධාර ලබා දෙනු ලබන විට මෙම වාසිදායක පොළිය ආණ්ඩුවෙන් ලැබෙන ආධාරයක් ලෙස සලකනු ලැබේ.

3.19 වියදම් පිළිගැනීම

3.19.1 ක්‍රියාත්මක කිරීමේ වියදම්

ව්‍යාපාරයේ එදිනෙදා කටයුතුවලදී හා දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වාගෙන යන යාමේදී දරන සියලුම වියදම් වර්ෂයේ ලාභය ගණන් බැලීමේදී පූර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබ ඇත. මූල්‍ය වත්කම් හානියට පත්වීම සෙමෙන් අලෙවි වන තොග දන්නා සියලුම බැරකම් හා දේපල, පිරියල සහ උපකරණ ක්ෂය කිරීම සඳහාද ප්‍රතිපාදන සලස්වා තිබේ.

3.19.2 කල්බදු ගෙවීම්

ක්‍රියාත්මකව පවතින කල්බදු යටතේ කරනු ලබන ගෙවීම් කල්බදු කාලපරිච්ඡේදය තුළ සරල රේඛා පදනම මත ලාභාලාභ ගිණුමේ පිළිගනු ලැබේ.

මූල්‍ය කල්බදු යටතේ කරනු ලබන අවම කල්බදු ගෙවීම, මූල්‍ය වියදම සහ හිඟව පවත්නා බැරකමේ අඩුවීම අතරේ අනුපාතිකව බෙදා වෙන් කරනු ලැබේ. බැරකමේ ඉතිරි ශේෂය මත අඛණ්ඩ කාලීන පොළී ප්‍රමාණයක් ඇති වන පරිදි මූල්‍ය වියදම කල්බදු කාල පරිච්ඡේදය තුළ එක් එක් කාල පරිච්ඡේදය සඳහා වෙන් කරනු ලැබේ.

3.19.3 ණයට ගැනීමේ පිරිවැය

වත්කමක අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා එය සූදානම් කිරීම පිණිස අත්‍යාවශ්‍යයෙන්ම සැලකිය යුතු කාලයක් ගත වන වත්කම් අත්කර ගැනීම ඉදිකිරීම හෝ නිෂ්පාදන සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණයට ගැනීමේ පිරිවැය අදාල වත්කම්වල කොටසක් ලෙස ප්‍රාග්ධනගත කරනු ලැබේ. පොළිය සහ අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලය දරන සෙසු පිරිවැය ණයට ගැනීමේ පිරිවැයට ඇතුළත් වේ.

3.19.4 ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම

මූල්‍ය ආදායම සමන්විත වන්නේ ආයෝජනය කරන ලද අරමුදල් සහ කාර්යය මණ්ඩල ණය මත ලැබෙන පොළී ආදායම සහ ලාභාලාභ ගිණුම මඟින් සාධාරණ වටිනාකමට අනුව මූල්‍ය සම්පත්වල සාධාරණ වටිනාකමේ සිදුවන වෙනස්කම්වලිනි. පොළී ආදායම ලාභාලාභ ගිණුමේ උපචිත වන ආකාරයට ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් පිළිගනු ලැබේ.

මූල්‍ය පිරිවැය සමන්විත වන්නේ ණය ගැනීම් මත පොළී වියදම් ප්‍රතිපාදන මත වට්ටම් ලිහිල් කිරීම ලාභාලාභ ගිණුම මඟින් සාධාරණ වටිනාකමට අනුව මූල්‍ය සම්පත්වල සාධාරණ වටිනාකමේ සිදුවන වෙනස්කම් මූල්‍ය වත්කම් මත පිළිගන්නා ගන්නා ලද භානිකාරක අලාභ සහ සුදුසුකම් ලබන වත්කමක් අත්පත් කරගැනීමට, ඉදිකිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුව ආරෝපණය කළ නොහැකි ණය ගැනීම් පිරිවැය යනාදියෙන් වන අතර ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභාලාභ ගිණුමේ පිළිගනු ලැබේ.

3.20 සම්බන්ධ පාර්ශව ගනුදෙනු

එක් පාර්ශවයකට අනෙක් පාර්ශවය සම්බන්ධයෙන් මූල්‍ය සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති තීරණ කෙරෙහි පාලනය කිරීමේ හෝ සැලකිය යුතු තරමේ බලපෑම් කිරීමේ හැකියාවක් ඇති ගනුදෙනු සම්බන්ධයෙන් මිළක් අය කරගනු ලැබේද නැද්ද යන බව නොසලකාම එළිදරව් කිරීම් සිදු කර තිබේ.

3.21 මුදල් ප්‍රවාහය

“ වක්‍ර ක්‍රමය ” භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා ලැබුණු පොළිය සහ ලැබුණු ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇති අතර, ගෙවන ලද ලාභාංශ සහ ගෙවන ලද ලාභාංශ සහ ගෙවන ලද පොළිය මූල්‍යකරණ මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත.

3.22 වාර්තා කිරීමෙන් පසුව සිදුවන සිද්ධි

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවන සිද්ධින් යනු වාර්තාකරණ කාල පරිච්ඡේදයේ අවසානය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අවසර දෙනු ලැබූ දිනය අතරතුර සිදුවන වාසිසහගත සහ වාසිසහගත නොවන සිද්ධීන්ය.

වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම්වල වැදගත්කම සැලකිල්ලට ගනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශවල සුදුසු ගැලපීම් හෝ එළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ගිණුම් සඳහා සටහන්

01. දේපල පිරියත හා උපකරණ

නිදහස් වත්කම්

	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	කාර්යාල උපකරණ	මෝටර් වාහන	ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන	වායු සමීකරණ	පරිගණක
2021.12.31 දිනට ශේෂය	18,898,038,572.00	2,319,327,389.54	656,534,758.87	210,774,034.65	302,204,252.76	1,041,195.32	21,317,408.69	151,831,041.61
ගැලපීම්								
එකතු කිරීම්								
ඉවත් කිරීම්								
2022.12.31 දිනට ශේෂය	18,898,038,572.00	**2,319,327,389.54**	**656,534,758.87**	**210,774,034.65**	**302,204,252.76**	**1,041,195.32**	**21,317,408.69**	**151,831,041.61**
මාරු කිරීම්		-						
එකතු කිරීම්	-	8,867,565.04	14,291,885.11	8,645,414.34	-	-	122,490.00	683,440.00
එකතු කිරීම් - ප්‍රත්‍යාගණන	11,804,898,000.00	1,517,556,480.00						
ගැලපීම් - ප්‍රත්‍යාගණන - 2023	(300,000.00)	(4,622,296.73)						
ගැලපීම් - නිවැරදි කිරීම්		(3,596,464.62)					(122,490.00)	
එකතු කිරීම් - රජයේ ප්‍රතිදාන		128,778,507.20						
ඉවත් කිරීම්								
2023.12.31 දිනට ශේෂය	30,702,636,572.00	**3,966,311,180.43**	**670,826,643.98**	**219,419,448.99**	**302,204,252.76**	**1,041,195.32**	**21,317,408.69**	**152,514,481.61**

කල්බදු වත්කම්

	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	කාර්යාල උපකරණ	මෝටර් වාහන	ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන	වායු සමීකරණ	පරිගණක
2021.12.31 දිනට ශේෂය		-	-	-	-	-	-	-
ගැලපීම්								
එකතු කිරීම්								
ඉවත් කිරීම්								
2022.12.31 දිනට ශේෂය		-	-	-	-	-	-	-
මාරු කිරීම් F/H/A								
එකතු කිරීම්								
ඉවත් කිරීම්								
2023.12.31 දිනට ශේෂය		**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**

01. දේපල පිරියත හා උපකරණ

නිදහස් වත්කම්

	බස්රථ	ගර්භිත බස්රථ	ගිනිඅවි	බස්රථ එන්ජින්	ටිකට් මැෂින්	වෙනත් වත්කම්	පරිඝණක මෘදුකාංග	එකතුව
2021.12.31 දිනට ශේෂය	11,951,576,779.61	1,367,754,792.20	133,985.20	2,138,352,394.93	266,417,397.14	75,842,984.48	36,426,971.78	38,397,573,958.78
ගැලපීම්								-
								-
එකතු කිරීම්		-						-
ඉවත් කිරීම්								-
2022.12.31 දිනට ශේෂය	**11,951,576,779.61**	**1,367,754,792.20**	**133,985.20**	**2,138,352,394.93**	**266,417,397.14**	**75,842,984.48**	**36,426,971.78**	**38,397,573,958.78**
මාරු කිරීම්								-
එකතු කිරීම්	-	-	-	-	-	-	-	32,610,794.49
එකතු කිරීම් - ප්‍රත්‍යාගණන								13,322,454,480.00
ගැලපීම් - ප්‍රත්‍යාගණන - 2023								(4,922,296.73)
ගැලපීම් - නිවැරදි කිරීම්								(3,718,954.62)
එකතු කිරීම් - රජයේ ප්‍රතිදාන	5,513,996,941.02							5,642,775,448.22
ඉවත් කිරීම්								-
								-
2023.12.31 දිනට ශේෂය	**17,465,573,720.63**	**1,367,754,792.20**	**133,985.20**	**2,138,352,394.93**	**266,417,397.14**	**75,842,984.48**	**36,426,971.78**	**57,386,773,430.14**

කල්බදු වත්කම්

	බස්රථ	ගර්භිත බස්රථ	ගිනිඅවි	බස්රථ එන්ජින්	ටිකට් මැෂින්	වෙනත් වත්කම්	පරිඝණක මෘදුකාංග	එකතුව
2021.12.31 දිනට ශේෂය	14,978,265,441.59	-	-	-	-	-	-	14,978,265,441.59
ගැලපීම්								-
								-
එකතු කිරීම්								-
ඉවත් කිරීම්								-
2022.12.31 දිනට ශේෂය	**14,978,265,441.59**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**14,978,265,441.59**
මාරු කිරීම් F/H/A								-
එකතු කිරීම්	-							-
ඉවත් කිරීම්								-
								-
2023.12.31 දිනට ශේෂය	**14,978,265,441.59**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**14,978,265,441.59**

නිදහස් වත්කම්
ක්ෂය

	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	කාර්යාල උපකරණ	මෝටර් වාහන	ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන	වායු සමීකරණ	පරිගණක
2021.12.31 දිනට ශේෂය		1,445,054.07	293,271,710.38	160,918,857.41	288,985,987.63	520,385.32	9,121,451.58	150,636,216.56
ගැලපීම්								
එකතු කිරීම්			-	-				-
ගැලපීම්								
ඉවත් කිරීම්								
2022.12.31 දිනට ශේෂය		**1,445,054.07**	**293,271,710.38**	**160,918,857.41**	**288,985,987.63**	**520,385.32**	**9,121,451.58**	**150,636,216.56**
වාර්ෂික ක්ෂය		59,791,800.26	52,740,605.83	9,014,530.67	6,930,550.00	-	1,676,088.08	5,886,212.29
ගැලපීම් - 2022 නිවැරදි කිරීම්		(35,408.71)					411,133.93	(4,790,631.57)
ගැලපීම් - 2022 ප්‍රත්‍යාගණන		(269,357.09)						
ඉවත් කිරීම්								
මාරු කිරීම් L/H/A/D								
2023.12.31 දිනට ශේෂය		**60,932,088.53**	**346,012,316.21**	**169,933,388.08**	**295,916,537.63**	**520,385.32**	**11,208,673.59**	**151,731,797.28**

කල්බදු වත්කම්

	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	කාර්යාල උපකරණ	මෝටර් වාහන	ධාවනයෙන් ඉවත් කළ වෙනත් වාහන	වායු සමීකරණ	පරිගණක
2021.12.31 දිනට ශේෂය		-	-	-	-	-	-	-
ගැලපීම්								
එකතු කිරීම්								
ඉවත් කිරීම්								
2022.12.31 දිනට ශේෂය		**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**
වාර්ෂික ක්ෂය								
එකතු කිරීම්								
ගැලපීම්								
ඉවත් කිරීම්								
මාරු කිරීම් L/H/A/D								
2023.12.31 දිනට ශේෂය		**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**
නිදහස් වත්කම් පොත් අගය		**3,905,379,091.90**	**324,814,327.77**	**49,486,060.91**	**6,287,715.13**	**520,810.00**	**10,108,735.10**	**782,684.33**
කල්බදු වත්කම් පොත් අගය		**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**
මුලු වත්කම්	**30,702,636,572.00**	**3,966,311,180.43**	**670,826,643.98**	**219,419,448.99**	**302,204,252.76**	**1,041,195.32**	**21,317,408.69**	**152,514,481.61**
මුලු ක්ෂය කිරීම්	**-**	**60,932,088.53**	**346,012,316.21**	**169,933,388.08**	**295,916,537.63**	**520,385.32**	**11,208,673.59**	**151,731,797.28**
ශුද්ධ පොත් අගය	**30,702,636,572.00**	**3,905,379,091.90**	**324,814,327.77**	**49,486,060.91**	**6,287,715.13**	**520,810.00**	**10,108,735.10**	**782,684.33**

නිදහස් වත්කම්
ක්ෂය

	බස්රථ	ගර්භිත බස්රථ	ගිනිඅවි	බස්රථ එන්ජින්	ටිකට් මැෂින්	වෙනත් වත්කම්	පරිසණක මෘදුකාංග	එකතුව
2021.12.31 දිනට ශේෂය	11,855,143,752.12	1,367,754,792.20	43,019.60	2,242,701,111.46	261,404,523.25	44,305,977.23	31,872,072.86	16,708,124,911.67
ගැලපීම්								-
එකතු කිරීම්		-				-		-
ගැලපීම්								-
ඉවත් කිරීම්								-
2022.12.31 දිනට ශේෂය	**11,855,143,752.12**	**1,367,754,792.20**	**43,019.60**	**2,242,701,111.46**	**261,404,523.25**	**44,305,977.23**	**31,872,072.86**	**16,708,124,911.67**
වාර්ෂික ක්ෂය	874,811,244.89	-	9,923.52	379,183.85	5,192,034.38	5,362,938.56	3,275,224.84	1,025,070,337.17
ගැලපීම් - 2022 නිවැරදි කිරීම		-		(106,310,510.81)	(5,612,552.36)		(2,161,853.10)	(118,499,822.62)
ගැලපීම් - 2022 ප්‍රත්‍යාගණන								(269,357.09)
ඉවත් කිරීම්								-
මාරු කිරීම් L/H/A/D								-
2023.12.31 දිනට ශේෂය	**12,729,954,997.01**	**1,367,754,792.20**	**52,943.12**	**2,136,769,784.50**	**260,984,005.27**	**49,668,915.79**	**32,985,444.60**	**17,614,426,069.13**

කල්බදු වත්කම්

	බස්රථ	ගර්භිත බස්රථ	ගිනිඅවි	බස්රථ එන්ජින්	ටිකට් මැෂින්	වෙනත් වත්කම්	පරිසණක මෘදුකාංග	එකතුව
2021.12.31 දිනට ශේෂය	13,065,562,509.26	-	-	-	-	-	-	13,065,562,509.26
ගැලපීම්								-
එකතු කිරීම්								-
ඉවත් කිරීම්								-
								-
2022.12.31 දිනට ශේෂය	**13,065,562,509.26**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**13,065,562,509.26**
වාර්ෂික ක්ෂය								-
එකතු කිරීම්								-
ගැලපීම්								
ඉවත් කිරීම්								-
මාරු කිරීම් L/H/A/D								-
2023.12.31 දිනට ශේෂය	**13,065,562,509.26**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**13,065,562,509.26**
නිදහස් වත්කම් පොත් අගය	**4,735,618,723.62**	**-**	**81,042.08**	**1,582,610.43**	**5,433,391.87**	**26,174,068.69**	**3,441,527.18**	**9,069,710,789.01**
කල්බදු වත්කම් පොත් අගය	**1,912,702,932.33**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**1,912,702,932.33**
මුලු වත්කම්	**32,443,839,162.22**	**1,367,754,792.20**	**133,985.20**	**2,138,352,394.93**	**266,417,397.14**	**75,842,984.48**	**36,426,971.78**	**72,365,038,871.73**
මුලු ක්ෂය කිරීම්	**25,795,517,506.27**	**1,367,754,792.20**	**52,943.12**	**2,136,769,784.50**	**260,984,005.27**	**49,668,915.79**	**32,985,444.60**	**30,679,988,578.39**
ශුද්ධ පොත් අගය	**6,648,321,655.95**	**-**	**81,042.08**	**1,582,610.43**	**5,433,391.87**	**26,174,068.69**	**3,441,527.18**	**41,685,050,293.34**

	පිරිවැය - ඉඩම් සහ ගොඩනැඟිලි	31.12.2023	31.12.2022
101-1	ගොඩනැගිලි	3,966,311,180.43	2,319,327,389.54
101-1-A	ඉඩම්	26,655,126,572.00	18,897,738,572.00
101-1-F	ශ්‍රී ලංගම - ක්‍රීඩාපිටිය	4,047,510,000.00	300,000.00
	එකතුව	**34,668,947,752.43**	**21,217,365,961.54**
	පිරිවැය - මෝටර් වාහන		
101-5-A	වෑන්, ලොරි සහ වෙනත් වාහන	279,677,828.03	279,677,828.03
101-5-B	කාර්, යතුරු පැදි සහ බයිසිකල්	22,526,424.73	22,526,424.73
	එකතුව	**302,204,252.76**	**302,204,252.76**
	සමුච්චිත ක්ෂය - ඉඩම් හා ගොඩනැඟිලි		
104-1-B	ගොඩනැගිලි	60,932,088.53	1,445,054.07
	එකතුව	**60,932,088.53**	**1,445,054.07**

සටහන 01.01 - ඉඩම් සහ ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය

2023 වර්ෂයේදී ඉඩම් සහ ගොඩනැගිලි ඒකක 32 ක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලදී. එසේ නැවත තක්සේරු කළ මුළු ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම රු. 13,322,454,480/- ක් වන අතර එම වටිනාකම 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීම් කර ඇත.

සටහන 01.02 - කෙරීගෙන යන වැඩ

සටහන	කෙරීගෙන යන වැඩ	31.12.2023	31.12.2022
		රු.	රු.
102-2	2023.01.01 දිනට ශේෂය	35,733,991.00	45,099,046.94
	එකතු කිරීම්	28,952,515.61	410,710.43
	මාරු කිරීම් F/H/A	(7,237,902.48)	(9,775,766.37)
	2023.12.31 දිනට ශේෂය	**57,448,604.13**	**35,733,991.00**

සටහන 01.02 - අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම අත්පත් කරගැනීම සඳහා දරන ලද අත්තිකාරම්

අමාත්‍ය මණ්ඩලය විසින් අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගමේ සම්පූර්ණ වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත භාරදීමට තීරණය කර ඇති අතර, එකී සමාගමේ මෙහෙයුම්වලින් 15%ක කොටසක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පැවරීමටද නියමිතය. එහි මූලික පියවරක් ලෙස මෙම සමිගමට අයත් බස්රථ 20කට අදාල කල්බදු වටිනාකම වූ රු.37,492,332.48ක මුදල ලංකා බැංකුව වෙත ගෙවීම් කිරීමෙන් අනතුරුව රු.109,400,000.00ක වටිනාකමකින් යුත් එකී බස්රථ 20 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත භාරදී ඇත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2023 ජූනි මස සිට 2023 දෙසැම්බර් මස දක්වා රු. 21,840,943.00ක මුදලක් මෙහෙයුම් වියදම් ලෙස ගෙවීම් කර ඇත. නමුත් එම සමාගමේ ඇවර කිරීම් කටයුතු අවසන් වී නොමැති අතර, ආසන්න වශයෙන් රු.මි.65 ක පමණ හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සහ ණයහිමියන් පියවීම් කිරීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සිදු වනු ඇත.

02. වෙනත් මූල්‍ය වත්කම්

විකිණිය හැකි ආයෝජන

ගිණුම් කේතය	විස්තරය	31.12.2023			31.12.2022		
		කොටස් ගණන	පිරිවැය	වෙළෙඳ අගය	කොටස් ගණන	පිරිවැය	වෙළෙඳ අගය
105-2-G	Lanka Ashok Leyland - Investment In Shares	31,250	250,000.00	**23,406,250.00**	31,250	250,000.00	**21,812,500.00**
	Total	31,250	250,000.00	**23,406,250.00**	31,250	250,000.00	**21,812,500.00**

03. අක්‍රිය ගිණුම්

		31.12.2023	31.12.2022
		රු.	රු.
203-2-13	අක්‍රිය ගිණුම් - හර ශේෂය	1,290,782,781.62	1,290,782,781.62
		1,290,782,781.62	**1,290,782,781.62**

04. තොගය

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
106-1	භාණ්ඩ තොගය	2,334,861,074.10	1,921,932,083.69
106-2	ඉන්ධන තොගය (ශුද්ධ අගය)	258,351,846.26	455,097,720.31
106-4	මාර්ගස්ථ තොගය	32,105,497.34	37,202,024.19
106-6	නොනිමි වැඩ - අමුද්‍රව්‍ය (ප්‍රාදේශීය වැඩපල)	7,917,820.56	3,116,210.00
		2,633,236,238.26	**2,417,348,038.19**
106-5	හානියට පත් ගබඩා අයිතම සඳහා වෙන්කිරීම		
	එකතුව	**2,633,236,238.26**	**2,417,348,038.19**

සටහන 04.1

ඉන්ධන තොගය	285,639,990.19
ඉන්ධන අලාභය සඳහා වෙන් කිරීම්	(27,288,143.93)
ශුද්ධ අගය	**258,351,846.26**

05. වෙළෙඳ සහ වෙනත් ලැබීම්

05.1 අත්තිකාරම්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
107-1	වේතන අත්තිකාරම් - 4040	57,956,192.56	9,957,907.53
107-2	උත්සව අත්තිකාරම් - 5012	530,874,232.11	489,990,515.51
107-3	ක්‍රීඩා අත්තිකාරම් - 5012/1	64,630,773.09	67,342,537.53
107-4	විශේෂ ණය අත්තිකාරම් - 5012/2	66,916,246.77	67,246,585.88
107-5	වෙනත් අත්තිකාරම්	67,210,871.65	17,791,907.38
107-6	ස්ථානීය මිලදී ගැනීම් අත්තිකාරම්	1,136,697,559.21	1,378,085,247.84
107-7	ශ්‍රී ලංගම අත්තිකාරම් ගිණුම	3,025,977.50	2,797,767.50
107-8	විශේෂ අත්තිකාරම් ගිණුම - 4040/1	6,524,352.99	553,632.94
	එකතුව	**1,933,836,205.88**	**2,033,766,102.11**

05.2 වෙනත් ලැබිය යුතු

108-1	විවිධ ණයගැතියෝ	64,935,486.59	63,893,509.33
108-2	වෙළෙඳ ණයගැතියෝ	26,345,820.81	33,969,524.39
108-3	ලැබිය යුතු ආදායම්	385,772,746.77	287,461,434.46
108-4	ත්‍රිවිධ හමුදාවට බස්රථ ලබාදීමේ කුලිය	70,658,622.90	69,692,440.90
108-5	ගමන් බලපත්‍ර	880,261,994.84	1,549,623,472.39
108-6	උසාවි ඇප තැන්පතු	214,130,414.98	11,645,561.15
108-7	වෙනත් ඇප තැන්පතු	4,374,532.87	4,655,068.97
108-8	කොන්දොස්තර හිඟ මුදල	6,168,805.47	6,595,337.19
108-10	විශ්වාස ඇප අරමුදල්	(697,643.24)	70,331.76
108-11	ඉන්ධන විකුණුම් පාලන ගිණුම	-	1,519,100.88
108-12	ලක්දිව ඉංජිනියරින් - ඒකල	44,138.50	10,549.50
108-13	මුදල් අයකැමි හිඟ	445,593.38	465,940.09
108-14	325 බස් ව්‍යාපෘතියේ මූලික ගෙවීම	263,435,339.00	263,435,339.00
108-14	ඉදිරියට කළ ගෙවීම්	4,606,785.97	5,515,328.07
108-18	බාහිර පාර්ශවයන් සඳහා කරන ලද කාර්යයන්	38,263.89	51,363.89
	එකතුව	**1,920,520,902.73**	**2,298,604,301.97**
	මුළු එකතුව	**3,854,357,108.61**	**4,332,370,404.08**

6. වෙනත් මූල්‍ය වත්කම්

105-1	භාණ්ඩාගාර බිල්පත්	12,601,148.81	8,682,525.38
105-2-B	විශ්වාස ඇප ආයෝජන	(147,070.00)	19,080.00
105-2-C	සේවක ආරක්ෂක ඇප තැන්පතු	398,937.05	478,278.13
105-2-D	ස්ථාවර තැන්පතු	724,572,282.28	827,852,762.63
	එකතුව	**737,425,298.14**	**837,032,646.14**

7. මුදල් හා මුදල්වලට සමාන දෑ

105-2-A	කෙටි කාලීන ආයෝජන	700,000,000.00	-
105-2-E	ඉතිරි කිරීමේ ගිණුම්	2,708,239,500.73	2,311,836,019.38
	එකතුව	**3,408,239,500.73**	**2,311,836,019.38**

07. බැංකුවේ ඇති මුදල්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
109-1	ප්‍රධාන කාර්යාලය	915,947,923.26	1,007,538,290.67
	ප්‍රාදේශීය කාර්යාල සහ ඩිපෝ	60,850,010.67	129,898,297.73
	ප්‍රාදේශීය වැඩපල, රියදුරු අභ්‍යාස විද්‍යාල හා ඉන්ධන පිරහුම්හල්	105,774,360.33	82,113,333.84
	එකතුව	**1,082,572,294.26**	**1,219,549,922.24**

07. බැංකු අයිරාව

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
109-1	ප්‍රධාන කාර්යාලය	-	-
	ප්‍රාදේශීය කාර්යාල සහ ඩිපෝ	548,969,541.78	645,939,848.93
	ප්‍රාදේශීය වැඩපල, රියදුරු අභ්‍යාස විද්‍යාල හා ඉන්ධන පිරහුම්හල්	-	-
	එකතුව	**548,969,541.78**	**645,939,848.93**

07. අනෑනි මුදල්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
110-1	අනෑනි මුදල්	3,019,074.62	17,684,557.42
110-2	සුළු මුදල් අග්‍රිමය ගිණුම	516,704.99	477,360.07
110-3	මාර්ගස්ථ මුදල් ගිණුම	51,291,035.50	55,221,674.42
110-4	මුද්දර අග්‍රිමය ගිණුම	349,220.00	260,105.00
110-5	නිල වාහන අග්‍රිමය	219,200.00	236,327.00
110-6	ආදායම් අවිනිශ්චිත ගිණුම	403,973,691.62	345,508,909.00
	එකතුව	**459,368,926.73**	**419,388,932.91**

07. මුදල් සහ මුදල්වලට සමාන අයිතමයන්ගේ මුළු එකතුව	**4,950,180,721.72**	**3,950,774,874.53**
07. බැංකු අයිරාවන්ගේ එකතුව	**548,969,541.78**	**645,939,848.93**

08. සමුච්චිත අලාභය

		31.12.2023	සංශෝධිත 31.12.2022
	සමුච්චිත අලාභය	රු.	රු.
201	පෙර වර්ෂයේ සමුච්චිත අලාභය	(19,115,858,531.14)	(25,477,872,672.88)
201-1	එකතු කළා - පෙර වර්ෂයේ ලාභාලාභ ගැලපුම් ගිණුම	892,145,839.25	4,439,620,110.13
	වර්ෂය සඳහා ලාභය හෝ අලාභය	2,043,818,587.88	1,421,706,090.64
	වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ අතිරික්තය / (හිඟය)	(946,477,707.92)	500,687,940.97
	එකතුව	**(17,126,371,811.93)**	**(19,115,858,531.14)**

භාණ්ඩාගාර කොටස් ප්‍රග්ධනය

		31.12.2023	31.12.2022
		රු.	රු.
202-5	කොටස් ප්‍රාග්ධනය	3,368,242,400.00	3,368,242,400.00
202-6	කොටස් ප්‍රග්ධනය - භාණ්ඩාගාර ගිණුම	576,648,150.00	576,648,150.00
		3,944,890,550.00	**3,944,890,550.00**

09. රජයේ ප්‍රතිදාන

		31.12.2023	31.12.2022
		රු.	රු.
202-3	2023.01.01 දිනට ශේෂය	248,239,605.31	283,702,406.07
	වර්ෂය තුළ ලැබීම්	5,671,727,963.83	-
	වර්ෂය සඳහා වෙන්කිරීම්	(508,996,613.33)	(35,462,800.76)
	2023.12.31 දිනට ශේෂය	**5,410,970,955.81**	**248,239,605.31**

10. සංචිත

		31.12.2023	31.12.2022
		රු.	රු.
201-2	ප්‍රාග්ධන සංචිත	22,295,374.57	22,295,374.57
201-3	රක්ෂණ සංචිත	292,329.36	292,329.36
201-4	කම්කරු වන්දි අරමුදල්	2,988,322.52	2,988,322.52
201-5	මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්	2,667,679.00	2,667,679.00
201-6	වාර ප්‍රවේශපත්‍ර අරමුදල්	272,673.18	272,673.18
201-8	වත්කම් ප්‍රත්‍යාගණන	39,494,145,752.96	26,179,905,268.52
201-9	ප්‍රාග්ධන සංචිත හා වෙනත් සංචිත	5,241,375,581.56	5,241,375,581.56
		44,764,037,713.15	**31,449,797,228.71**

11. විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023	සංශෝධිත 31.12.2022
		රු.	රු.
202-1	වර්ෂය ආරම්භක ශේෂය	8,021,811,484.65	8,806,157,968.64
	ප්‍රවර්තන වර්ෂය සඳහා වෙන් කිරීම්	401,048,270.03	415,719,759.51
	වර්ෂය සඳහා අතිරික්තය/හිඟය	946,477,707.92	(500,687,940.97)
	වර්ෂය තුළ ගෙවීම්	(1,436,656,909.25)	(699,378,302.53)
	වර්ෂය අවසාන ශේෂය	**7,932,680,553.35**	**8,021,811,484.65**

12. වෙනත් ජංගම නොවන වගකීම්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023	31.12.2022
		රු.	රු.
202-20	ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම	-	824,468,339.00
202-2	පොලී අවිනිශ්චිත ගිණුම	-	(31,812,892.25)
202-21	දිගු කාලීන වගකීම් - ශ්‍රී ලංගම අර්ථසාධක අරමුදල	-	1,860,824,837.37
	එකතුව	**-**	**2,653,480,284.12**

13. අක්‍රිය ගිණුම්

		31.12.2023	31.12.2022
		රු.	රු.
203-2-12	අක්‍රිය ගිණුම් -බැර ශේෂ	-	-
		-	-

14. වෙළඳ හා වෙනත් ගෙවීම්

14.1 ණය හිමියෝ

ගිණුම් කේතය	විස්තරය	31.12.2023	31.12.2022
		රු.	රු.
203-1-1	වෙළෙඳ ණය හිමියෝ	4,399,735,643.10	3,522,347,456.65
203-1-2	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	24,861,200.70	182,658,664.50
203-1-3	වෙනත් ණය හිමියෝ	572,635,539.56	93,422,744.92
203-1-4	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	337,857.40	369,857.40
203-1-6	නොගෙවූ වේතන	12,281,331.03	12,489,421.03
203-1-7	සූනාමි අරමුදල	624,340.20	624,340.20
203-1-8	ගෙවිය යුතු තෙවන පාර්ශවීය ගෙවීම්	57,442,640.52	58,701,624.49
203-1-9	7070 සේ.අ.අ. ණය	20,390,389.34	27,246,639.30
203-1-10	7082 සේ.අ.අ. රූපවාහිනී ණය	4,519,200.93	9,140,512.98
203-1-11	7075 සේ.අ.අ. නිවාස ණය	210,322,348.69	210,557,687.07
203-1-12	7078 සේ.අ.අ. ණය	391,807.53	572,187.53
203-1-13	දඩ අරමුදල	48,639,795.80	49,122,915.73
203-1-14	ක්‍රීඩා පාලක සභාව	12,807,490.77	13,588,587.58
203-1-15	වෘත්තීය සමිති	39,738,216.73	36,731,689.59
203-1-16	අවමංගල්‍යාධාර සමිති	59,036,021.62	47,011,872.38
203-1-17	සුභසාධක සංගමය	53,614,833.68	42,558,326.69
203-1-18	ආපනශාලා අයකිරීම්	6,060,463.75	5,867,052.56
203-1-19	බැංකු ණය - (වේතනයෙන් අයවිය යුතු)	41,824,224.19	43,316,416.11
203-1-20	ගෙවිය යුතු රක්ෂණ	964,668.48	1,036,645.28
203-1-21	මුද්දර ගාස්තු අයකිරීම්	34,217,637.97	31,077,110.96
203-1-22	දඩ අයකිරීම්	473,616,225.36	473,574,493.93
203-1-23	දඩ අරමුදල් අයකිරීම්	63,000,480.34	67,029,737.53
203-1-24	නොගෙවූ වේතන අඩුකිරීම්	5,076,922.46	5,268,183.01
203-1-25	ටෙන්ඩර් තැන්පතු	11,578,738.23	16,382,263.49
203-1-26	වෙනත් තැන්පතු	10,148,587.03	10,099,469.73
203-1-27	අවිනිශ්චිත ගිණුම	23,312.08	23,312.08
203-1-28	තැන්පතු - බාහිර පාර්ශව	4,067,010.40	4,067,010.40
203-1-29	තැන්පතු - ටෙන්ඩර් (කර්මාන්ත ශාලා)	10,906,905.28	10,906,905.28
203-1-30	සේවක තැන්පතු	177,337,526.60	160,330,027.29
203-1-31	විවිධ ගෙවීම්	112,974.14	216,902.14
203-1-33	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් අධිභාර	231,830.04	232,174.44
203-1-35	ගෙවිය යුතු කුලී සහ ගාස්තු	10,362,978.61	4,976,524.22
203-1-38	විශ්වාස බැදුම්කර	9,653,422.34	54,419.46
203-1-47	ණයහිමි ගිණුම ලංකා අශෝක් ලේලන්ඩ් (බස් 272 හා 53)	824,468,339.00	685,884,000.00
203-1-46	අවිනිශ්චිත පොළී ගිණුම (බස් 272 හා 53)	(31,812,892.25)	(114,526,441.26)
203-1-48	තැන්පතු - කොන්ත්‍රාත්කරු (කර්මාන්තශාලා)	2,832,243.12	2,832,243.12
203-1-49	තැන්පතු ගිණුම	2,116,842.36	3,708,446.99
203-1-57	ලංකා අශෝක් ලේලන්ඩ් ණය හිමි ගිණුම	100,202,684.90	100,202,684.90
	එකතුව	**7,274,369,782.03**	**5,819,704,109.70**

14.2 උපචිත වියදම්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
203-3-1	ගෙවිය යුතු විගණන ගාස්තු	7,175,028.26	6,960,268.73
203-3-3	සේ.අ.අ. ගෙවිය යුතු (ශ්‍රී ලංගම)	60,969,992.62	163,465,974.65
203-3-4	සේ.අ.අ. ගෙවිය යුතු (මහ බැංකුව)	301,898,596.44	299,322,645.97
203-3-5	සේ.හා.අ. ගෙවිය යුතු (මහ බැංකුව)	31,443,308.35	31,216,275.75
203-3-6	වේතන පාලන ගිණුම	1,055,946,535.14	1,118,087,137.98
203-3-7	උපචිත වියදම්	517,859,912.78	534,848,732.21
202-24	ප්‍රසාද දීමනා සඳහා වෙන් කිරීම්	-	82,500,000.00
203-3-8	මාර්ගගත ක්‍රමය යටතේ ගමන් බලපත්‍ර වෙන්කිරීමේ පාලන ගිණු	2,921,541.47	718,157.43
	එකතුව	**1,978,214,915.06**	**2,237,119,192.72**

14.3 වෙනත් ගෙවිය යුතු ගිණුම්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
203-2-9	Cash Transfers	-	-
203-2-1	Current Account - SLTB	-	-
203-2-2	Current Account - Inter Regions	-	-
203-2-3	Balance Adjustment A/C -	-	-
203-2-4	Inter Ledger Control Account	-	-
203-2-5	Transfer In/Out - Regions	-	-
203-2-6	Transfer In/Out - Out of Regions	-	-
203-2-7	S40 - Out of Regions / Stock	-	-
203-2-8	C/A - Out of Regions W/S Repairs & Maintenance	-	-
203-2-10	Transfer In Out /S40 - Out of Region A/C	-	-
203-2-11	Region Offices & Depots A/C	-	-
203-2-12	R.T.B & W.S A/C	-	-
		-	**-**
	එකතුව	**9,252,584,697.09**	**8,056,823,302.42**

15. ආදායම්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
301-1	මාර්ග ලේඛන ආදායම	56,861,788,884.90	54,956,782,628.50
301-2	වාර ප්‍රවේශ පත්‍ර	3,911,122,244.26	2,663,256,056.67
301-3	විශේෂ චාරිකා	509,523,478.83	631,187,863.94
301-4	තැපැල් ප්‍රවාහන	82,202,399.67	53,569,392.08
301-5	හමුදා ගමන් බලපත්‍ර	282,264,786.25	236,729,617.66
301-6	පොලිස් ගමන් බලපත්‍ර සහ අවසරපත්‍ර	1,600,198,619.32	1,061,410,869.21
301-7	හමුදා විශේෂ චාරිකා	81,652,927.42	18,653,617.00
301-8	පුවත්පත් ප්‍රවාහනය	257,371.00	140,369.00
301-9	විවිධ ගමන් බලපත්‍ර	262,334,866.32	272,403,191.87
301-10	ගමන් මලු ප්‍රවාහනය	71,397,755.33	56,458,148.18
301-11	සුභසාධන චාරිකා	1,418,593.60	772,627.00
301-12	පොලිස් වවුචර්පත් ගිණුම	3,873,837.50	64,619,283.65
302-1-2	සිසු සැරිය	463,373,664.75	217,029,892.52
302-1-3	නිසි සැරිය	31,293,038.00	17,184,114.00
302-4-D	වාර ප්‍රවේශපත්‍ර ප්‍රතිපාදන	8,000,000,000.00	6,100,000,000.00
	එකතුව	**72,162,702,467.15**	**66,350,197,671.28**

16. මෙහෙයුම් වියදම්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
401-1	බස් මෙහෙයුම් වියදම්	18,610,415,585.72	18,060,009,202.13
401-2	ඍජු ඉන්ධන, තෙල් සහ ලිහිසි තෙල්	41,464,741,297.65	37,344,017,328.28
401-3	වෙනත් ඍජු වියදම්	9,723,786,718.19	6,790,389,986.42
402-3-1	බස්රථ - ක්ෂයවීම්	874,811,244.89	1,830,978,830.20
	එකතුව	**70,673,754,846.45**	**64,025,395,347.03**

	බස් මෙහෙයුම් වියදම්	31.12.2023	31.12.2022
401-1-1	වේතන - රියදුරු හා කොන්දොස්තර	6,222,171,802.61	5,882,248,284.55
401-1-14	වේතන - ඉංජිනේරු	1,681,055,095.98	1,618,283,582.49
401-1-3	අතිකාල - ලේඛනගත රියදුරු හා කොන්දොස්තර	3,048,345,143.33	2,524,239,745.89
401-1-4	අතිකාල - ලේඛනගත නොවන රියදුරු හා කොන්දොස්තර	168,059,389.64	113,435,606.79
401-1-16	අතිකාල - ඉංජිනේරු	559,585,257.86	436,305,788.34
401-1-6	ගමන් වියදම් - රියදුරු/කොන්දොස්තර	3,028,184.37	2,788,305.78
401-1-18	ගමන් වියදම් - ඉංජිනේරු	2,943,867.98	3,045,438.22
401-1-2	ජීවනාංක දීමනාව - රියදුරු/කොන්දොස්තර	1,530,927,698.22	1,594,998,946.57
401-1-15	ජීවනාංක දීමනාව - ඉංජිනේරු	361,832,233.13	389,995,930.66
401-1-5	බස්රථ කාර්යය මණ්ඩලය - ස්ථානගත කිරීම	13,379,427.02	19,557,351.71
401-1-7	දිරිදීමනා - රියදුරු/ කොන්දොස්තර	1,669,274,724.91	2,197,959,000.79
401-1-17	දිරිදීමනා - ඉංජිනේරු	156,961,568.84	146,660,900.22
401-1-8	පැමිණීමේ දීමනා - රියදුරු/කොන්දොස්තර	716,679.28	4,648,322.29
401-1-19	පැමිණීමේ දීමනා - ඉංජිනේරු	290,846.34	28,401.54
401-1-10	විශේෂ දීමනා - රියදුරු/කොන්දොස්තර	1,187,487,719.57	1,157,314,373.13
401-1-20	විශේෂ දීමනා - ඉංජිනේරු	280,282,956.08	297,576,487.30
401-1-23	බස් පිරිසිදු කිරීමේ හා බලාගැනීමේ දීමනා	51,805,576.52	45,354,708.99
401-1-9	රාත්‍රී නවාතැන් දීමනා - රියදුරු/කොන්දොස්තර	8,170,729.65	4,831,083.07
401-1-11	මාර්ග ලේඛන පරීක්ෂා කිරීමේ කොමිස්	4,215,518.76	5,496,986.91
401-1-12	සේ.අ.අ. - රියදුරු හා කොන්දොස්තර	947,469,945.29	932,242,196.12
401-1-21	සේ.අ.අ. - ඉංජිනේරු	293,819,567.71	296,605,170.42
401-1-13	සේ.හා.අ. - රියදුරු හා කොන්දොස්තර	236,922,266.13	232,831,929.30
401-1-22	සේ.හා.අ. - ඉංජිනේරු	75,553,428.23	75,510,514.69
401-1-24	වෙනත් විවිධ වියදම්	106,115,958.27	78,050,146.36
		18,610,415,585.72	**18,060,009,202.13**
	සෘජු ඉන්ධන, තෙල් සහ ලිහිසි තෙල්		
401-2-A	බස් රථ සඳහා තෙල් හා ලිහිසි	1,049,288,878.70	668,535,137.28
401-2-B	බස් රථ සඳහා ඉන්ධන	40,415,452,418.95	36,675,482,191.00
		41,464,741,297.65	**37,344,017,328.28**
	වෙනත් සෘජු වියදම්		
401-3-1	අමතර කොටස්	4,180,372,028.86	2,668,494,417.37
401-3-2	නව ටයර් හා ට්‍යුබ්	1,434,698,704.36	1,369,431,260.26
401-3-3	නැවත පිරවූ ටයර්	2,841,244,936.99	1,941,620,424.72
401-3-4	බස් රථ සඳහා බැටරි	270,007,537.44	231,607,158.26
401-3-5	බස් රථ අළුත්වැඩියා හා නඩත්තු වියදම්	699,314,958.37	359,139,323.94
401-3-6	බස් රථ - රක්ෂණ වියදම්	13,880,671.50	10,855,208.40
401-3-7	බස් රථ - ලියාපදිංචි ගාස්තු සහ ආදායම් බලපත්‍ර	20,180,975.80	6,718,191.28
401-3-8	ටිකට් සහ මාර්ග ලේඛන වියදම්	264,086,904.87	202,524,002.19
		9,723,786,718.19	**6,790,389,986.42**

17. වෙනත් ආදායම්

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
303-1	කුලි ආදායම	36,959,193.16	31,000,870.07
303-4	සංචාරක බංගලා	9,932,843.00	8,387,456.09
303-5	ප්‍රචාරණය	3,588,300.00	2,373,000.00
303-6	දඩ අයකිරීම්	2,249,286.49	1,157,955.50
303-8	ලාභාංශ ලැබීම්	-	312,500.00
303-9	දැව් තෙල් විකුණුම්	12,465,570.39	23,443,693.70
303-10	මුදල් අධිකය	1,076,800.05	1,851,034.56
303-11	අලාභ අයකර ගැනීම්	34,716,589.25	29,879,969.61
303-12	දේපලවලින් ලද ආදායම	2,770,835.83	231,615.54
303-13	ගොඩනැගිලි සහ ආපනශාලා කුලි	7,537,515.13	6,054,674.77
303-14	කොමිස් හා වට්ටම්	38,875,519.55	79,966,630.65
303-15	යෝග්‍යතා සහතික	23,235,701.26	11,820,175.76
303-16	බාහිර ආයතන සඳහා කළ අළුත්වැඩියාකිරීම්වලින් ලැබූ ආදායම	296,976.00	122,425.50
303-17	දොඹකර ගාස්තු	490,620.00	555,958.75
303-18	රක්ෂණ කොමිස්	4,541,156.39	3,345,321.97
303-19	අයකැමි අධිකය	224,347.77	231,380.78
303-20	හැඳුනුම්පත් ආදායම	1,081,293.32	863,173.58
303-21	තොග ගැලපුම් ගිණුම	6,544,592.70	379,974.76
303-22	ඉන්ධන තොගයේ අතිරික්තය/ (ඌනතාවය)	8,176,925.85	36,799,884.39
303-23	අබලි ද්‍රව්‍ය විකුණුම්	35,670,825.74	41,211,133.74
303-24	වෙනත් ආදායම්	172,113,741.46	115,591,923.79
303-25	ශාලිකා ආදායම්	5,885,600.00	4,048,800.00
303-26	ඉන්ධන විකුණුම් ආදායම්	110,416,687.63	687,028,882.35
303-29	වෙනත් අයිතම විකුණුම්	19,750,461.39	2,648,579.90
303-30	අබලි තොග අතිරික්තය	770,150.00	105,731.44
303-33	බස්රථ කුලී ආදායම් සහ වියදම්	191,506,176.60	63,016,801.32
302-1-A	අනාර්ථික මාර්ග ප්‍රතිදාන	3,960,000,000.00	2,700,000,000.00
302-1-4	වෙනත් ප්‍රතිදාන	65,820,000.00	-
	එකතුව	**4,756,830,521.46**	**3,852,429,548.52**

18. ආයතන හා පරිපාලන වියදම්

ගිණුම් කේතය	විස්තරය		31.12.2023 රු.	සංශෝධිත 31.12.2022 රු.
	වැටුප් හා වේතන	සටහන - 18.1	1,589,164,734.12	1,077,109,440.38
	අතිකාල හා නිවාඩු දීමනා	සටහන - 18.2	337,157,714.66	235,107,447.23
	ජීවනාංක දීමනාව	සටහන - 18.3	378,209,654.31	412,881,676.01
	ගමන් වියදම්	සටහන - 18.4	16,828,913.87	13,626,328.56
	වෙනත් විශේෂ දීමනා	සටහන - 18.5	410,094,927.93	961,942,145.42
402-1-6	සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල දීමනා		489,000.00	411,000.00
402-1-8	පුද්ගලික ආරක්ෂක වියදම්		109,106,704.75	80,849,535.68
402-1-9	වෛද්‍ය බිල්පත්		3,788,804.00	822,833.00
402-1-10	වෙනත් දීමනා		7,677,125.12	5,245,467.75
402-1-11	කොන්ත්‍රාත් හා දෛනික සේවක දීමනා		138,249,852.97	135,479,977.26
402-1-12	සේවක අර්ථසාධක අරමුදල්		225,170,124.63	201,469,318.45
402-1-13	සේවක භාරකාර අරමුදල්		56,592,151.70	51,442,213.28
	අළුත්වැඩියා සහ නඩත්තු	සටහන -18.6	267,492,664.14	324,104,378.86
402-2-5	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය		177,930,695.84	161,878,200.85
402-2-6	කුලී හා නඩත්තු		70,249,439.28	49,402,718.48
402-2-7	දුරකතන		59,459,505.60	47,822,072.91
402-2-8	විදුලිය		189,293,781.79	98,892,227.45
402-2-9	ජලය		51,535,279.90	33,191,085.40
402-2-10	වාර්ෂික ප්‍රසාද දීමනා		290,246,425.00	-
402-2-11	විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික		401,048,270.03	415,719,759.51
402-2-12	වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම		5,925,492.00	5,466,285.63
402-2-13	නීති වියදම්	සටහන - 18.7	42,766,382.25	22,282,664.94
402-2-14	සේවක සුභසාධන		17,891,457.56	20,935,732.44
402-2-15	කරුණාසහගත දීමනා		31,139,058.66	30,938,086.80
402-2-16	සේවක වන්දි		9,742,802.02	5,873,978.20
402-2-17	පොලිස් ආරක්ෂක වියදම්		337,937.16	1,260,254.50
402-2-18	සුනාමි බස්රථ සඳහා වියදම්		33,000.00	-
402-2-19	ඉන්ධන තෙල් හා ලිහිසි (වක්‍ර වියදම්)		316,602,264.49	269,939,530.30
402-2-20	සංග්‍රහ වියදම්		15,939,547.58	7,200,403.55
402-2-21	වෙනත් වියදම්		166,960,546.60	234,785,906.24
402-2-22	Doubtful Debts		-	-
402-2-23	ප්‍රචාරණ වියදම		5,985,871.15	4,349,647.90
402-2-24	රක්ෂණ - වෙනත් වාහන		9,137,904.08	8,461,051.03
402-2-25	විගණන ගාස්තු		1,943,239.53	1,519,518.00
402-3-2	ක්ෂය	සටහන - 18.8	150,259,092.28	353,161,462.44
	එකතුව		**5,554,450,365.00**	**5,273,572,348.45**

සටහන

18.1 **වැටුප් හා වේතන**

		31.12.2023	31.12.2022
402-1-1-A	වැටුප් හා වේතන - ධාවන කාර්යය මණ්ඩල	632,652,323.70	410,678,306.89
402-1-1-B	වැටුප් හා වේතන - ගිණුම් කාර්යය මණ්ඩල	245,712,558.75	139,278,645.52
402-1-1-C	වැටුප් හා වේතන - ඉංජිනේරු කාර්යය මණ්ඩල	264,634,371.23	184,592,865.27
402-1-1-D	වැටුප් හා වේතන - විගණන කාර්යය මණ්ඩල	32,380,731.96	19,746,459.81
402-1-1-E	වැටුප් හා වේතන - විනය කාර්යය මණ්ඩල	40,835,552.49	28,578,012.08
402-1-1-F	වැටුප් හා වේතන - ආරක්ෂක කාර්යය මණ්ඩල	278,819,941.23	231,071,451.41
402-1-1-G	වැටුප් හා වේතන - සම්පාදක කාර්යය මණ්ඩල	89,217,202.86	57,451,691.10
402-1-1-H	වැටුප් හා වේතන - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල	4,511,301.90	5,712,008.30
402-1-7	වැටුප් හා වේතන - පුහුණු උපාධිධාරි	400,750.00	-
		1,589,164,734.12	**1,077,109,440.38**

සටහන

18.2 **අතිකාල හා නිවාඩු දීමනා**

402-1-2-A	අතිකාල හා නිවාඩු දීමනා - ධාවන කාර්යය මණ්ඩල	95,203,813.00	74,590,447.59
402-1-2-B	අතිකාල හා නිවාඩු දීමනා - ගිණුම් කාර්යය මණ්ඩල	12,258,544.92	4,026,751.82
402-1-2-C	අතිකාල හා නිවාඩු දීමනා - ඉංජිනේරු කාර්යය මණ්ඩල	31,483,920.75	16,238,851.06
402-1-2-D	අතිකාල හා නිවාඩු දීමනා - විගණන කාර්යය මණ්ඩල	357,296.30	93,614.64
402-1-2-E	අතිකාල හා නිවාඩු දීමනා - විනය කාර්යය මණ්ඩල	5,408,302.97	1,837,502.49
402-1-2-F	අතිකාල හා නිවාඩු දීමනා - ආරක්ෂක කාර්යය මණ්ඩල	180,643,194.63	132,861,231.25
402-1-2-G	අතිකාල හා නිවාඩු දීමනා - සම්පාදක කාර්යය මණ්ඩල	11,750,583.28	5,377,783.04
402-1-2-H	අතිකාල හා නිවාඩු දීමනා - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය ම	52,058.81	81,265.34
		337,157,714.66	**235,107,447.23**

සටහන

18.3 **ජීවනාංක දීමනාව**

402-1-3-A	ජීවනාංක දීමනාව - ධාවන කාර්යය මණ්ඩල	151,142,269.82	175,153,837.72
402-1-3-B	ජීවනාංක දීමනාව - ගිණුම් කාර්යය මණ්ඩල	59,926,780.34	62,869,545.27
402-1-3-C	ජීවනාංක දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල	63,664,324.76	69,375,239.41
402-1-3-D	ජීවනාංක දීමනාව - විගණන කාර්යය මණ්ඩල	7,691,350.00	8,456,194.17
402-1-3-E	ජීවනාංක දීමනාව - විනය කාර්යය මණ්ඩල	10,135,540.00	10,465,370.00
402-1-3-F	ජීවනාංක දීමනාව - ආරක්ෂක කාර්යය මණ්ඩල	61,922,007.38	59,939,337.50
402-1-3-G	ජීවනාංක දීමනාව - සම්පාදක කාර්යය මණ්ඩල	22,514,165.26	24,710,578.69
402-1-3-H	ජීවනාංක දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල	1,213,216.75	1,911,573.25
		378,209,654.31	**412,881,676.01**

සටහන

18.4 **ගමන් වියදම්**

402-1-4-A	ගමන් වියදම් දීමනාව - ධාවන කාර්යය මණ්ඩල	10,798,125.48	8,128,541.99
402-1-4-B	ගමන් වියදම් දීමනාව - ගිණුම් කාර්යය මණ්ඩල	579,500.00	688,087.25
402-1-4-C	ගමන් වියදම් දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල	1,912,519.89	1,647,597.82
402-1-4-D	ගමන් වියදම් දීමනාව - විගණන කාර්යය මණ්ඩල	1,372,054.00	1,236,856.50
402-1-4-E	ගමන් වියදම් දීමනාව - චිනය කාර්යය මණ්ඩල	623,040.00	496,431.00
402-1-4-F	ගමන් වියදම් දීමනාව - ආරක්ෂක කාර්යය මණ්ඩල	1,097,969.50	894,186.00
402-1-4-G	ගමන් වියදම් දීමනාව - සම්පාදක කාර්යය මණ්ඩල	410,970.00	429,501.00
402-1-4-H	ගමන් වියදම් දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල	34,735.00	105,127.00
		16,828,913.87	**13,626,328.56**

සටහන

18.5	**වෙනත් විශේෂ දීමනා**	**31.12.2023**	**31.12.2022**
402-1-5-A	වෙනත් විශේෂ දීමනාව - ධාවන කාර්යය මණ්ඩල	193,843,411.98	515,225,128.17
402-1-5-B	වෙනත් විශේෂ දීමනාව - ගිණුම් කාර්යය මණ්ඩල	63,551,992.66	145,171,033.62
402-1-5-C	වෙනත් විශේෂ දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල	63,710,104.05	142,142,873.80
402-1-5-D	වෙනත් විශේෂ දීමනාව - විගණන කාර්යය මණ්ඩල	8,248,706.99	19,209,624.29
402-1-5-E	වෙනත් විශේෂ දීමනාව - චිනය කාර්යය මණ්ඩල	10,706,961.22	26,477,847.82
402-1-5-F	වෙනත් විශේෂ දීමනාව - ආරක්ෂක කාර්යය මණ්ඩල	47,429,187.46	61,531,347.48
402-1-5-G	වෙනත් විශේෂ දීමනාව - සම්පාදක කාර්යය මණ්ඩල	21,279,280.83	48,887,691.34
402-1-5-H	වෙනත් විශේෂ දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩ	1,325,282.74	3,296,598.90
		410,094,927.93	**961,942,145.42**

සටහන

18.6	**අළුත්වැඩියා සහ නඩත්තු**		
402-2-1	අළුත්වැඩියා හා නඩත්තු (ගරාජ් ගොඩනැඟිලි)	33,549,101.62	39,648,008.08
402-2-2	ලී බඩු හා කාර්යාල උපකරණ නඩත්තු	23,395,978.02	15,937,818.00
402-2-3	අළුත්වැඩියා හා නඩත්තු - නිල වාහන	140,606,205.69	205,364,532.41
402-2-4	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු	69,941,378.81	63,154,020.37
		267,492,664.14	**324,104,378.86**

සටහන

18.7 **නීති වියදම්**

2023.12.31 දිනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට එරෙහිව මාර්ග අනතුරු හේතුවෙන් සිවිල් අධිකරණ නඩු 196ක් විභාග වෙමින් තිබූ අතර මෙම නඩුවල සම්පූර්ණ හිමිකම් වටිනාකම රුපියල් 2,075,449,378/- කි. 2023.12.31 වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට එරෙහිව කම්කරු නඩු 81ක් විභාග වෙමින් තිබූ අතර මෙම නඩු වල සම්පූර්ණ හිමිකම් වටිනාකම තක්සේරු කළ නොහැක.

සටහන			
18.8	**ක්ෂය**		
402-3-2	ක්ෂය වීම - වෙනත් වාහන	6,930,550.00	7,183,830.00
402-3-3	ක්ෂය - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	52,740,605.83	52,360,410.91
402-3-4	ක්ෂය - ලී බඩු හා කාර්යාල උපකරණ	9,014,530.67	8,689,385.49
402-3-5	ක්ෂය - ගොඩනැඟිලි	59,791,800.26	603,196.43
402-3-6	ක්ෂය - පරිගණක	5,886,212.29	24,252,800.84
402-3-7	ක්ෂය - වෙනත්	5,362,938.56	5,828,026.20
402-3-8	ක්ෂය - තුවක්කු	9,923.52	8,269.60
402-3-9	ක්ෂය - වායු සමීකරණ	1,676,088.08	1,110,253.73
402-3-10	ක්ෂය - බස්රථ එන්ජින්	379,183.85	226,667,516.05
402-3-12	ක්ෂය - ටිකට් මැෂින්	5,192,034.38	19,931,279.25
402-3-13	ක්ෂය - පරිගණක මෘදුකාංග	3,275,224.84	6,526,493.94
	එකතුව	**150,259,092.28**	**353,161,462.44**

19. මූල්‍ය කාර්යයසාධනය

ගිණුම් කේතය	විස්තරය	**31.12.2023** රු.	**31.12.2022** රු.
402-4-1	අයිරා පොලිය	907,130.86	400,171.16
402-4-2	බැංකු ගාස්තු	6,950,758.56	4,611,498.10
402-4-4	කල්බදු පොලී	114,526,441.26	197,818,398.54
	මූල්‍ය වියදම් එකතුව	**122,384,330.68**	**202,830,067.80**

ගිණුම් කේතය	විස්තරය	**31.12.2023** රු.	**31.12.2022** රු.
303-7	පොලී ආදායම	322,495,694.96	176,984,864.86
	මුළු මූල්‍ය වියදම්	**322,495,694.96**	**176,984,864.86**

ශුද්ධ මූල්‍ය පිරිවැය	**(200,111,364.28)**	**25,845,202.94**

20. ප්‍රාදේශීය වැඩපල නිෂ්පාදන ලාභ/අලාභ

	ලාභ සහ අලාභ ප්‍රකාශය		31.12.2023 රු.		31.12.2022 රු.
403-1	2023.01.01 දිනට නොනිමි වැඩ - අමුද්‍රව්‍ය	3,116,210.00		4,729,152.18	
	එකතු කිරීම්				
403-2	අමුද්‍රව්‍ය මිලදී ගැනුම්	472,585,470.70		239,764,122.32	
	අඩු කිරීම්		475,701,680.70		244,493,274.50
403-4	භාණ්ඩ ආපසු යැවුම්	1,871,877.52		1,403,930.79	
	2023.12.31 දිනට නොනිමි වැඩ	7,917,820.56		3,116,210.00	
			9,789,698.08		4,520,140.79
	නිමි භාණ්ඩවල ප්‍රාථමික පිරිවැය		465,911,982.62		239,973,133.71
	කම්හල් පොදු කාර්යය පිරිවැය				
403-1-A	කම්හල් වැටුප් හා දීමනා	138,169,177.93		138,328,085.19	
403-1-B	අතිකාල	19,247,995.29		18,058,953.10	
403-1-C	ගමන් වියදම් දීමනා	93,130.50		84,360.00	
403-1-D	සේවක අර්ථසාධක අරමුදල	18,254,976.69		17,842,851.70	
403-1-E	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	4,528,688.62		4,180,020.80	
403-1-F	වෙනත් වියදම්	8,269,936.41		3,821,083.31	
	කම්හල් පිරිවැය		188,563,905.44		182,315,354.10
	මුළු නිෂ්පාදන පිරිවැය		654,475,888.06		422,288,487.81
403-3	නිෂ්පාදන ආදායම	549,600,755.83	549,600,755.83	299,139,575.60	299,139,575.60
	නිෂ්පාදන හිඟය		(104,875,132.23)		(123,148,912.21)
	ප්‍රාදේශීය වැඩපල නිෂ්පාදන		5,117,468.00		3,440,695.00
	මුළු නිෂ්පාදන හිඟය		(99,757,664.23)		(119,708,217.21)

21. රියදුරු පුහුණු පාසල් - ලාභ සහ අලාභ ප්‍රකාශය

	ලාභ සහ අලාභ ප්‍රකාශය		**31.12.2023** රු.
	පුහුණු ආදායම	28,875,350.00	
			28,875,350.00
3	**ආදායම**		28,875,350.00
301	මෙහෙයුම් ආදායම		
301-3	විශේෂ චාරිකා කුලී	7,435,000.00	
			7,435,000.00
			36,310,350.00
303	වෙනත් ආදායම්		
303-1	කුලී ආදායම්	140,000.00	
303-7	පොළී ආදායම	164,226.28	
303-24	වෙනත් ආදායම්	351,749.00	
			655,975.28
	මුළු ආදායම		36,966,325.28
401-3	**වෙනත් සෘජු පිරිවැය**		
401-3-4	බස් රථ සඳහා බැටරි	296,700.00	
			296,700.00
402	**කාර්යය මණ්ඩල වියදම්**		
402-1	**සේවක වියදම්**		
402-1-1-F	වැටුප් හා වේතන - ආරක්ෂක කාර්ය මණ්ඩල		
402-1-1-G	Salaries & Wages - Supply Staff a/c		
402-1-1-H	වැටුප් හා වේතන - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල	20,210,662.49	
402-1-2-H	අතිකාල හා නිවාඩු දීමනා - රියදුරු	2,680,942.10	
402-1-3-H	ජීවනාංක දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල	4,418,298.63	
402-1-4-H	ගමන් වියදම් දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල	26,205.00	
402-1-5-A	වෙනත් විශේෂ දීමනාව - ධාවන කාර්යය මණ්ඩල	22,900.00	
402-1-5-H	වෙනත් විශේෂ දීමනාව - රියදුරු අභ්‍යාස විද්‍යාල කාර්යය මණ්ඩල	6,541,511.07	
402-1-9	වෛද්‍ය බිල්පත්	48,771.00	
402-1-12	සේවක අර්ථසාධක අරමුදල්	3,215,603.57	
402-1-13	සේවක භාරකාර අරමුදල්	801,873.56	
			37,966,767.42
			37,966,767.42

402-2	**පරිපාලන සහ ආයතනික වියදම්**			
402-2-1	අලුත්වැඩියා සහ නඩත්තු (ගරාජ් ගොඩනැගිල්ල)		17,165.00	
402-2-2	ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ නඩත්තු		327,582.00	
402-2-3	අලුත්වැඩියාව සහ නඩත්තුව - නිල වාහන		1,743,698.76	
402-2-4	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු		7,481.50	
402-2-5	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය		357,017.90	
402-2-6	කුලී හා නඩත්තු		1,300.00	
402-2-7	දුරකතන		235,001.02	
402-2-8	විදුලිය		580,613.13	
402-2-9	ජලය		121,562.86	
402-2-10	වාර්ෂික ප්‍රසාද දීමනා		840,000.00	
402-2-11	විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික		3,196,490.00	
402-2-12	වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම		-	
402-2-13	නීති වියදම්	සටහන - 18.7	-	
402-2-14	සේවක සුභසාධන		33,925.00	
402-2-15	කරුණාසහගත දීමනා		-	
402-2-16	සේවක වන්දි		-	
402-2-17	පොලිස් ආරක්ෂක වියදම්		-	
402-2-18	සුනාමි බස්රථ සඳහා වියදම්		-	
402-2-19	ඉන්ධන තෙල් හා ලිහිසි (වක්‍ර වියදම්)		10,919,310.00	
402-2-20	සංග්‍රහ වියදම්		894,294.00	
402-2-21	වෙනත් වියදම්		754,225.27	
402-2-22	බොල්ණය ගිණුම		-	
402-2-23	ප්‍රචාරණ වියදම		-	
402-2-24	රක්ෂණ - වෙනත් වාහන		353,255.08	
				20,382,921.52
				20,382,921.52
402-4	**මූල්‍ය පිරිවැය**			
402-4-2	බැංකු ගාස්තු		7,347.75	
				7,347.75
				7,347.75
				-
	මුළු වියදම			58,653,736.69
	ශුද්ධ ලාභය (/අලාභය)			(21,687,411.41)
	රියදුරු පුහුණු පාසල් ලාභය සහ අලාභය			41,409,003.98
	රියදුරු පුහුණු පාසල් මුළු ලාභය සහ අලාභය			19,721,592.57

22. ඉන්ධන පිරවුම්හල් - ලාභ සහ අලාභ ප්‍රකාශය

	ලාභ සහ අලාභ ප්‍රකාශය			31.12.2023 රු.
	විකුණුම්			453,047,652.40
	ආරම්භක ශේෂය - ඩීසල්	5,877,427.13		
	ආරම්භක ශේෂය - පෙට්‍රල්	2,570,644.19		
	ආරම්භක ශේෂය - ලිහිසි	176,524.27		
			8,624,595.59	
	එකතු කිරීම්			
	මිලදී ගැණුම් - ඩීසල්	258,214,410.30		
	මිලදී ගැණුම් - පෙට්‍රල්	192,247,723.19		
	මිලදී ගැණුම් - ලිහිසි	1,217,387.13		
			451,679,520.62	
			460,304,116.21	
	අවසාන ශේෂය - ඩීසල්	149,671.97		
	අවසාන ශේෂය - පෙට්‍රල්	697,600.66		
	අවසාන ශේෂය - ලිහිසි	774,229.83		
			(1,621,502.46)	
				(458,682,613.75)
	දළ ලාභය			(5,634,961.35)
	වෙනත් ආදායම්			
303-7	පොළී ආදායම	35,625.00		
303-22	ඉන්ධන තොගයේ අතිරික්තය/ (ඌනතාවය)	(12,517.94)		
303-23	අබලි ද්‍රව්‍ය විකුණුම්	750.00		
			23,857.06	23,857.06
				(5,611,104.29)
	පරිපාලන වියදම්			
402-1-1-C	වැටුප් හා වේතන - ඉංජිනේරු කාර්යය මණ්ඩල	2,997,212.62		
402-1-2-C	අතිකාල හා නිවාඩු දීමනා - ඉංජිනේරු කාර්යය මණ්ඩල	1,438,179.32		
402-1-3-C	ජීවනාංක දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල	678,600.00		
402-1-5-C	වෙනත් විශේෂ දීමනාව - ඉංජිනේරු කාර්යය මණ්ඩල	793,748.18		
402-1-12	සේවක අර්ථසාධක අරමුදල්	295,336.71		
402-1-13	සේවක භාරකාර අරමුදල්	137,570.66		
402-2-1	අලුත්වැඩියා සහ නඩත්තු (ගරාජ් ගොඩනැගිල්ල)	810.00		
402-2-2	ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ නඩත්තු	39,675.00		
402-2-4	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු	57,550.00		
402-2-5	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	21,705.00		
402-2-6	කුලී හා නඩත්තු	229,326.84		
402-2-7	දුරකතන	88,450.49		
402-2-8	විදුලිය	532,274.30		
402-2-14	ජලය	22,835.00		
402-2-19	ඉන්ධන තෙල් හා ලිහිසි (වක්‍ර වියදම්)	234,460.41		
			7,567,734.53	
	මූල්‍ය වියදම්			
402-4-2	බැංකු ගාස්තු	22,256.41		
402-4-5	වෙනත් මූල්‍ය වියදම්	-	22,256.41	
			7,589,990.94	
	මුළු පිරිවැය			(7,589,990.94)
	ශුද්ධ ලාභය			(13,201,095.23)

23. රජයේ ප්‍රදාන සහ සහනාධාර

ගිණුම් කේතය	විස්තරය	31.12.2023 රු.	31.12.2022 රු.
302-2-B	පුනරුත්ථාපනය සඳහා ප්‍රතිදාන	881,620,000.00	606,310,000.00
302-5-E	බස්රථ සඳහා රජයේ ප්‍රදාන	470,905,379.63	-
302-6-F	රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	38,091,233.70	35,462,800.76
	එකතුව	**1,390,616,613.33**	**641,772,800.76**

මගේ අංකය எனது இல. My No. } සිඔවි/ඒ/එස්එල්ටීබී/එෆ්ඒ/2023/03 මෙම අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 ජූනි 07 දින

සභාපති

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 අභිතකර මතය සඳහා පදනම

(අ) මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ආකෘතිමය රාමුව අනුව වත්කම් හෝ ආදායම් අධික ලෙස ප්‍රකාශ නොකිරීම හා වගකීම් හෝ වියදම් අඩුවෙන් දැක්වීම නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අශෝක් ලේලන්ඩ් සමාගමට අයත් අධිසුඛෝපභෝගී බස් රථ අධිවේගී මාර්ගවල ධාවනය හේතුවෙන් උපයාගත් මාර්ග ලේඛන ආදායමෙන් වියදම් ලෙස අඩු කළ රු.647,383,565 ක වියදම, අශෝක් ලේලන්ඩ් සමාගමට ලාභ ලෙස ගෙවූ රු.347,621,164 ක මුදල හා එකී සමාගමට ගෙවිය යුතු රු.40,118,601 ක මුදල වශයෙන් එකතුව රු.1,035,123,330 ක මුදල හා විශේෂ චාරිකා සඳහා මණ්ඩලයේ බස් රථ වෙනුවට ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ බස් රථ යොදවා ඉපයූ ආදායමෙන් අශෝක් ලේලන්ඩ් සමාගමට ලාභ වශයෙන් ගෙවූ රු.3,999,228 ක් හා වියදම් වශයෙන් ගෙවූ රු.3,446,420 ක් වශයෙන් වූ එකතුව රු.7,445,648 ක මුදල අවසන් ගිණුම්වල වියදම් හා වගකීම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතිය අනුව, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියළුම ගිණුම් සඳහා පෙර කාල සීමාව සම්බන්ධයෙන් සන්සන්දනාත්මක ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 21 හා 22 ලෙස ඉදිරිපත් කර තිබූ පිළිවෙලින් රියදුරු පුහුණු පාසල් හා ඉන්ධන පිරවුම්හලට අදාළ ලාභ හා අලාභ ගිණුම් සඳහා සන්සන්දනාත්මක ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතියෙහි 35 වගන්තිය ප්‍රකාර විදේශ විනිමය ලාභ හා අලාභ ප්‍රමාණාත්මක භාවයෙන් වැඩි නම් ගිණුමෙහි වෙනම වාර්තා කළ යුතු වූවද, අමතර කොටස් මිලදී ගැනීම් සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් නොකිරීමට එරෙහිව සැපයුම්කාර සමාගමක් විසින් පවරා තිබූ බෙරුම්කරණ නඩුවක් හේතුවෙන් සැපයුම්කරුට ගෙවීමට තිබූ මුදල හා පොලී මුදල් වලට අදාළ ඩොලර් වටිනාකම බෙරුම්කරණ තීන්දුව ප්‍රකාශයට පත් කළ 2019 මැයි 09 දිනැති නියෝගය අනුව නිරවුල් නොකිරීම මත හා එම මුදල් 2023 වර්ෂයේදී ගෙවීම් කිරීම හේතුවෙන් රුපියලේ අගය අවප්‍රමාණය මත අවප්‍රමාණික වටිනාකම ලෙස සැපයුම්කරුට වැඩියෙන් ගෙවීමට සිදුව තිබූ රු.462,892,919 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල වෙනම අනාවරණය කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) හි 35 වන වගන්තියට අනුව බදු වලින් පැන නගින මුදල් ප්‍රවාහයන් වෙනම අනාවරණය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද රු.145,000,000 ක බදු වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ අනාවරණය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 (LKAS 07) හි 20 (9) වගන්තියට අනුව වක්‍ර ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසීමේදී අදාළ කාල පරිච්ඡේදයෙහි කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ලෙස නොගයෙහි, ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂවල වෙනස් වීම පමණක් ගැලපිය යුතු වූවද, ජංගම නොවන වගකීම් යටතේ සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබූ ශේෂය වූ රු.1,860,824,837 ක ශේෂය පොත් වලින් ඉවත් කිරීමේදී එම ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ සාවද්‍ය ලෙස ගැලපීම් කර තිබුණි. ඒ හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් අඩු වී තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 73 ඡේදයට අනුව දේපල, පිරියත හා උපකරණවල ඵලදායී ජීව කාලය හෝ ක්ෂය ප්‍රතිශතය අවසන් ගිණුම් සටහන්වල හෙලිදරව් කළ යුතු වුවත් ප්‍රවර්තන වර්ෂය තුළදී පරිගණක මෘදුකාංග සියයට 33.33 ක ප්‍රතිශතයකින් රු.3,275,225 ක වටිනාකමට, ටිකවී යන්ත්‍ර සියයට 25 ක ප්‍රතිශතයකින් රු.5,192,034 ක වටිනාකමට, වායුසමන යන්ත්‍ර සියයට 10 ක ප්‍රතිශතයකින් රු.1,676,088 ක වටිනාකමට හා වෙනත් වත්කම් සියයට 10 ක ප්‍රතිශතයකින් රු.5,362,939 ක වටිනාකමට ක්ෂය කර තිබූ නමුත්, එම වත්කම්වල ක්ෂය ප්‍රතිශතයන් අවසන් ගිණුම් සටහන් තුළ හෙලිදරව් කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 07 ඡේදයට අනුව දේපල, පිරියත හා උපකරණයක පිරිවැය වත්කමක් ලෙස හඳුනා ගැනීමට නම් එම වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වය තුළට ජනිත කරවීමේ හැකියාවක් පැවතිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගිණුම්ගත කර තිබූ රු.1,367,754,792 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස අබලි වූ බස් රථ සහ රු.1,041,195 ක් වූ භාවිතයට ගත නොහැකි ලෙස අබලි වූ අනෙකුත් වාහන තවදුරටත් දේපල, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් වූ උපලේඛන ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 37 වන ඡේදයට අනුව ආයතනයක දේපළ, පිරියත හා උපකරණ කාණ්ඩ ගත කළ යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දිනට රු.75,842,984 ක් වටිනා වත්කම් කාණ්ඩය හඳුනා නොගත් වෙනත් වත්කම් ශේෂයක් පවතින අතර, ඉදිරිපත් කර තිබූ එම වත්කම්වලට අදාළ පිරිවැය, සමුච්චිත ක්ෂය, වාර්ෂික ක්ෂය වටිනාකම හා ධාරණ අගය වෙනම දක්වා නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 31 වන ඡේදයට අනුව වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් පසු එම වත්කමේ ආයු කාලය තුළ සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩුකිරීමෙන් පසු එකී වත්කමේ සාධාරණ අගය විශ්වාසනීයව මැනිය හැකි විට එම වත්කම අයිතමයක් ලෙස හෝ සමූහයක් ලෙස නැවත තක්සේරු කළ යුතුය. නමුත් 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුවූ ශුද්ධ අගය රු.1,000 ක් වූ බස් රථ 2,715 ක්, කල්බදු බස් රථ 2,586 ක් හා එන්ජින් 1,305 ක් ගිණුම් තුළ පෙන්වා තිබුණද එම බස් රථ වලින් සියයට 83 ක් වර්තමානය වන විට ධාවන කටයුතුවල නිරත බැවින්, ධාවනයට යොදවා තිබූ එම බස් රථවල සාධාරණ අගය ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 (LKAS 18) අනුව සේවා සැපයීම සම්බන්ධයෙන් වූ ගණුදෙනු මත ආදායමේ ප්‍රමාණය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට හා ගණුදෙනුව සම්බන්ධව ආර්ථික ප්‍රතිලාභ පවතින බවට හා ඒවා ආයතනය තුළට ගලා එන විට, වාර්තා කරන කාලය අවසානයේ ගණුදෙනුව අවසන් කිරීමේ අදියර විශ්වාසදායක ලෙස මැනිය හැකි වීම අනුව වෙනම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත්, අශෝක් ලේලන්ඩ් සමාගමේ බස් රථ යොදවා අධිවේගී මාර්ගවල ශ්‍රී ලංගමයට අයත් ගමන් වාර ආවරණය කිරීම තුළින් 2023 වර්ෂයේදී මාර්ග ලේඛන ආදායම් ලෙස රැස් කර ගත් රු.1,019,797,453 ක මුදල හා විශේෂ චාරිකා අවරණය වෙනුවෙන් උපයාගත් රු.7,499,648 ක ආදායම වශයෙන් එකතුව රු.1,027,297,101 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS 19) අනුව විශ්‍රාම ප්‍රතිලාභ ගිණුම් තැබීමේදී පාරිතෝෂික ගිණුම් තැබීම සඳහා නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්මට අනුව හා විධිමත් සමීකරණයකට අනුව වර්තමාන සේවා පිරිවැය හා පාරිතෝෂික වෙන් කිරීම් වර්තමාන වටිනාකමට ගණනය කර තිබූ නමුත්, 2023 ජනවාරි 01 දිනට සැලසුම් වගකීම් (Plan Liability) ගිණුමේ ශේෂයට උපචිත පොලිය වන රු.1,037,220,225 ක මුදල සහ ආයුගණක ලාභය (Actuarial Gain) වන රු.90,742,519 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල වෙන වෙනම අනාවරණය කර නොතිබුණු අතර, එම අගයන් දෙකෙහි ශුද්ධ අගය වන රු.946,477,706 ක මුදල විශ්‍රාම ප්‍රතිලාභ ඌනතාවයක් ලෙස අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය තුළ සෑම ඩිපෝවක්ම ආවරණය වන පරිදි සියළු ඩිපෝවන් විසින් රැස් කරන ලද දෛනික ආදායමෙන් රු.20,000 සිට රු.30,000 දක්වා වූ මුදලක් පාරිතෝෂික ගෙවීම් සඳහා වූ අරමුදලකට බැර කර රු.916,047,510 ක මුදලක් රැස්කර තිබූ අතර එම අරමුදලින් පාරිතෝෂික ගෙවීම් ලෙස රු.1,114,698,800 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ නමුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS 19) අනුව සැලසුම් වත්කමට

(Plan Assets) අදාළ වත්කමෙහි සාධාරන අගය (FV), වර්ථමාන අගය (PV), වර්තමාන සේවා පිරිවැය (Current Service Cost) හා ආයුසණක ලාභය (Actuarial l Gain) ප්‍රතිලාභ සැලැස්මට අනුව හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණි.

(ක) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 20(2) අනුව රාජ්‍ය ප්‍රදාන විලම්බිත ආදායම් හෝ රාජ්‍ය ප්‍රදාන ලෙස හඳුනාගෙන වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය පදනම් කර ගෙන තර්කානුකූල හා ක්‍රමානුකූල පදනමක් මත ක්‍රමක්ෂය කළ යුතු වුවද බස් රථ 500 ක් මිලදී ගැනීම සඳහා ඉන්දියානු ණය ප්‍රදාන යටතේ ලද හා දේශීය අරමුදල් ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලද රු.5,513,325,424 ක මුදල විලම්බිත ආදායම් ලෙස හෝ රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම්ගත කර මිලදී ගනු ලැබූ වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය වන වසර 08 පදනම් කර ක්‍රමක්ෂය කරන ලද වටිනාකමින් රු.218,260,298 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඛ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 (LKAS 36) අනුව අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයට නෛතික බැඳීමක් පවතින්නේ නම්, එම බැඳීම් පියවීම පිණිස මුදල් පිටතට ගලා යාම භව්‍ය බැවින් හා එම බැඳීමේ ප්‍රමාණය ඇස්තමේන්තු කර ඇත්නම්, එම මුදල අසම්භාව්‍ය බැරකමක් ලෙස ගිණුම්ගත කළ යුතු වූවත්, සමාලෝචිත වර්ෂයේ මාර්ග අනතුරු හේතුවෙන් වන්දි ලෙස ගෙවිය යුතු රු.2,075,449,378 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම් ප්‍රකාශ තුළ අසම්භාව්‍ය බැරකමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ග) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 (LKAS 36) අනුව ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් ඇතුළතට ගලා ඒමක් භව්‍ය වන විටෙක මණ්ඩලය විසින් වාර්තා කරන දිනට තිබූ අසම්භාව්‍ය වත්කම් වල ස්වභාවයෙහි සංක්ෂිප්ත විස්තරයක් හා මූල්‍ය බලපෑමෙහි ඇස්තමේන්තුවක් ගිණුම්වල හෙළිදරව් කළ යුතු වුවත්, දැනට නෛතික කටයුතු ආරම්භකර තිබුණු 2015 වර්ෂයේ ජනාධිපතිවරණයේදී හිටපු ජනාධිපතිවරයාගේ ප්‍රචාරණ රැස්වීම් සඳහා සහභාගී වූ ජනතාව ප්‍රවාහනය කිරීම සඳහා ලබා දුන් ශ්‍රී ලංගම බස් රථ සඳහා ලැබිය යුතු හිඟ මුදල වන රු.142,523,600 ක මුදල සහ 2023 ජුනි 26 දිනැති බෙරුම්කරණ නියෝගයට අනුව සකෝලා ආයතනයට ගෙවිය යුතු බැරකම වෙනුවෙන් උසාවියේ තැන්පත් කරන ලද රු.236,569,639 ක මුදල් වත්කම ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ඝ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 (LKAS 38) අනුව පිරිවැය රු.36,426,972 ක් වූ පරිගණක මෘදුකාංග මූලික හඳුනා ගැනීමෙන් පසුව පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ අලාභහානි අඩු කර ගිණුම්ගත කළ යුතු වූවත්, 2020 සැප්තැම්බර් 08 හා 2020 ජනවාරි 13 මිලදීගෙන තිබූ පිළිවෙලින් රු.3,012,277 ක් හා රු.2,321,105 ක් වටිනා ගිණුම්කරණ

මෘදුකාංග පද්ධති අපේක්ෂිත ආයු කාලය අනුව ක්‍රමක්ෂය කිරීමකින් තොරව ක්ෂය කර තිබූ බැවින් මෙම මෘදුකාංග දෙකෙහි ක්ෂය වටිනාකම රු.959,661 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර, ඒ හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ච) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 (LKAS 38) හි 21 වගන්තිය අනුව වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට ඉඩ ඇති බව සහ වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවකදී පමණක් අස්පෘශ්‍ය වත්කම් හඳුනාගත යුතු වුවත් ජාතික පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ERP මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම වෙනුවෙන් 2022 මාර්තු මාසයේදී වෙන් කරන ලද රු.1,500,000 ක වටිනාකම ගෙවා නොතිබුණු නමුත් පරිගණක මෘදුකාංග ගිණුමට ඇතුළත් කර සමාලෝචිත වර්ෂයේදී රු.499,950 කට ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ඡ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට දේපල, පිරියත හා උපකරණ උපලේඛනය අනුව, බස් රථවල පිරිවැය 15,183,719,274 වූවද, අවසන් ගිණුම්වල එය රු.17,465,573,721 ක් ලෙස දක්වා තිබුණු බැවින් බස් රථවල පිරිවැය රු.2,281,854,447 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද 2014 ජූලි 25 වන දින මිලදී ගත් පිරිවැය රු.4,816,758 ක් වූ අශෝක් ලේලන්ඩ් ආසන 54 බස් රථයේ වටිනාකම දේපල, පිරියත හා උපකරණ උපලේඛනය තුළ ඇතුළත් කර නොතිබුණු බැවින් දේපල, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කර තිබූ දේපල, පිරියත හා උපකරණ උප ලේඛනයේ බස් රථ හැර වත්කම් අයිතම 06 කට අදාළ ශේෂයන් අවසන් ගිණුමේ සඳහන් වත්කම් ශේෂ හා සන්සන්දනය කිරීමේදී දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.406,356,901 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඣ) ඉන්දියානු ණය නියම ගිවිසුම යටතේ ගමනාගමන මණ්ඩලය සඳහා ආසන 32 නව බස් රථ 500 ක් මිලදී ගැනීමට ඉන්දියානු එක්සිම් බැංකුව විසින් වෙන් කර තිබූ ඇමරිකන් ඩොලර් මිලියන 15.03 කින් උපයෝජනය කරන ලද ඇමරිකන් ඩොලර් 13,331,250 කට අදාළ රුපියල් වටිනාකම හා බස් රථ මෙරටට ගෙන්වීම සඳහා දරණ ලද ගුදම් ගාස්තු ඇතුළු බස් රථ වර්තමාන තැනට හා තත්ත්වයට පත් කිරීම දක්වා පිරිවැය වූ රු.5,513,325,424 හා ගිණුම්ගත වටිනාකම වූ රු.5,519,996,941 අතර වෙනස වශයෙන් මුළු වටිනාකම වූ රු.671,517 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ප්‍රාග්ධන වත්කම් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ට) දේපල, පිරියත හා උපකරණ උපලේඛනයට අනුව ගොඩනැගිලි සහ බස් රථ සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.60,479,551 ක් හා රු.878,395,273 ක් වූවද අවසන් ගිණුම් තුළ එය රු.59,791,800 ක් හා රු.874,811,245 ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.687,751 ක් හා රු.3,584,028 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය හා දේපල, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් වැඩි වී තිබුණි.

(ඨ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය වූ රු.91,281,307 ක වටිනාකම තුළ වසර 10 කට වඩා පැරණි රු.25,431,648 ක ශේෂයක් ද, වසර 05 ත් 10 ත් අතර වූ රු.48,493,282 ක ශේෂයක්ද හා වසර 02 ත් 05 ත් අතර රු.2,550,136 ක ශේෂයක්ද, ණයගැති වයස් විශ්ලේෂණය හඳුනා නොගත් රු.10,092,048 ක ශේෂයන් ද පැවතුණි. එම ලැබිය යුතු ශේෂයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී හානිකරන අලාභ සඳහා ප්‍රතිපාදනයන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) 2023 වර්ෂයේ යුධ හමුදා සහ ගුවන් හමුදා ගමන් බලපත්‍ර ආදායම් ගිණුමෙහි පෙර වර්ෂයන්ට අදාළව ලද එකතුව රු. 35,361,791 ක මුදලක් ණයගැති ශේෂයට හිලව් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස සටහන් කිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර ඊට අදාළ ණයගැති ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ඪ) ඌව ප්‍රාදේශිකයට අයත් තණමල්විල ඩිපෝව විසින් ඉන්ධන මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස 2023 දෙසැම්බර් 05 දින නිකුත් කරන ලද වටිනාකම රු.2,138,829 බැගින් වූ චෙක්පත් 02 හි වටිනාකම වන රු.4,277,658 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල ණයහිමි ශේෂය තුළ හර ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබූ අතර, අත්තිකාරම් ශේෂය ද අඩුවෙන් දක්වා තිබුණි.

(ණ) මහරගම ඩිපෝව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට බැංකු ශේෂ සනාථ අනුව ශේෂය රු.75,684,839 ක් වූවද අවසන් ගිණුම්වල එය රු.79,964,948 ක් ලෙස පෙන්වීම හේතුවෙන් අවසන් ගිණුම් වල පෙන්වා තිබූ මුදල් ශේෂය රු.4,280,109 කින් වැඩියෙන් පෙන්වා තිබුණි.

(ත) තණමල්විල ඩිපෝව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යන ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂ සනාථ අනුව අවසන් ශේෂය රු.375,044 ක වාසිදායක ශේෂයක්ව පැවති අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල එය අවාසිදායක ශේෂයක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් අවසන් ගිණුම්වල නිරූපණය වන ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය දෙගුණයකින් එනම් රු.750,088 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ථ) නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලයේ හා මඩකලපුව ඩිපෝව තුළ පවත්වාගෙන යන බැංකු ගිණුම් ශේෂ 05 ක රු.759,227 ක හර ශේෂය හා රු.4,585,117 ක අයිරා ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් තුළ ජංගම බැංකු ගිණුම් ශේෂ ලෙස නිරූපණය කළද, එම ශේෂ වැරදි ගිණුම් සටහන් හේතුවෙන් සිදු වූ සාවද්‍ය ශේෂයන් බැවින් අවසන් ගිණුම් වල සත්‍ය මුදල් ශේෂය රු.3,825,890 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ද) බදුල්ල, මහියංගනය, කැප්පෙටිපොල, මූතූර් හා කාත්තන්කුඩි ඩිපෝවල පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල මුදල් ගිණුමට අනුව පැවතිය යුතු අයිරා ශේෂ අවසන් ගිණුම් වල අඩුවෙන් පෙන්වීම හේතුවන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම්වල පෙන්වා තිබූ එකතු අයිරා ශේෂය රු.14,789,142 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ධ) මන්නාරම ඩිපෝව, මහරගම ඩිපෝව හා මධ්‍යම බස් රථ කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල මුදල් පොතට අනුව පැවතිය යුතු අයිරා ශේෂ අවසන් ගිණුම්වල වැඩියෙන් පෙන්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම්වල පෙන්වා ඇති අයිරා ශේෂය රු.6,453,619 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(න) 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ උපලේඛනයට අනුව ජංගම ගිණුම් හර ශේෂය රු.566,252,078 ක් වුවද අවසන් ගිණුම්වල එය රු.1,082,572,294 ක් ලෙස පෙන්වා තිබූ බැවින් අවසන් ගිණුම් ශේෂය රු.516,320,216 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ප) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට නිරන්තරයෙන් මෙහෙයුම් කටයුතු සඳහා උපයෝජනය නොවන රු.මිලියන 10 ඉක්මවූ බැංකු ජංගම ගිණුම් 09 ක රු.156,294,791 ක ශේෂයක් පවතින බව නිරීක්ෂණය වූ අතර, කිසිදු පොලී ආදායමක් උපයා නොගෙන එම මුදල් ජංගම ගිණුම්වල රඳවා තබා ගෙන තිබුණි.

(ඵ) මණ්ඩලයේ ඩිපෝවන්, ප්‍රාදේශීය කාර්යාල, ප්‍රාදේශීය වැඩපොල හා රියදුරු අභ්‍යාස විද්‍යාල මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු සම්බන්ධව අදාළ මූල්‍ය ආයතන විසින් 2023 දෙසැම්බර් 31 දිනට විගණනය සඳහා ලබා දී තිබූ සෘජු ශේෂ සනාථ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ගිණුම් 60 ක රු.740,984,457 ක ශේෂයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් ගිණුම්වල එය රු.724,572,282 ක් ලෙස පෙන්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පත් ශේෂය රු.16,412,175 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

මෙම ඌන ශේෂය තුළ මහරගම ඩිපෝව මගින් මහරගම මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.15,000,000 ක ස්ථාවර තැන්පතුවක් ද තිබුණි.

(ඛ) මණ්ඩලය සතුව තිබූ රු.740,484,457 ක් වටිනා ස්ථාවර තැන්පතු වලින් තැන්පතු 57 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා උපචිත පොලිය වන රු.34,889,365 ක මුදල උපචිත පොලී ආදායම් ලෙස සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(භ) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ 2022 වර්ෂයට අදාළ සන්සන්දනාත්මක ගිණුම් ප්‍රකාශයේ පරිපාලන වියදම් ශේෂය තුළ පාරිතෝෂික ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.937,486,487 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ සන්සන්දනාත්මක මූල්‍ය ප්‍රකාශයේ පරිපාලන වියදම් වල අඩුවෙන් පෙන්වා තිබීම හේතුවෙන් 2023 වර්ෂයේ සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ම) 2022 දෙසැම්බර් 31 දිනට සන්සන්දනාත්මක මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය සඳහා ලාභය ලෙස පෙන්වා තිබූ ශේෂය රු. 484,219,604 ක් වූවද, සන්සන්දනාත්මක විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා තිබූ ලාභය රු.1,421,706,096 ක් විය. ඒ අනුව සංශෝධිත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ලාභය ලෙස පෙන්වා තිබූ වටිනාකම හා පෙර වර්ෂයේ ලාභය අතර වෙනස වූ රු.937,486,492 ක වටිනාකම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් හර ශේෂය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ය) සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ ආදායමට එරෙහිව හඳුනාගත් වාර්ෂික ක්ෂය ප්‍රමාණය රු.1,025,070,337 ක් වූවද මණ්ඩලය විසින් වක්‍ර ක්‍රමයට සකසා තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පසු ලාභයට ගලපා තිබූ ක්ෂය ප්‍රමාණය රු.906,605,923 ක් වූයෙන් වාර්ෂික ක්ෂය වියදම රු.118,464,414 ක් අඩුවෙන් ගලපා තිබුණි.

(ර) සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද පෙර වර්ෂයේ ගැලපීම් වටිනාකම වූ රු.892,145,839 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පෙර ලාභයට සාවද්‍ය ලෙස ගැලපීම් කර තිබුණු බැවින් මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ල) සමාලෝචිත වර්ෂය තුළදී අමතර කොටස්වල සහ ඉන්ධන තොගයේ අතිරික්ත වටිනාකම වූ රු.6,544,593 ක් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ යටතේ ගිණුම්ගත කිරීම තුළින් අදාළ කාල පරිච්ඡේදයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැඩි වී තිබුණි.

(ව) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්වල ප්‍රසාද දීමනා සඳහා වෙන් කිරීම් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ ගිණුම්වල සංශෝධිත සන්සන්දනාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි 2022 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ශේෂය තුළ ප්‍රසාද දීමනා සඳහා වෙන් කිරීමක් ලෙස රු.82,500,000 ක මුදලක් පෙන්වා තිබුණි.

(ශ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතු වටිනාකම රු.1,555,782,185 ක් වූ වත්කම් හා බැරකම් ශේෂවල ඇතුළත් රු.1,290,782,782 ක වටිනාකමින් යුත් ක්‍රියාත්මක නොවන ගිණුම් ශේෂ සඳහා ශේෂ තහවුරු කිරීම් සඳහා විස්තරාත්මක උපලේඛණ ද, රු.23,406,250 ක වටිනාකමින් යුත් ලංකා අශ්වක් ලේලන්ඩ් ආයතනයේ කොටස් ආයෝජන සඳහා කොටස් සහතික සහ වෙළඳපොල වටිනාකම් ගණනය කිරීම් පිළිබඳ විස්තර ද, රු.190,302,122 ක වටිනාකමින් යුත් සේවක කොටස් ප්‍රාග්ධනය සඳහා කොටස් සහතික හා හිමිකම් පිළිබඳ උපලේඛණ ද, රු.51,291,031 ක වටිනාකමින් යුත් මාර්ගස්ථ මුදල් සඳහා විස්තරාත්මක උපලේඛණ හා ශේෂ සනාථ ලිපි ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ෂ) ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගම විසින් 2019 වර්ෂයේ පවරන ලද බෙරුම්කරණ නඩු තීන්දුවට අදාළව දස දෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩලයක් මගින් ඒකල ගබඩාවේ භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර තිබූ අතර, 2019 නොවැම්බර් 04 දින ඉදිරිපත් කර තිබූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව එකී සමාගමට අයත් ඒකල ගබඩාවේ තිබූ භාවිතයට ගත නොහැකි හා ප්‍රති අපනයනයට තිබූ තොගවල වටිනාකම ඇමරිකන් ඩොලර් 874,593 ක් විය. එම තොගවල රුපියල් අගය එදිනට තොග අගය කළ ඩොලරයේ වටිනාකම වන රු.181.38 ට අනුව රු.158,633,738 ක් වූ අතර, එම මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගැනීමට හෝ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ස) මණ්ඩලයට අයත් මධ්‍යම බස් රථ නැවතුම්පලේ ඇති වර්ග අඩි 8,228 ක වපසරියකින් යුත් ගොඩනැගිල්ලක් වාර්ෂිකව ගිවිසුම් අළුත් කිරීමකින් තොරව හා විධිමත් තක්සේරුවකින් තොරව බදු දී තිබීම හේතුවෙන් 2013 සැප්තැම්බර් 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු හිඟ මුදල වන රු.4,000,000 හා 2017 ජනවාරි 01 දින සිට 2023 පෙබරවාරි 08 දින දක්වා ලැබිය යුතු රු.26,560,560 ක හිඟ මුදල වශයෙන් වූ එකතුව රු.30,560,560 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(හ) රත්මලාන ඉන්ධන පිරවුම් හලේ දෛනික තොග සහ විකුණුම් වාර්තාවන්ට අනුව 2023 වර්ෂය තුළදී නිකුත් කර තිබූ ඉන්ධන තොග වටිනාකම රු.453,925,605 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉන්ධන විකුණුම් ආදායම ලෙස රු.453,047,652 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.877,953 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ළ) විලම්බිත ආදායම් ලෙස හෝ රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම්ගත කළ යුතු ඌන විලම්බිත ආදායම හෝ රාජ්‍ය ප්‍රදාන මුදලින් සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය අඩු කිරීමෙන් පසු ලැබෙන රු.71,261,572 ක ශුද්ධ මුදල සමාලෝචිත වර්ෂයේ විලම්බිත ආදායම හෝ රාජ්‍ය ප්‍රදාන යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(අෆ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සන්සන්දනාත්මක ප්‍රකාශය තුළ 2022 වර්ෂයේ අවසන් දිනට සමුච්චිත අරමුදල් ශේෂය ලෙස ගිණුම්ගත කළ යුතු රු.24,993,653,069 ක හර ශේෂය සමාලෝචිත වර්ෂයේ ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද සන්සන්දනාත්මක ප්‍රකාශය තුළ රු.19,115,858,531 ක හර ශේෂයක් ලෙස දක්වා තිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ආරම්භක දිනට පෙන්වා ඇති සමුච්චිත අරමුදල් හර ශේෂය රු.5,877,794,538 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(අඅ) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරන ලද 2022 සන්සන්දනාත්මක විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ 2021 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද පාරිතෝෂික වෙන් කිරීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.500,687,941 ක පාරිතෝෂික අධි වෙන් කිරීම අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි. ඒ හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් එකතුව එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලේ හර ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(අඇ) සිසු සැරිය, නිසි සැරිය හා ගැමි සැරිය ධාවන කටයුතු වෙනුවෙන් ප්‍රතිපූර්ණය සඳහා රජය විසින් ගෙවනු ලබන මුදල් ජාතික ගමනාගමන කොමිෂන් සභාවට මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන බිල්පත්වලට අනුව ගෙවීම් කළ යුතු වූවත්, ගමනාගමන කොමිෂන් සභාව විසින් බස් රථ ධාවනය සඳහා ප්‍රාදේශීය කාර්යාල වෙත (රුහුණු ප්‍රාදේශීය කාර්යාලය හැර) 2023 වර්ෂය සඳහා ගෙවිය යුතු හිඟ ශේෂයන් වූ පිළිවෙලින් රු.135,429,430 ක්, රු.11,716,992 ක් හා රු.112,949 ක් වශයෙන් එකතුව රු.147,259,371 ක මුදල 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අවසන් ගිණුම්වල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(අඅ) බස් රථ ඇණිය වැඩිදියුණු කිරීම, ආයතනික සංවර්ධනය සහ ධාරිතාව ඉහළ නැංවීමට එන්ජින් කට්ටල මිලදී ගැනීම සඳහා මණ්ඩලයට වැය විෂය අංක 117-2-27-1-2201 මගින් ප්‍රාග්ධන වැය යටතේ රු.මිලියන 2,000 ක් සමාලෝචිත වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන් කර තිබූ අතර, එකී මුදලින් වැය කර තිබූ මුදල රු.916,360,000 ක් වූවද 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම්වල එය රු.881,620,000 ක් ලෙස පුනරුත්ථාපන ප්‍රදාන යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.34,740,000 ක මුදලක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(අආ) ඇමරිකානු ඩොලර් මිලියන 318 ක ණය මාලාවේ ශේෂව තිබූ අරමුදල් මගින් ශ්‍රී ලංගමය සඳහා බස් රථ 600 ක් මිලදී ගැනීමේ කාර්යය සඳහා වැය ශීර්ෂ අංක 117-2-27-3-2101-0/17 යටතේ දේශීය වියදම් ප්‍රතිපූරණය සඳහා භාණ්ඩාගාරය මගින් වෙන් කර තිබූ රු.මිලියන 770 න් සමාලෝචිත වර්ෂය සඳහා වැය කර ඇති රු.690,774,614 ක මුදලින් බස් රථ මිලදී ගැනීම සඳහා රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම් කර තිබූ මුදල රු.470,905,380 කි. මේ අනුව රු.219,869,234 ක් රාජ්‍ය ප්‍රදාන අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(අඇ) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අවසන් ගිණුම්වල සංචිත යටතේ පෙන්වා තිබූ වර්ෂ ගණනාවක සිට මෙහෙයුම් කටයුතු සිදු නොවන රු.6,221,004 ක වටිනාකමින් යුත් රක්ෂණ සංචිත, කම්කරු වන්දි සංචිත, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් හා ගමන් ප්‍රවේශපත් අරමුදල වශයෙන් ශේෂයන් 04 ක් පැවතුණි.

(අඈ) සමාලෝචිත වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය මගින් පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර ප්‍රතිපූර්ණය සඳහා මණ්ඩලය වෙත වෙන්කර තිබූ මුදල් ප්‍රතිපාදන වලින් ලැබී තිබූ රු.මිලියන 270 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(අඉ) ඉන්දියානු ණය ප්‍රදාන යටතේ මිලදී ගන්නා ලද බස් රථවල දෛනික ආදායමෙන් රු.5,500 ක මුදලක් දෛනිකව ප්‍රාදේශීය කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලයේ ගිණුමකට මාරු කර අරමුදලක් ස්ථාපනය කර තිබූ අතර, ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අරමුදල රු.443,065,080 කින් වර්ධනය කර ගෙන තිබූ අතර, මෙය අවසන් ගිණුම්වල වෙනම හෙළිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමය.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. ඉහත සඳහන් අහිතකර මතය සඳහා වන කොටසේ විස්තර කර ඇති පරිදි, වාර්ෂික වාර්තාවේ ඇති ප්‍රමාණයන් හෝ වෙනත් අයිතම සම්බන්ධයෙන් අනෙකුත් තොරතුරු, එම හේතු නිසාම ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරමි.

මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ (අ) සිට (ද) දක්වා ව්‍යාවනය කළ මතය සඳහා

පදනම කොටසේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නැත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති,රීති රෙගුලාසි හා විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 15 වන වගන්තිය	2023 වර්ෂය සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය i. මුදල් රෙගුලාසි 105	අලාභ හානි සම්බන්ධව අය කර ගත හැකි උපරිම අගය හා අය කර ගත යුතු මුදල තීරණය කළ යුතු වුවත් පිරිවැය රු.1,041,195 ක් වටිනා හානි වූ මෝටර් වාහන සම්බන්ධයෙන් යටෝක්ත මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොමැති අතර, 2022 මැයි 09 දින සිදුවූ කලබලකාරී සිද්ධියේදී හානියට පත් බස් රථ හා වාහන වටිනාකම වූ රු.12,136,724 ක මුදල සම්බන්ධයෙන් ද මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

ii.	මුදල් රෙගුලාසි 177	රාජ්‍ය ආදායමේ කොටසක් වශයෙන් හෝ නොඑසේ නම් තම තමන්ට ලැබෙන මුළු මුදලම දිනපතා හෝ හැකිතාක් කලින් හෝ ප්‍රේෂණය කොට එම මුදලට කුවිතාන්සි ලබා ගැනීම රජය වෙනුවෙන් කවර මුදලක් වුවද ලබන සියළු එකතු කරන නිලධාරීන්ගේ රාජකාරිය වුවද පරීක්ෂාවට භාජනය කළ 2023 මැයි මාසයේදී කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවය මගින් බස් රථ වලින් එකතු කරන ලද රු.4,257,900 ක වටිනාකමින් යුත් බස් රථවල දෛනික ආදායම් දින 1-3 කට වඩා ප්‍රමාද වී බැංකුගත කර තිබුණි.
iii.	මුදල් රෙගුලාසි 208 (ඇ)	නිසි ගණන්දීමේ නිලධාරියාගේ පූර්ව අනුමැතියකින් තොරව, වාර්ෂික විසර්ජන පනත හරහා වෙන් කර තිබූ ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා පමණක්ම යෙදවිය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ බස් රථ පුනරුත්ථාපනය සඳහා ලබා දුන් රු.34,740,000 ක මුදල විධිමත් අනුමැතියකින් තොරව වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි.
iv.	මුදල් රෙගුලාසි 387	චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු අතර, කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනීම තහනම් වුවත්, මණ්ඩලය විසින් 2023 දෙසැම්බර් 31 දිනට රු.548,969,542 ක අයිරාවක් පවත්වාගෙන තිබූ අතර, ඒ සඳහා අයිරා පොලිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.907,131 ක මුදලක් ගෙවා තිබුණි.
v.	මුදල් රෙගුලාසි 395 (ඇ)	බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවත් හර ශේෂ වටිනාකම රු.525,443,654 ක් වූ ජංගම ගිණුම් 10 ක සහ රු.9,794,929 ක අයිරා ශේෂ සහිත ජංගම ගිණුමක

		බැංකු සැසඳුම් ප්‍රකාශ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.
vi.	මුදල් රෙගුලාසි 395 (ඈ)	2023 දෙසැම්බර් මස සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.19,247,645 කට අදාළ ඩිපෝ 05 ක හා ඉන්ධන පිරවුම් හල් දෙකක මුදල් නොවූ චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
vii.	මුදල් රෙගුලාසි 395 (ඉ)	2023 දෙසැම්බර් මාසය වෙනුවෙන් සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ සමඟ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු නමුත් රු.4,050,546 ක වටිනාකමකින් යුතු ඩිපෝ 03 ක සහ රත්මලාන ඉන්ධන පිරවුම් හලෙහි තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
viii.	මුදල් රෙගුලාසි 396 (අ) (i) හා (iii)	2023 දෙසැම්බර් 31 දින වන විට වලංගු කාලය මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.2,363,351 ක් වූ පහත සඳහන් ඩිපෝ සහ ආයතනවල ගෙවීම් සඳහා ඉදිරිපත් කළ චෙක්පත් 79 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
ix.	මුදල් රෙගුලාසි 450	ස්වකීය පාලනය යටතේ ඇති සෑම වැඩසටහනක් සම්බන්ධයෙන් පසුගිය මාසය සඳහා වූ වැය භාරය පිළිබඳ මාසික ප්‍රකාශයක් 170 වැනි භාණ්ඩාගාර ආකෘති පත්‍රයෙහි සකස් කොට එක් එක් මාසයේ 10 වැනි දිනට පෙර සෑම ගණන්දීමේ නිලධාරියෙකු විසින් ස්වකීය ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දී තිබූ රු.මිලියන 2,000 ක ප්‍රතිපාදනය උපයෝගී කර වැය කරන ලද රු.916,360,000 ක වැය පිළිබඳව මාසික ප්‍රකාශයක් සකස්කර ඉදිරිපත් කර නොතිබුණි.

	x. මුදල් රෙගුලාසි 486	තලංගම ඩිපෝව මගින් අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම වෙත 2023 වර්ෂය තුළදී ඉන්ධන ලබා දීම වෙනුවෙන් එම සමාගම විසින් ලබා දී තිබූ රු.1,511,560 ක වටිනාකමින් යුත් අංක 144266 හා අංක 144253 දරණ චෙක්පත් දෙක අගරු වී තිබූ බව නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳව මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXV වැනි පරිච්ඡේදයේ 6.1 හා 6.3 වගන්ති	රජයේ පිළිගත් එක් වෘත්තීය සමිති සම්මේලනයක් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු පූර්ණ කාලීනව සම්මේලනයේ කටයුතු සඳහා නිදහස් කළ හැකි අතර, එසේ මුදා හරිනු ලබන නිලධාරියෙකුට දිවයිනේ ඕනෑම ස්ථානයකට ගමන් කිරීම සඳහා නිදහස් දුම්රිය බලපත්‍ර සහ මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නිදහස් ප්‍රවේශ පත්‍ර ලබා දිය යුතු වූවත්, ඊට පටහැනිව මණ්ඩලය තුළ ක්‍රියාත්මකවන වෘත්තීය සමිති 08 ක් වෙනුවෙන් 2023 වර්ෂය සඳහා දිවයින පුරා ගමන් කළ හැකි විවෘත නිදහස් ගමන් අවසරපත් 138 ක් නිකුත් කර තිබූ අතර, ඒ තුළින් මණ්ඩලයට සිදුව ඇති පාඩුව රු.43,046,993 ක් විය. එසේම හුවමාරු පදනම මත දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් දුම්රිය නිදහස් ගමන් අවසරපත් 22 ක් වෘත්තීය සමිති සඳහා ලබා දීම තුළින් රජයට සිදු වූ පාඩුව රු.25,294,500 ක් වී තිබුණි.
(ඈ)	1983 අංක 12 දරන පාරිතෝෂික පනත	පනතේ විධිවිධාන අනුව සේවයෙන් ඉවත්වූ සේවකයන් හට ඔවුනට හිමි පාරිතෝෂික මුදල ඉවත් වූ දිනයේ සිට මාසයක් ඇතුළත ගෙවිය යුතු වූවද මීතොටමුල්ල ඩිපෝවේ සේවකයන් හට ඉවත් වූ දිනයේ සිට මාසයක් ඇතුළත පාරිතෝෂික ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් 2023 සැප්තැම්බර් 11 විගණිත දින වන විට පාරිතෝෂික අධිභාර වශයෙන් රු.459,729 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඉ)	2023 දෙසැම්බර් 04 දිනැති අංක ACT/5/5 දරන දේශීය ආදායම් කොමසාරිස් චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයට රු.93,129,750 ක වටිනාකමින් යුත් නිදහස් දුම්රිය ගමන් අවසර පත් 81 ක් ලබා දී තිබූ අතර, එම දුම්රිය නිදහස් අවසරපත් පුද්ගල නමකට නිකුත් කර තිබේ නම් හෝ එය රාජකාරී අවශ්‍යතාවය සඳහා නිකුත් කර රාජකාරී නිමාවෙන් පසු ආපසු භාරදී නොමැති අවස්ථාවන්හි එය භාරගත් පුද්ගලයා යටෝක්ත චක්‍රලේඛයට අනුව බද්දට යටත් වේ. එම දුම්රිය නිදහස් අවසර පතෙහි වටිනාකමේ මාසික අගය වන රු.95,813 ක වටිනාකම අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනයේදී සේවා නියුක්ති ප්‍රතිලාභ ලෙස ප්‍රමාණනය කර අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මණ්ඩලය විසින් මෙම අවසරපත් අවධිමත් ලෙස හා වාර්තා තබා ගැනීමකින් තොරව බෙදා හැර තිබුණු බැවින් එම අවසරපත් අයථා පරිහරණයටද යොමුවී තිබුණි.
(ඊ)	2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 හා 2006 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ	මණ්ඩලයේ ප්‍රාථමික මට්ටමෙන් ඉහළ තනතුරු වන I ශ්‍රේණිය VIIA ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල කටයුතු කරන කාර්යය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සකස් කර නොතිබූ අතර එකී චක්‍රලේඛය අනුව කාර්යය මණ්ඩලය අඟළ තනතුරු වලට අන්තර්ග්‍රහණය කිරීමකින් තොරව 2016 වර්ෂයේ සිට ඔවුන්ට වැටුප් හා දීමනා ගෙවනු ලබන අතර 2023 වර්ෂයේ දී පමණක් එකී කාර්යය මණ්ඩලයට වැටුප් හා දීමනා ලෙස රු.1,589,164,734 ක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි.
(උ)	දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්ගේ 2023 අප්‍රේල් 06 දිනැති අංක SEC/2023/E/02 චක්‍රලේඛය හා ඊට සම්බන්ධිත සංශෝධිත චක්‍රලේඛ හා ලිපි	පුද්ගල ආදායම් බද්ද සඳහා සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය මගින් වන ලැබීම් සහ ලාභ ගණනය කිරීමේදී එකී සේවා නියුක්තිකයා විසින් ලැබූ හෝ උපයන ලද ප්‍රතිලාභ ලෙස ඇතුළත් කළ යුතු මුදල් ප්‍රමාණනය කිරීමේදී දුරකතන දීමනා සහ පෞද්ගලික පරිහරණය සඳහා ලබා දී ඇති නිදහස් ගමන්

අවසරපත්වල වටිනාකම ඇතුළත්ව ගණනය කළ යුතු වුවත් මණ්ඩලයේ කාර්යය මණ්ඩලය සඳහා ආදායම් බද්දට යටත් ඉපයීම් නිවැරදිව ගණනය කර බදු වටිනාකම ගණනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.835,621 ක මුදලක් ආදායම් බදු ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

(උ) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය

ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, අයවැයගත ශේෂ පත්‍රය , අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අයවැයගත ප්‍රාග්ධන වියදම් ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඒ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021

මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සහ වාර්ෂික අයවැය ලේඛනයට සම්බන්ධිතව පුරෝකථනය කරන ලද ඉදිරි වර්ෂ 05ක් සඳහා සකස් කළ යුතු උපාය මාර්ගික සැලැස්ම චක්‍රලේඛ විධිවිධාන අනුව පිළියෙල කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂ සනාථ අනුව මණ්ඩලයේ ඩිපෝවන් සහ ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීම් ගිණුම් 24 ක රු. මිලියන 10 කට වැඩි ශේෂය ලෙස රු.2,554,915,542 ක මුදලක් පවත්වගෙන ගොස් තිබුණි. නමුත් එම මුදල ස්ථාවර තැන්පතුවල හෝ ආයෝජනය කර ඉහළ පොලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රථ ඇණිය ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාර හා ශ්‍රී ලංගම ප්‍රතිපාදන යොදා ගනිමින් යටිතුවර ප්‍රාදේශීය වැඩපල තුළ ඩිපෝවන් මගින් එවනු ලබන පැරණි එන්ජින් කට්ටල, පැරණි ගියර් පෙට්ටි, පැරණි ඉන්ධන පොම්ප, පැරණි ඉන්ධන විදින, සිලින්ඩර් හෙඩ්, පැරණි ස්ටාටර් මෝටර් සහ පැරණි ඕල්ටනේටර් අළුත්වැඩියා කර බස් රථවල සවි කර මුදා හැරීම සඳහා 2023 වර්ෂයට රු.මිලියන 396.60 ක් වෙන් කර පහත පරිදි ඒකක 3,480 ක නිෂ්පාදන ඉලක්කයක් ලබා දී තිබූ නමුත්, නිෂ්පාදනය කර තිබූ ප්‍රමාණය ඒකක 3,420 ක් විය. ඒ සඳහා වැය කර තිබූ මුදල රු.මිලියන 268.18 ක් වූ අතර, එයින් ප්‍රතිපාදන උපයෝජිත ප්‍රතිශතය සියයට 67 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී අපේක්ෂිත ඉලක්ක සම්පූර්ණ කිරීමට මණ්ඩලය අසමත්ව වී තිබුණි.

විස්තරය	මූල්‍ය හා නිෂ්පාදන ඉලක්කය		භෞතික, මූල්‍ය හා නිෂ්පාදන තත්ත්වය	
	මූල්‍ය (රු.මිලියන)	ඒකක	මූල්‍ය (රු.මිලියන)	ඒකක
පැරණි එන්ජින් කට්ටල	240.00	240	220.23	387
පැරණි ගියර් පෙට්ටි	72.00	240	30.86	218
පැරණි ඉන්ධන පොම්ප	45.00	360	13.39	462
පැරණි ඉන්ධන විදින	16.20	2,160	3.45	2,325
සිලින්ඩර් හෙඩ්	5.40	120	0.05	13
පැරණි ස්ටාටර් මෝටර්	9.90	180	-	-
පැරණි ඕල්ටනේටර්	8.10	180	0.20	15
එකතුව	396.60	3,480	268.18	3,420

(ඇ) 2019 මැයි 09 දිනැති බෙරුම්කරණ නියෝගයට අනුව ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් ආයතනය සඳහා නොගෙවූ බිල්පත් වලට ගෙවීම් කරන ලද රු.75,384,696 ක වට්නාකමින් යුත් ලැබීම් නියෝග 20 කට අදාළ තොග අයිතම් ගබඩා පොත්වලට ගෙන තිබූ අතර, එම අමතර කොටස් භාවිතා කරන ටාටා වර්ගයේ හා ලේලන්ඩ් වර්ගයේ පැරණි බස් රථ දැනට භාවිතයෙන් ඉවත්ව තිබූ බැවින්, නිශ්කාර්යව පැවති අතර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයෙහි රථ ඇණිය ආසන 51 ක් සහිත ND කාණ්ඩයට අයත් බස් රථ 02 කින් හා ආසන 39 ක් සහිත NB කාණ්ඩයට අයත් බස් රථ 67 කින් සමන්විත වන අතර, දෛනිකව සැලසුම් කළ ගමන් වාර සඳහා නියමිත පරිදි බස් රථ යෙදවීම තුළින් උපයා ගෙන තිබුණු දෛනික සාමාන්‍ය ආදායම රු.10,244,130 කි. නමුත් මණ්ඩලයේ දත්ත අනුව වාර්ෂිකව උපයා ගත හැකි ආදායම රු.මිලියන 3,178 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළ කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවය මගින් උපයා ගෙන තිබූ ආදායම රු.මිලියන 836.39 ක් විය. මේ අනුව රු.මිලියන 2,341.61 කින් උපයා ගත හැකි ආදායම අඩු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ බස් රථ සඳහා වැය කර ඇති ඉන්ධන වියදම රු.40,415,452,419 ක් විය. ශ්‍රී ලංගම රථ ඇණියට අළුතින් එක් කළ බස් රථ 500 ට අමතරව අනෙක් සියළුම බස් රථ වසර 05 කට වඩා වයසින් වැඩි බස් රථ වන අතර, මෙම බස් රථ වල ඉන්ධන පොම්පවල පවතින දුර්වලතාවය මත ඉන්ධන දහනය අධික බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධව සිදු කරන ලද භෞතික නියැදි පරීක්ෂාවකට අනුව අලුත්වැඩියා කරනලද ඉන්ධන පොම්පයකින් ධාවනය කළ හැකි කිලෝමීටර ප්‍රමාණය 3.8 සිට 4.0 ක පරාසයක වූ අතර මණ්ඩලයට අයත් සෑම ඩිපෝවක්ම බස් රථ වල ඉන්ධන තුලනය කරනුයේ ලීටරයකට කි.මී.2.5 ත් 3.1 ත් අතර පරාසයක බැවින්, ඉන්ධන තුලනය ලීටරයකට කිලෝමීටර් 3.8 ක ප්‍රමාණයකින් පවත්වා ගැනීමේදී ඉන්ධන ලීටරකින් ධාවනය වන කිලෝමීටර් ප්‍රමාණය 0.7 ක් එනම් සියයට 18 ක ප්‍රතිශතයකින් වැඩි විය යුතු අතර වාර්ෂික ඉන්ධන පිරිවැය රු.7,274,781,435 කින් අඩු කර ගත හැකිව තිබුණි.

(ඊ) අවිස්සාවේල්ල ඩිපෝවේ බස් රථ අළුත්වැඩියා කටයුතු සඳහා 2023 ජුනි, ජූලි හා අගෝස්තු මාසවල අමතර කොටස් මිලදී ගැනීම සඳහා රු.10,582,494 ක් වැය කර තිබුණි. දේශීය හදිසි මිලදී ගැනීම් සඳහා ඩිපෝ කළමණාකරණයට රු.50,000 ක උපරිමයකට යටත්ව අමතර කොටස් මිලදී ගැනීමට අත්තිකාරම් සීමාවක් ලබා දී තිබූ අතර, එම සීමාව කුමන අමතර කොටස් අයිතම් මිලදී ගැනීම සඳහා කොපමණ කාලයකට හා දිනකට ද යන්න සඳහන් කර නොතිබීම හේතුවෙන් එක් ගෙවීම් වවුචරයක් රු.50,000 ක සීමාවට යටත්ව ගෙවීම් වවුචර ඉදිරිපත් කරමින් 2023 ජුනි 02 දින පමණක් රු.691,470 ක් වටිනා අමතර කොටස් මිලදී ගෙන තිබුණි. ඊට අමතරව ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය අනුව ජාතික තරහකාරී ලංසු කැඳවීම් හරහා සිදු කළ යුතුව තිබූ අමතර කොටස් මිලදී ගැනීම් ද මිල සැඳහුම් ක්‍රමය යටතේ හදිසි මිලදී ගැනීම් ලෙස සිදු කර තිබූ අතර, පරීක්ෂාවට භාජනය කරන ලද 2023 ජුනි හා ජූලි මාසවල හිනෝ බස් රථ සඳහා අවශ්‍ය වෙළඳපොලේ එකක් රු.75,000 ක් වටිනා ටර්බෝචාජර් එකක් රු.120,000 බැගින් රු.360,000 කට ටර්බෝචාජර් 03 ක් රු.135,000 ක් වැඩිපුර ගෙවා මිලදී ගෙන තිබුණි.

(උ) සිවිල් ඉංජිනේරු අංශය විසින් ප්‍රධාන කාර්යාලයේ ඇති ජංගම පරීක්ෂණ අංශයේ වර්ග අඩි 1,410 ක පොළොව ටයිල් ඇල්ලීම ඇතුළු සිවිල් වැඩ රු.2,166,308 කට ඇස්තමේන්තු කර තිබූ අතර, ඒ සඳහා අවශ්‍ය භාණ්ඩ හා අමුද්‍රව්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය අනුව මිල සැදහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා මිලදීගත යුතු වුවත් ව්‍යාජ මිල කැඳවීම් මඟින් රු.873,563 කට මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීම තුළ ඇතුළත් භාණ්ඩ අයිතම් 08 ක වෙළඳපොල මිල ගණන් ප්‍රධාන කාර්යාලය අවට සැපයුම්කරුවන්ගෙන් අඩු මිලට ලබා ගත හැකිව තිබියදී, පිලියන්දල ප්‍රදේශයෙන් අදාළ ද්‍රව්‍ය මිලදී ගෙන එම ද්‍රව්‍ය හා භාණ්ඩ සඳහා රු.302,940 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි. මේ අනුව මණ්ඩලයට රු.302,940 ක මූල්‍යමය අලාභයක් සිදුව තිබුණි.

(ඌ) මණ්ඩලය විසින් ඩිපෝවල භාවිතා කරන GPRS ටිකට් යන්ත්‍ර සඳහා භාවිතා කරන තාපන (Thermal) කඩදාසි ටිකට් රෝල් මිලදී ගැනීම සඳහා මාස 03 ක අවශ්‍යතාවය පාදක කර ජාතික තරහකාරී ලංසුකරණ පරිපාටිය යටතේ මිලදී ගැනීමට ප්‍රසම්පාදනය කර තිබූ අතර, මිලදී ගන්නා ටිකට් රෝල් ප්‍රාදේශීය කාර්යාල හරහා මිලදී ගෙන ඩිපෝවන් වෙත බෙදා දෙන ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් නියෝග කර තිබුණි. එම උපදෙස් වලට පටහැනිව ඩිපෝ 24 ක් මඟින් රු.17,534,900 ක වටිනාකමින් යුත් ටිකට් රෝල් 161,110 ක් සෘජුව මිලදී ගැනීම හා ටිකට් රෝලක වෙළඳපොල මිල වූ රු.75 මිල සංශෝධනයකින් තොරව රු.108.84 ක මිලකට අදාළ සැපයුම්කරුගෙන් ටිකට් රෝල් 364,400 ක් මිලදී ගැනීම වෙනුවෙන් එකකට රු. 19.64 ක් බැගින් රු.7,156,816 ක් වැඩියෙන් ගෙවා තිබීම, නැවත මිල සංශෝධනයකින් තොරව අදාළ සැපයුම්කරු සමඟ පූර්ව එකඟ වූ මිලටම ටිකට් රෝල් 603,180 ක් මිලදී ගැනීම තුළ මණ්ඩලයට රු.11,846,455 ක අලාභයක් සිදුව තිබීමත්, ටිකට් රෝල් 1,000,000 ක් මිලදී ගැනීම සඳහා කැඳවූ ලංසු අනුව ඉදිරිපත් වී තිබූ ලංසු මිල වන රු.49.65 කට ටිකට් රෝල් 603,180 ක මිලදී නොගෙන පූර්ව ලංසුකරුගෙන්ම රු.108.84 කට මිලදී ගැනීම තුළ මණ්ඩලයට රු.35,702,224 ක පාඩුවක් සිදු ව තිබීමත් හේතුවෙන් මණ්ඩලයට සමස්ථයක් ලෙස එකතුව රු.42,859,040 ක මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණි. එමෙන්ම මුල් සැපයුම්කරු විසින් සපයන ලද ටිකට් රෝල් කඩදාසිවල පළල, රෝලක විශ්කම්භය හා රෝලක තිබිය යුතු තත්ත්ව බර විවලනය වී තිබූ අතර, ප්‍රවේශපත්‍ර කඩදාසිවල කාබන් ඇතුරුම් පෘෂ්ඨය ප්‍රමාණවත් නොවීම තුළ ප්‍රවේශ පත්‍ර පැහැදිලිව මුද්‍රණය වී ද නොතිබුණි.

(එ) 2023 වර්ෂය සඳහා රථ ඇණිය ධාවන තත්ත්වයේ පවත්වාගෙන යාමට අවශ්‍ය අළුත් ටයර් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ටෙන්ඩරය තාක්ෂණික පිරිවිතරයන්ට අනනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර තිබියදී අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මඟින් ලබාදුන් නිර්දේශ මත අදාළ සමාගම වෙත ටෙන්ඩරය පිරිනැමීමට පෙර එනම් 2023 ජූලි 10 දින නව ටයර් 2,660 කට ඇණවුමක් ලබා දී තිබුණි. ඇණවුම අනුව ලද ටයර්

තාක්ෂණිකව සුදුසු නොවන බව ටයර් පරීක්ෂාවට භාජනය කළ නිලධාරීන් විසින් ප්‍රකාශ කර ප්‍රතික්ෂේප කර තිබියදී ඒවා භාවිතය සඳහා ඩිපෝ වලට නිකුත් කර තිබුණි. ඉන්පසුව අදාළ සැපයුම්කරුට උක්ත ටෙන්ඩරය පිරිනමා තිබූ අතර, එකී සමාගමෙන් රු.355,725,222 කට මිලදී ගනු ලැබූ නව ටයර් 5,842 ක් 2024 ජනවාරි 31 දින වන විට ඒකල ගබඩාවට ලැබී තිබුණි. මෙම ටයර් තොගයෙන් 2023 වර්ෂයේදී ගම්පහ ප්‍රාදේශිකයට නිකුත් කර තිබූ ටයර් ප්‍රමාණය 516 ක් වන අතර, එයින් රු.2,618,313 ක වටිනාකමක් සහිත ටයර් 43 ක් එනම් සියයට 08 ක් අකාලයේ අසාර්ථක වී තිබූ බැවින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 වගන්තියේ විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි.

(ඒ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 වගන්තියට අනුව මිලදී ගැනීම් සඳහා මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයට ලබා දිය හැකි අනුමත සීමාව රු.මිලියන 50 ක්ව තිබියදී, ඊට පටහැනිව මණ්ඩලයේ අශෝක් ලේලන්ඩ් සහ ටාටා වර්ගයේ බස් රථ සඳහා මාස දෙකකට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහා පූර්ව සැලසුම් සකස් කොට වසරකට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහා මිල කැඳවීම් සිදු කර ස්ටිල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රිස් (ඉන්දියා) සමාගම සහ ඊට වසරකින් පසු දෙවන සාරානුකූල ලංසුකරු වූ නිම්බස් ඔටෝ මෝටිව් ලංකා සමාගමට ද 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව සැපයීම් කිරීමට ඉඩ ලබා දීම තුළ එකී සමාගම් විසින් පිළිවෙලින් රු.1,583,900,400 හා රු.358,420,376 ක් වශයෙන් එකතුව රු.1,942,320,776 ක් වටිනා අමතර කොටස් සපයා තිබුණි. මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තාක්ෂණ) විසින් 2012 නොවැම්බර් 20 දින ගෙන්වන ලද අමතර කොටස් ව්‍යාජ අමතර කොටස් බැවින් හා එම අමතර කොටස් දේශීය වෙළඳපොලෙන් සහනදායී අඩු මිලකට මිලදී ගත හැකි බව පෙන්වා දී එකී අමතර කොටස් ප්‍රතික්ෂේප කර තිබුණි. එම සීමාව ඉක්මවා අදාළ සමාගම සමඟ ගිවිසුම් ගතව තිබීම, වෙළඳ ගිවිසුමේ පිටපතක් නීතිපතිවරයා වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබීම හා අත්සන් කරන ලද ගිවිසුමේ මණ්ඩලයට අවාසිදායක කොන්දේසි ඇතුළත් කිරීම හා ලංසු වටිනාකම් ඇතුළත් කර නොතිබීම හා අදාළ ටෙන්ඩරය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබා ගෙන නොතිබුණි. එමෙන්ම එකී ගිවිසුමේ 4.2 වගන්තිය අනුව ආනයනය කරනු ලබන අමතර කොටස් සඳහා දින 90 ක ණය සහන කාලයක් ලබා දීම හා මුදල් ගෙවීමකින් තොරව ගතවන සෑම මාසයකටම සියයට 5 ක පොලියක් ගෙවීමට සිදුව තිබියදී හා මණ්ඩලයට මූල්‍ය ස්ථාවරත්වයක් නොමැති තත්ත්වයක් තුළ මෙරටට ගෙන්වන ලද මුල්ම අමතර කොටස් තොගය තත්ත්වයෙන් බාල අමතර කොටස් වීම හේතුවෙන් එම අමතර කොටස් තොගය ප්‍රතික්ෂේප කර ටෙන්ඩරය අවලංගු කර නැවත ටෙන්ඩර පරිපාටියකට යන ලෙස කමිටුවක් මගින් නිර්දේශ කර තිබිය දී වසර 04 ක් තිස්සේ අඛණ්ඩව අත්‍යාවශ්‍ය නොවන අමතර කොටස් මිලදී ගෙන තිබුණි. මිලදී ගෙන තිබූ අමතර කොටස් සඳහා යාවත්කාලීනව ගෙවීම් නොකිරීම හේතුවෙන් සැපයුම්කාර සමාගම විසින් මණ්ඩලයට

එරෙහිව පැවරූ බේරුම්කරන නඩුවේ 2019 මැයි 09 දිනැති සමථය අනුව මණ්ඩලය විසින් ගෙවිය යුතුව තිබූ ඇමෙරිකන් ඩොලර් 3,722,104 කට අදාළ රු.664,722,000 ක මුදල 2023 වර්ෂයේදී ගෙවා තිබුණි. තවද යටෝක්ත ටෙන්ඩරයට වසරක කාලයක් ඉක්මවා තිබියදී එය අවලංගු කර නව ටෙන්ඩරයක් කැඳවීම වෙනුවට දෙවන සාරාංශකූල ලංසුකරු වන නිම්බස් ඔටෝමෝටිව් සමාගමට ඩිපෝ 26 ක් සඳහා අමතර කොටස් සැපයීමට ටෙන්ඩරයක් පිරිනැමීම සහ ඔහුට තීරු බදු සහන ලබා දීම සාවද්‍ය බව හා නීතියට පටහැනි බව දැන දැනම 2012 ජූනි 08 දින රැස් වූ අධ්‍යක්ෂ මණ්ඩලය සැපයුම්කරුට ටෙන්ඩරය පිරිනැමීමට තීරණය කර තිබුණි.

(ඔ) මණ්ඩලයේ රථ ඇණිය සඳහා 2023 වර්ෂයට අවශ්‍ය ග්‍රීස් සහ ලිහිසි තෙල් වර්ග මිලදී ගැනීම සඳහා රු.මිලියන 1,283 ක මුදලක් වෙන් කර තිබූ අතර, ඒ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022 ඔක්තෝබර් 14 දින ආරම්භ කර 2023 මැයි 23 දින වන විට ටෙන්ඩරය ප්‍රදානය කර මිලදී ගැනීම් සිදු කළ යුතුව තිබුණි. නමුත් මාස 04 කට අවශ්‍ය ග්‍රීස් හා ලිහිසි තෙල් පමණක් මිලදී ගැනීම සඳහා වූ රු.681,999,047 ක මූල්‍ය වටිනාකමින් යුත් ටෙන්ඩරය 2023 දෙසැම්බර් 22 දින සැපයුම්කරුවන් වෙත පිරිනමා තිබුණි. එනම් නියමිත දිනට මාස 07 කට පසුවය. මෙම මිලදී ගැනීම සඳහා 2022 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගෙන ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කිරීමට නියෝග කර තිබුණද ඒ අනුව කටයුතු නොකිරීම හා ටෙන්ඩරය ප්‍රමාද කිරීම තුළ මණ්ඩලයට බස් රථ ඇණිය ධාවන තත්ත්වයේ පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයට අවශ්‍ය ග්‍රීස් හා ලිහිසි තෙල් සඳහා රු.1,049,288,879 ක මුදලක් වැය කිරීමට සිදුව තිබූ අතර එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තියට පටහැනිව කටයුතු කර තිබුණි.

(ඕ) මණ්ඩලයේ බස් රථ ඇණිය සඳහා 2023 වර්ෂයට අවශ්‍ය අශෝක් ලේල්න්ඩ් වැසි අමතර කොටස් මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කළ යුතුව තිබූ අතර, එය 2022 ඔක්තෝබර් 14 දින ආරම්භ කර 2023 මැයි 03 දින කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුව තිබුණි. අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි අමතර කොටස් මිලදී ගැනීම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා 2022 ඔක්තෝබර් 12 දින ආරම්භ කර 2023 අප්‍රේල් 02 දින කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුව තිබුණි. මෙම මිලදී ගැනීම් කඩිනම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2022 නොවැම්බර් 14 දින ප්‍රතිපත්තිමය තීරණයක් ලබා දුන්නද අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් මිලදී ගැනීමේ ටෙන්ඩරය පිරිනැමීම මාස 03 කුත් දින 16 ක් ප්‍රමාද වී තිබූ අතර, අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි මිලදී ගැනීමේ ටෙන්ඩරය මාස 08 කුත් දින 03 ක් ප්‍රමාද වී ප්‍රදානය කර තිබුණි. අශෝක් ලේලන්ඩ් එන්ජින් හා ගියර් පෙට්ටි අමතර කොටස් අයිතම් 533 ක් සඳහා ලැබී තිබූ ලංසු සඳහා තෝරාගත් ලංසුකරුවන් 07 දෙනෙකුට එයින් අයිතම 168 ක් සඳහා ප්‍රසම්පාදන සිදු කිරීමටත්, නැවත මිල කැඳවීමකින් තොරව ඉතිරි අයිතම 365 සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිලදී

ගැනීම් සිදු කළ යුතු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර තිබුණි. අශෝක් ලේලන්ඩ් වැසි අමතර කොටස් 240 ක වාර්ෂික අවශ්‍යතාවය 74,256 ක් වූ අතර, මිලදී ගැනීමට තීරණය කර තිබූ ප්‍රමාණයෙන් මාස 04 ක අවශ්‍යතාවය වූ අයිතම 24,752 ක් සඳහා ඉදිරිපත් කර තිබූ ලංසු අනුව අමතර කොටස් 180 ක් සඳහා ලංසුකරුවන් 05 දෙනෙකුට රු.88,099,744 කට ටෙන්ඩරය පිරිනමා තිබූ අතර ඉතිරි අයිතම 60 සඳහා අර්පනයක් නොතිබූ බැවින්, එම අයිතම් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වගන්ති 2.14.1 ට අතිරේක 35 ලෙස නිකුත් කර තිබූ 2020 මාර්තු 25 දිනැති නියෝගය අනුව ප්‍රසම්පාදනය කළ යුතු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් දන්වා තිබුණි. කෙසේ වෙතත් 2023 වර්ෂය තුළදී මෙම ටෙන්ඩර් දෙක ප්‍රදානය මගින් කිසිදු අමතර කොටසක් ලැබී නොතිබූ අතර, පාලන ගිණුම් අංක W-5 යටතේ ඩිපෝ හා ප්‍රාදේශීය කාර්යාල මගින් මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගෙන තිබූ අමතර කොටස් සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබූ මුදල රු.2,032,617,464 ක් ව තිබුණි.

(ක) ඉන්දියානු ණය නියම ගිවිසුම යටතේ ශ්‍රී ලංකා රජයට ලැබුණු ණය මුදලින් ඉතිරිව තිබූ ඇමරිකානු ඩොලර් මිලියන 20 උපයෝගි කර ගෙන අවුරුදු 15 ට වඩා පැරණි බස් රථ මණ්ඩලයේ රථ ඇණියෙන් ඉවත් කර දැනට පවත්වාගෙන යනු ලබන නාගරික සේවාවන් අඩාල වීමකින් තොරව පවත්වාගෙන යාම සඳහා පිටුපස උස් ඇන්ද සහිත ආසන 50-54 (2x2) නව බස් රථ 400 ක් හා පිටුපස උස් ඇන්ද සහිත ආසන 32-35 (2x2) බස් රථ 100 ක් වශයෙන් බස් රථ 500 ක් මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2018 මැයි 23 දින ලබා දුන් ප්‍රතිපත්තිමය තීරණය මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. ඒ අනුව අදාල ප්‍රසම්පාදන ලියවිලි හා තාක්ෂණික පිරිවිතර සකස් කර ලංසු කැඳවීමට අවශ්‍ය සියළු කටයුතු සිදු කර තිබියදී, 2020 ජනවාරි 01 දින එවකට සිටි ප්‍රවාහන අමාත්‍යවරයා විසින් කිසිදු විද්‍යාත්මක පදනමකින් තොරව ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය වෙනස් කර අමාත්‍යවරයාගේ වාචික උපදෙස් මත ආසන 32-35 නව කුඩා බස් රථ 500 ක් හා ආසන 42-45 පිටුපස උස් ඇන්ද සහිත නව බස් රථ 100 ක් වශයෙන් බස් රථ 600 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. කෙසේ වෙතත්, නැවත 2023 ජනවාරි 03 දින ලබා දී තිබූ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර ආසන 32 ක් සහිත Ashok Leyland Lynx නව බස් රථ 500 ක් එක් බස් රථයක් USD 26,662.50 බැගින් මුළු මුදල වන USD 13,311,250 ක මුදලකට Ashok Leyland Limited India වෙතින් මිලදී ගැනීමට තීරණය කර එකී ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. මෙම බස් රථ සඳහා ගෙවා තිබූ මුළු මුදල රු.මිලියන 5,513 ක් වන අතර, එක් බස් රථයක වටිනාකම රු.මිලියන 11.02 කි. ආසන 32-35 බස් රථයක ඇස්තමේන්තු මිල රු.මිලියන 5 කි. මේ අනුව ආසන 32 බස් රථයක් සඳහා ඇස්තමේන්තුගත මිලට වඩා රු.මිලියන 6.02 ක් වශයෙන් රු.මිලියන 3,010 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඛ) කටුබැද්ද අධිසුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයේ බස් රථ සඳහා එක් බස් රථයක CCTV කැමරා 04 ක් Fuel Senser with GPS Based Tracking Unit සහ වෙනම සර්වර් පරිගණකයක් සහිත දෙවන අන්තය (Backend) යෙදවුම් පද්ධතියකින් සමන්විත, අධි සුඛෝපභෝගී බස් රථ සඳහා Supply, Installation and Commissioning of GPS Tracking and Vedios Surveillance Solution 125 ක් සවි කිරීම සඳහා වූ ටෙන්ඩරය 2018 ජූනි 25 දින M/S ATSL International (Pvt) Ltd වෙත රු.33,628,840 කට පිරිනමා තිබුණි.

ගිවිසුම් ප්‍රකාර අදාළ කොන්දේසි සම්පූර්ණ කර නොමැති තත්ත්වයක් තුළ අදාළ සැපයුම්කරු වෙත 2018 ඔක්තෝබර් 25 දින සිට 2020 දෙසැම්බර් 09 දින දක්වා වෙක්පත් 07 කින් රු.33,306,894 ක් ගෙවා තිබුණි. මෙම ටෙන්ඩරය ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම අවසන් වන තෙක් මණ්ඩලය විසින් ගෙන තිබූ වැරදි කළමනාකරණ තීරණ, අවශ්‍ය Server පද්ධතිය හා පරිගණක සහිත මෙහෙයුම් ස්ථානයක් ස්ථාපනය නොකිරීම, අවශ්‍ය අන්තර්ජාල පහසුකම් ලබා නොදීම හා පද්ධති ස්ථාපනයට අවශ්‍ය අධිසුඛෝපභෝගී බස් රථ ප්‍රමාණය සැපයීමට මණ්ඩලය අසමත් වීම යන කරුණු මත ව්‍යාපෘතිය අසාර්ථක වී තිබූ අතර වසර 03 ක වගකීම් කාලය තුළ හා ගිවිසුම් ප්‍රකාර කොන්ත්‍රාත්කරුගෙන් ගිවිසුම කඩවීමට අදාළ හානිපූර්ණයට තිබූ අවස්ථාව පවා අහිමි වී තිබුණි. වර්තමානය වන විට මෙම බස් රථවල අදාළ උපකරණ කට්ටල හා අංගෝපාංග පවා අස්ථානගතවී තිබූ අතර, කිසිදු මෙහෙයුම් කටයුත්තක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයෙන් මෙම ප්‍රසම්පාදනයෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබූ අතර මූල්‍යමය වශයෙන් මණ්ඩලයට රු.33,306,894 ක පාඩුවක් සිදුව තිබුණි.

(ග) 2022 වර්ෂය සඳහා අවශ්‍ය සිලින්ඩර මුදුන් මිලදී ගැනීම සඳහා මිල කැඳවීම් සිදු කර තිබූ අතර, එක් ලංසුකරුවකු විසින් පමණක් ලංසු තැබීම හේතුවෙන් එම ලංසුව ඇගයීම් කර සාරානුකූල ලංසුකරු ලෙස ඔහු විසින් ඉදිරිපත් කරන ලද රු.139,328,000 ක ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර තිබුණි. ලංසුකරුගේ ඉල්ලීමකින් තොරව සමාජ ආරක්ෂණ බද්ද ලෙස රු.7,308,500 ක මුදල ලංසු වටිනාකමට ඇතුළත් කිරීමට ටෙන්ඩර් කමිටුවේ ලේකම්ගේ නිර්දේශ මත ටෙන්ඩර් මණ්ඩලය කටයුතු කිරීම, ප්‍රසම්පාදන කටයුතු 2022 මාර්තු 09 දින ආරම්භ කර 2023 ජූනි 06 දින නිම කළ යුතු වීමත්, එකී ප්‍රසම්පාදනය 2023 ඔක්තෝබර් 18 දින පිරිනැමීම, මුල් ගිවිසුමේ 04 වන වගන්තියෙහි දෙවන ඡේදය වෙනස් කර ප්‍රමාද ගාස්තු අය කිරීමට තිබූ කොන්දේසි වෙනස් කිරීම, භාණ්ඩ සැපයීම අවසන් කළ යුතු කාලය 2023 දෙසැම්බර් 15 දින දක්වා දීර්ඝ කිරීම, 2023 දෙසැම්බර් 15 දින වන විට ගිවිසුම ප්‍රකාර සැපයුම්කරු විසින් සැපයිය යුතු සිලින්ඩර මුදුන් 204 ක ප්‍රමාණය සැපයීමට අසමත් වීම හේතුවෙන් ප්‍රසම්පාදන අරමුණ ඉටුවී නොතිබූ අතර සපයන ලද සිලින්ඩර පෙට්ටි (බඳන්) 176 න් සිලින්ඩර් පෙට්ටි 22 ක් ප්‍රතික්ෂේප වීම තුළ

මෙම ප්‍රසම්පාදනය හේතුවෙන් මණ්ඩලයට රු.14,215,725 ක මූල්‍යමය අලාභයක් සිදුව තිබුණි.

(ඝ) මණ්ඩලයේ රථ ඇණිය සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම් සහ පෙරසවි කිරීම සඳහා 2017 වර්ෂයෙන් පසු 2022 වර්ෂය දක්වා ප්‍රසම්පාදනයක් සිදු කිරීමකින් තොරව 2017 වර්ෂයේ තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් අඛණ්ඩව නැවත පිරවීම් හා පෙරසවි කිරීම් සිදු කර ගෙන තිබූ අතර, මිල උච්චාවචනය පාදක කර ඉදිරිපත්කර තිබූ තොරතුරු අනුව 2022 ජූලි මස 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මිල ගණන් ද සංශෝධනය කර එකී සැපයුම්කරුවන්ගෙන්ම මිලදී ගැනීමට අනුමැතිය ලබාගෙන තිබුණි. 2023 වර්ෂය සඳහා අවශ්‍ය මුළු ටයර් ප්‍රමාණය මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන සලසා තිබියදී 2023 වර්ෂය සඳහා මාස 04 ක ටයර් අවශ්‍යතාවය පෙන්වා නැවත පිරවූ ටයර් 8,840 ක් හා පෙරසවි ටයර් 34,856 ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවා තිබූ අතර, ඉදිරිපත් වූ ලංසුකරුවන් 17 දෙනෙකුගෙන් ලංසුකරුවන් 14 දෙනෙකු සාරාන්‍සකුල ලංසුකරුවන් ලෙස තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලබා දී තිබූ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කිරීමකින් තොරව ලංසු කැඳවීමට පෙර සලකා බැලිය යුතු කරුණු හා සාධක සලකා බැලීමට යටත්ව අනුමැතිය ලබා දීම කල් දමා තිබුණි. මේ හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට නැවත පිරවූ ටයර් හා ටයර් පෙරසවි කිරීම සඳහා ටෙන්ඩරය පිරිනමා නොතිබීම හා ඉහත කී අමාත්‍ය මණ්ඩලය තීරණය කළ මිලට මිලදී ගැනීම හේතුවෙන් මණ්ඩලයට රු.2,841,249,937 ක මුදලක් ගෙවීමට සිදුව තිබූ අතර, ඒ හේතුවෙන් රු.356,007,991 ක මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) රුහුණ ප්‍රාදේශීය කාර්යාලය විසින් පාලනය වන ඩිපෝවන් විසින් ධාවනය කළ යුතු දුර ගමන් සේවා 41 ක් හා කෙටි ගමන් සේවා 124 ක් දීර්ඝකාලීනව ධාවනය නැවතී තිබූ බවත්, එම නිසා දෛනිකව අහිමි වන ධාවන කිලෝමීටර් ප්‍රමාණය 43,245 ක් වන අතර, මෙම සේවා වාර 165 ක් ධාවනයට එක් නොකිරීම හේතුවෙන් 2023 වර්ෂය තුළදී මණ්ඩලයට අහිමි ව තිබූ ආදායම රු.2,430,801,450 ක් විය.

(ආ) රුහුණ ප්‍රාදේශිකයේ ඩිපෝවන් සතුව දක්ෂිණ අධිවේගී මාර්ගයේ ධාවන කටයුතු සඳහා පවත්නා කාලසටහන් අවශ්‍යතාවය වන කාලසටහන් 60 න් ආවරණය කරන ප්‍රමාණය 43 ක් වූ අතර, ඉතිරි කාලසටහන් අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අවශ්‍ය බස් රථ 17 ක් ධාවනයට යෙදවීමට කටයුතු නොකිරීම හේතුවෙන් දෛනිකව රු.2,200,000 ක ආදායමක් අහිමි වී තිබූ අතර, 2023 වර්ෂය තුළදී මණ්ඩලයට අහිමි වූ සමස්ථ ආදායම රු.මිලියන 803 ක් විය.

(ඇ) අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම සඳහා නව බස් රථයක් මිලට ගැනීම වෙනුවෙන් අත්තිකාරම් මුදල ලෙස රු.5,000,000 ක මුදලක් 2022 දෙසැම්බර් 01 දින තංගල්ල ඩිපෝව විසින් රුහුණ ප්‍රාදේශීය කාර්යාලයේ ගිණුම් අංක 013100291922111 වෙත බැර කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින දක්වා නව බස් රථය හෝ ලබා ගත් මුදල අදාළ ඩිපෝව වෙත ආපසු ලබා දීමට ප්‍රාදේශීය කාර්යාලය මගින් කටයුතු කර නොතිබුණි.

(ඈ) මහනුවර ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ අනාර්ථික මාර්ග ලෙස මාර්ග 46 ක් හඳුනාගෙන තිබූ අතර, එම මාර්ගවල බස් රථ එක බැගින් ධාවනයට යෙදවීම සඳහා නියමිත ලේඛනගත කිලෝමීටර් ප්‍රමාණය කිලෝමීටර් 7,111.1 කි. එම මාර්ගවල දෛනිකව ධාවනය කරන ධාවන කිලෝමීටර් ප්‍රමාණය 6,690.1 ක් වන අතර, එම ධාවන කිලෝමීටර් ප්‍රමාණය අනුව ගණනය කරන ලද අනාර්ථික කිලෝමීටර් ප්‍රමාණය කිලෝමීටර් 3,243.2 කි. මේ අනුව ගණනය කරන ලද අනාර්ථික ධාවන කිලෝමීටර් 3,243.2 තුළින් දෛනිකව අහිමිවන ආදායම රු.5,804,679 ක් විය. මෙම බස් රථ ධාවනයේදී සැලකිය යුතු අවම නිර්ණායකයන් සැලකිල්ලට භාජනය කර මෙම සේවා වලින් සිදු වන ආදායම් ඌනතාවය යථාවත් කිරීමට හා මහජන සේවාවක් පවත්වාගෙන යාමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඉ) කොවිඩ් කාල වකවානුව තුළදී ප්‍රාදේශික 09 ක රෝහල් කාර්යය මණ්ඩලය ප්‍රවාහනය සඳහා 2020 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මණ්ඩලයේ බස් රථ යොදවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට රු.151,585,764 ක මුදලක් අය විය යුතුව තිබුණි. අදාළ සේවාව සපයා අවුරුදු 02 ක් ගත වී තිබුණ ද මෙම මුදල නිසි කාලයේදී අය කර ගැනීමට මණ්ඩලය අපොහොසත්වී තිබුණි.

(ඊ) මහනුවර දකුණ ඩිපෝව මගින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 003100101199662 දරන ජංගම ගිණුමෙහි 2014 ජනවාරි 01 දින රු.2,237,831 ක් වටිනා චෙක්පතක් තැන්පත් කර තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින සකස් කර තිබූ බැංකු සැසඳුමෙහි එම චෙක්පත තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පතක් ලෙස පෙන්වා තිබූ අතර, එය නිරවුල් කිරීම සඳහා 2022 ඔක්තෝබර් 12 දින රු.100,000 ක වියදමක් දරා බැංකු ගිණුමට අදාළ බැංකු ප්‍රකාශන ලබා ගෙන තිබුණද එය පරීක්ෂාවට භාජනය කර චෙක්පත සම්බන්ධව නිසි පියවර ගැනීමට මූල්‍ය අංශය විසින් කටයුතු නොකිරීම තුළ අදාල චෙක්පත සාවද්‍ය පරිහරණයකට යෙදවීමට සැලසුම් නොකළ බවට සැහීමකට පත්වීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(උ) 2023 සැප්තැම්බර් 13 වන දින මොරටුව ඩිපෝවේ මුදල් ශේෂය භෞතිකව පරීක්ෂා කළ අතර, එදිනට පැවති මුදල් ශේෂය තුළ රු.54,179 ක මුදල් ඌනතාවයක් අනාවරණය විය. මෙම ඌනතාවය දෛනිකව පවත්වාගෙන යන ඌනතාවයක් බව නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඌ) මාතර ඩිපෝව විසින් 2023 වර්ෂයේදී සමාගම් 03 ක් මගින් මිලදී ගන්නා ලද පෙරසවි ටයර් හා නැවත පුරවන ලද ටයර් අකාලයේ අසාර්ථක වීම් පිළිබඳව 2023 ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් මාසවල නියැදියක් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ පරිදි එකී සමාගම් විසින් මිලදී ගන්නා ලද ටයර්වල අකාලයේ අසාර්ථක වීම් සඳහා ප්‍රතිදාන ලෙස අය කර ගත යුතු රු.4,248,303 ක මුදල අය කර ගැනීම සඳහා ඩිපෝවේ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඔ) හක්මණ ඩිපෝවේ නැවත පිරවූ ටයරයක උපයෝජිත ප්‍රතිශතය සියයට 32 ක් වන අතර, පෙරසවි ටයරයක උපයෝජිත ප්‍රතිශතය සියයට 20.5 කි. මේ අනුව 2023 වර්ෂයේ ටයර් පෙරසවි කිරීමේ හා නැවත පිරවීම් උපයෝජිත ප්‍රතිශතයෙහි සාමාන්‍ය අගය සියයට 26.25 කි. 2023 වර්ෂයේ හක්මණ ඩිපෝව මගින් මිලදී ගත් නැවත පිරවූ හා පෙරසවි කරන ලද ටයර්වල වටිනාකම රු.41,742,502 ක් වූ අතර, ටයර් අකාලයේ අසාර්ථක වීම හේතුවෙන් උපයෝජනය නොවූ වටිනාකම වන රු.30,785,095 ක් සඳහා ප්‍රතිදාන අය කර ගැනීමට ඩිපෝ කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඕ) විධිමත් පවරා ගැනීමකින් තොරව ලග්ගල මහවැලි සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක ඩිපෝවක් ආරම්භ කිරීම සඳහා 2021 සැප්තැම්බර් 11 දින මුල් ගල තබා තිබුණ ද 2023 නොවැම්බර් මාසය දක්වා එම ඉඩම පවරාගෙන ඩිපෝව ඉදි කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම ඉඩමේ ඩිපෝව සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කරන තෙක් ඩිපෝවේ මෙහෙයුම් කටයුතු සඳහා තාවකාලිකව අවශ්‍ය ධාවන අංශය, මුදල් අංශය හා ඉංජිනේරු අංශය සඳහා කාර්යාල පහසුකම් සැපයීමට ධාවනයෙන් ඉවත් කරන ලද බස් රථ 03 ක් උපයෝගි කර ගනිමින් වායුසමීකරණය කරන ලද කාර්යාල බස් රථ 03 ක් නිර්මාණය කර තිබුණි. ඒ සඳහා රු.1,632,440 ක මුදලක් වැය කර තිබුණු නමුත් එම බස් රථ නව ඩිපෝවේ කාර්යාල කටයුතු සඳහා භාවිතයට ගෙන ඩිපෝව ආරම්භ කර නොතිබුණි.

(ක) වෘත්තීය සමිතිවලට නිකුත් කළ බව සඳහන් දිවයින පුරා ගමන් කළ හැකි රු.1,247,739 ක වටිනාකමින් යුත් ගමන් අවසර පත් 04 ක් 2023 ජූනි 01 දින මුද්‍රණය කර තිබූ නමුත් එම ගමන් අවසර පත් මුද්‍රණය සඳහා ලද අයදුම්පත්, මුදල් ගෙවීම් ලදුපත් හා එම අවසර පත් මුද්‍රණය සඳහා ලබා ගත් අනුමැතිය හා එම අවසර පත් අදාළ වෘත්තීය සමිති විසින් භාරගත් බවට වූ තහවුරු ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. ඒ අනුව එම ගමන් අවසරපත් අයථා පරිහරණයට යොදවා නොතිබූ බවට සෑහීමකට පත්වීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඛ) ඉන්ධන අර්බුදයක් පැවති කාලය තුළ අකුරැස්ස ඩිපෝව මගින් ශ්‍රී ලංගම හිටපු සභාපති වෙත මු.10 අංක 015287, 006473 සහ 006419 මගින් නිල වාහන නොවන වෙනත් වාහනයකට පිළිවෙලින් ඉන්ධන ලීටර් 400 ක් 620 ක් හා 476 ක් වශයෙන් එකතුව ඉන්ධන ලීටර් 1,496 ක් අවස්ථා 03 කදී ලබා දී තිබූ අතර, එම ඉන්ධන සභාපති වෙත නිකුත් කළ බවට තෙල් පිරවුම් පත්‍රයේ (ER-08) සටහන් කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංගම හිටපු සභාපති වෙත නිකුත් කරන ලද රු.620,840 ක වටිනාකමින් යුත් ඉන්ධන ලීටර් 1,496 ක ප්‍රමාණය සාවද්‍ය පරිහරණයට යොදවා නොතිබූ බවට සෑහීමකට පත්වීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ග) ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධව තලංගම ඩිපෝ කළමනාකරු හා අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම සමඟ ඇති කර ගෙන තිබූ අවබෝධතා ගිවිසුමකට අනුව පළමුව රු.500,000 ක තැන්පත් මුදලක් තැබීමටත් එම තැන්පතු මුදලින් සියයට 80 ක් දක්වා ඉන්ධන නිකුත් කිරීමටත් එකඟ වී තිබුණි. අවබෝධතා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ලබා දිය හැකි ණය සීමාව රු.400,000 ක් වූ අතර, එම ණය සීමාව ඉක්මවා රු.1,978,010 ක් වටිනා ඉන්ධන, ඩිපෝ කළමනාකරණය විසින් ණය පදනම මත එකී සමාගම වෙත ලබා දී තිබූ අතර එසේ ඉන්ධන නිකුත් කිරීම වෙනුවෙන් ඩිපෝවට ලැබිය යුතුව තිබූ රු.2,378,010 ක මුදල අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඝ) රිය අනතුරු වන්දි නඩු වලින් විසඳුම් ලබා දී තිබූ NWP/HCCA/KUR/106/2019/F දරණ නඩුවේ තීන්දුව හා කාර්යය සටහන් අනුව රියදුරුගේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් 2023 වර්ෂයේදී රු.3,965,000 ක් වන්දි වශයෙන් ගෙවා තිබූ අතර, වැල්ලවාය දිසා අධිකරණයේ පැවති නඩු අංක 1135/M දරණ නඩුවේදී රියදුරු වරද පිළිගැනීම හේතුවෙන් රු.2,125,000 ක වන්දියක් ගෙවා තිබුණි. මේ අනුව මණ්ඩලය විසින් ගෙවා තිබූ මුළු වන්දි මුදල රු.6,090,000 ක් වන අතර, මණ්ඩලය විසින් මෙම නඩුවට විෂය මූලික වූ බස් රථ දෙක රක්ෂණය කර නොතිබූ බැවින්, පාඩුව රක්ෂණයෙන් හානිපූරණය කර ගත නොහැකි වී තිබුණි.

(ච) බස් රථ නිෂ්පාදනයට අදාළව 2020 අංක 03 දරණ මුදල් කොට්යාශ චක්‍රලේඛය මගින් යෝජනා කර තිබූ දිරි දීමනා ක්‍රමය තුළ කොටස් වශයෙන් නිශ්පාදනය කරන අතර කොටස් සඳහා දිරි දීමනා ගෙවීම සිදු කළද සම්පූර්ණයෙන්ම බස් රථයක බොඩි කොටස නිෂ්පාදනය කරන කාලවකවානුවද නිශ්චය කරන ලද දිරි දීමනා ඇගයීම් ක්‍රමයක් හා මාසිකව නිෂ්පාදනය කළ යුතු අනිවාර්යය සීමා, දිරි දීමනා සීමා චක්‍රලේඛය මගින් දක්වා නොතිබියදී, සමාලෝචිත වර්ෂය තුළ දිරි දීමනා වශයෙන් රු.19,247,995 ක් ගෙවා තිබුණි.

(ඡ) 2023 වර්ෂයේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.මිලියන 134,341 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 53 ක් සැලසුම්කර තිබුණද 2023 වර්ෂය තුළදී රු.මිලියන 74,662 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 11 ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ අයවැයට ඇතුළත් කරන ලද ප්‍රසම්පාදන වියදමෙන් සියයට 44.42 ක් පමණක් උපයෝජනය කර ඇති බැවින් අය වැය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

(ජ) රියදුරු හා කොන්දොස්තර මහතුන්ගේ අතිකාල වියදම් හැර කාර්යාල හා අනෙකුත් වැඩබිම් කාර්යය මණ්ඩලයන්හි සමාලෝචිත වර්ෂයේ අතිකාල වියදම රු.මිලියන 896 ක් වූ අතර, 2022 වර්ෂයේ අතිකාල වියදම වන රු.මිලියන 671 හා සංසන්දනයේදී අතිකාල වියදම රු.මිලියන 225 ක් එනම් සියයට 33 ක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. අදාළ සේවකයන්ට සාමාන්‍ය රාජකාරී වේලාවන්හිදී ඉටු කළ යුතු කාර්යය පිළිබඳව රාජකාරී ලැයිස්තු ලබා නොදීම, ඇඟිලි සලකුණු යන්ත්‍ර හරහා පැමිණීම හා පිටවීම සනාථ කර ඒ අනුව අතිකාල ගණනය නොකිරීම, පාලනයකින් තොරව අඛණ්ඩව දිවා රාත්‍රී එක දිගට දින දෙකකට වැඩි කාලයක් අතිකාල රාජකාරිවල නිරතවීම අසාමාන්‍ය ලෙස අතිකාල වර්ධනය වීමට හේතු වී තිබුණි.

(ඣ) ටාටා වර්ගයේ බස් රථ සඳහා භාවිතා කරන ලද රු.518,408 ක වටිනාකමින් යුතු අමතර කොටස් වර්ග 83 ක් පමණ මොරටුව ඩිපෝවේ ගබඩාවේ තිබූ අතර, ඩිපෝව සතුව ටාටා වර්ගයේ බස් රථ නොමැති වීම නිසා මෙම අමතර කොටස් භාවිතා කිරීමට හැකියාවක් නොමැති බව දන්වා තිබුණ ද මෙම තොග අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම වටිනාකම තක්සේරු නොකළ ඉසුසු වර්ගයේ අමතර කොටස් වර්ග 34 ක් ද ගබඩාවේ තිබූ අතර, එම තොග තක්සේරු කර තොගයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ට) මණ්ඩලයේ ඒකල ප්‍රධාන ගබඩාවේ 2023 වර්ෂයේ අවසානයට සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව අමතර කොටස් වර්ග 50 කට අදාළව රු.7,186,995 ක වටිනාකමින් යුත් අමතර කොටස් 10,039 ක් දැනට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ භාණ්ඩ බව වාර්තා කර තිබුණු නමුත් අපහරණයට කටයුතු කර නොතිබුණි.

(ඨ) සෙමින් චලනය වන තොග අයිතමයක් වන ලේලන්ඩ් 400 Injecter Pump Repair Kit 504 ක ශේෂයක් 2011 නොවැම්බර් 28 දිනට ගබඩාවේ තිබියදී 2011 නොවැම්බර් 22 දින ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගමෙන් එකක් රු.15,273.44 ක් බැගින් රෙපයාර් කිට් 600 ක් රු.9,164,064 ක වටිනාකමට මිලදී ගෙන තිබුණි. මෙම තොගයේ 2022 දෙසැම්බර් 20 දිනට ශේෂය රෙපයාර් කිට් 267 ක් ව තිබූ අතර, එදිනෙන් පසු එනම් 2024 ජනවාරි 30 දින දක්වා කිසිදු රෙපයාර් කිට් කට්ටලයක් නිකුත්ව නොතිබුණි. මිලදී ගනු ලැබූ රෙපයාර් කිට් භාවිතයට ගනු ලබන අයිතමයක් බව පෙන්වීම සඳහා ප්‍රාදේශීය වැඩපොල හා ඩිපෝවන්

වෙත නිකුත් කර තිබුණි. මෙම තොග පිළිබඳ විගණනය විසින් ලබා ගත් තහවුරුවකට අනුව ගිංතොට වැඩපලේ පමණක් රු.870,586 ක් වටිනා භාවිතයට නොගත් රෙපයාර් කිට් 57 ක් තිබූ බව නිරීක්ෂණය විය. මෙම භාවිතයට නොගෙන ගබඩා කර තිබූ තොග අයිතම්වල වටිනාකම රු.4,948,595 ක් විය.

(ඩ) ඉදිරිපත් කරන ලද වෙනත් වත්කම් උපලේඛනය තුළ අවස්ථා 49 ක් තුළදී ඇතුළත් කර තිබූ රු.26,344,359 ක වටිනාකමක් සහිත වත්කම් නිශ්චිතව හඳුනාගෙන නොතිබූ අතර ඒවා නිවැරදිව හඳුනාගෙන වත්කම් අයථා පරිහරණයට ලක් වීමට ඉඩ අවුරා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඪ) ලැබිය යුතු කොන්දොස්තර හිඟ මුදල් ශේෂය ලෙස ගිණුම්ගත කර තිබූ රු.6,168,805 ක ශේෂය තුළ වසර ගණනාවක සිට හිඟව පවතින රු.4,753,550 ක මුදලක් පවතින අතර, එම මුදලෙහි සේවය හැරගිය සහ විදේශගත පුද්ගලයින්ගෙන් ආපසු අය කර ගත නොහැකි වූ රු.328,242 ක මුදලක් හා රත්මලාන ඩිපෝවෙහි විස්තර සොයාගත නොහැකි වූ රු.6,363 ක ශේෂයක් පැවතුණි.

(ණ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු හමුදා කුලී ආදායම ලෙස ගිණුම්ගත කර තිබූ රු.70,658,623 ක ශේෂය තුළ වර්ෂ 05 ට වඩා පැරණි රු.64,907,313 ක ශේෂයක් තිබූ අතර, දීර්ඝ කාලයක සිට පොත්වල පෙන්නුම් කරන මෙම ආදායම් ශේෂය අයකර ගැනීමට හෝ ඒ සඳහා හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ත) සමාලෝචිත වර්ෂයේ වෙළඳ හා අනෙකුත් ණයගැතියන් යටතේ පෙන්වා ඇති රු.91,281,308 ක ශේෂය තුළ කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ, කැස්බෑව ඩිපෝවේ, මධ්‍යම බස් රථ කාර්යාලයේ හා මීතොටමුල්ල ඩිපෝවේ අය කර ගත යුතු පාර්ශවය නිශ්චිතව හඳුනා නොගත් පිළිවෙලින් රු.721,611 ක්, රු.27,762 ක්, රු.17,399,614 ක් හා රු.165,270 ක් වශයෙන් වූ එකතු වටිනාකම රු.18,314,257ක් ද ඩිපෝ මගින් වෙනත් ඩිපෝ වලට ලබා දී තිබූ ණය මුදල් වලින් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබූ රු.28,810,742 ක් ද මාතලේ ප්‍රාදේශීය වැඩපොලට ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලැබිය යුතු රු.499,166 ක මුදලක් සහ ඩිපෝවන් තුනක උපයන විට ගෙවීමේ බදු ලෙස වූ රු.327,283 ක ශේෂයක් ද නිරීක්ෂණය වූ අතර එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ථ) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් වෙළඳ ණයගැතියන් ශේෂය තුළ ප්‍රාදේශීය කාර්යාල 02 ක් සහ ඩිපෝ 19 ක් විසින් ප්‍රධාන ටයර් සැපයුම්කරුවෙකුට හා අමතර කොටස් සැපයුම්කරුවන් දෙදෙනෙකු සඳහා ගෙවිය යුතු වසර 05 කට වඩා පැරණි රු.382,156,975 ක නොපියවූ ණය ශේෂය සාවද්‍ය ගිණුම් සටහනක් බව නිරීක්ෂණය වන බැවින්, ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ද) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් 21 කට අදාළ රු.1,611,808,399 ක් ණයහිමි ශේෂ හා ගිණුම් 04 කට අදාළ රු.126,777,337 ක උපචිත වියදම් වශයෙන් වූ එකතුව රු.1,738,585,736 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(ධ) සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් තුළ ජංගම වගකීම් යටතේ ඇතුළත් කර තිබූ රු.2,712,682,543 ක ගෙවිය යුතු ශේෂය තුළ සේවක වැටුපෙන් අඩු කර තෙවන පාර්ශවයන් වන සමිති සමාගම් හා මූල්‍ය ආයතන ඇතුළු ආයතන 05 ක් සඳහා ගෙවී යුතු වසර දෙකකට වඩා වැඩි රු.109,516,143 ක් හා ගිණුම් 27 කට අදාළ වසර දෙකක් ඉක්මවූ රු.2,603,166,400 ක ණයහිමි ශේෂයක් පවතින අතර, එය සාවද්‍ය ගිණුම් සටහනක් බව නිරීක්ෂණය වන බැවින් ආදායමට බැර කිරීමට කටයුතු කර නොමැති අතර, මෙම ශේෂයන්ගෙන් රු.1,078,029,266 ක් වසර 10 ක් ඉක්මවූ ණය ශේෂ විය.

(න) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු වියදම් ශේෂය වූ රු.517,859,913 ක ශේෂය තුළ 2018 වර්ෂයේ සිට පැවත එන බදුල්ල ඩිපෝවෙහි රු.288,246,841 ක පාරිතෝෂික සඳහා වෙන් කිරීමේ ශේෂයක් පැවති අතර, පාරිතෝෂික ගෙවීම් යාවත්කාලීනව සිදුවන තත්ත්වයක් තුළ මෙම වෙන් කිරීම් ශේෂය සාවද්‍ය ගිණුම් ශේෂයක් බව නිරීක්ෂණය විය. මෙම ශේෂය පිළිබඳ පසු විපරම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති